

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2024

දැක්ම...



"ලෝකයේ තිරසාර සංවර්ධනය උදෙසා දේශීය දැනුම පද්ධති නවීන විද්‍යාවන් සමඟ සමපාත කිරීම තුළින් අධ්‍යාපනය, පර්යේෂණ සහ නවෝත්පාදන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වීම."

මෙහෙවර.....



"ලෝකයේ තිරසාර සංවර්ධනය උදෙසා සියලුම පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් බහුවිෂය විමර්ශන සහ නවෝත්පාදනයන් තුළින් නවීන විද්‍යාවන් සමඟ දේශීය දැනුම පද්ධති ගවේෂණය කිරීම, සංරක්ෂණය කිරීම සහ සංවර්ධනය කිරීම."

ඉලක්ක සහ පරමාර්ථ...



1 වැනි ඉලක්කය: දේශීය දැනුම් පද්ධති සහ නවීන විද්‍යා සමපාත කිරීමෙන් ජාත්‍යන්තර පිළිගැනීමක් සහ අධ්‍යාපනයේ විශිෂ්ටත්වයක් අත්කර ගැනීම.

පරමාර්ථ:

1.1 දේශීය දැනුම් පද්ධති සහ නවීන විද්‍යාවන් සමඟ ඒකාබද්ධ වූ අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම.

1.2 ආයතනික ප්‍රමිතීන්වලට අනුකූලව සියලුම අධ්‍යාපනික වැඩසටහන්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම

2 වැනි ඉලක්කය: පර්යේෂණ, නවෝත්පාදනය සහ ප්‍රකාශන තුළින් විශිෂ්ටත්වය අත්කර ගැනීම

පරමාර්ථ:

2.1 ජනකොටියාසවල තිරසාර සංවර්ධනයට මහපාදන නවෝත්පාදන බහුවිෂය පර්යේෂණ පැවැත්වීම

2.2 තිරසාර සංවර්ධනයට මහපාදන නව දැනුම, පර්යේෂණ සොයාගැනීම්, අදහස් සහ සමාලෝචන බෙදාහැරීම

3වැනි ඉලක්කය: තිරසාර භෞතික සම්පත් ලබාදීම හරහා විශිෂ්ටත්වය අත්කර ගැනීම

පරමාර්ථ :

3.1 ඉගැන්වීම, ඉගෙනීම, පර්යේෂණ සහ නවෝත්පාදනවල ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය භෞතික සම්පත් සංවර්ධනය කිරීම.

4 වැනි ඉලක්කය: ඉහළ නිපුණතාවකින් යුත් මානව සම්පත් සැපයීමේ සහ පවත්වාගෙන යාමේ විශිෂ්ටත්වය අත්කර ගැනීම

පරමාර්ථ :

4.1 දක්ෂ සහ ජවසම්පන්න අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැවැත්වා පවත්වා ගැනීම.

5 වැනි ඉලක්කය: ආයතනික සංවර්ධනය සහ යහපාලනය තුළ විශිෂ්ටත්වය අත්කර ගැනීම

පරමාර්ථ :

5.1 යහපාලනය ක්‍රියාත්මක කිරීම, පවත්වා ගැනීම සහ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම

6 වැනි ඉලක්කය : කර්මාන්තය හා සමාජය සමඟ කටයුතු කිරීමේදී විශිෂ්ටත්වය අත්කර ගැනීම

පරමාර්ථ :

6.1 දරිද්‍රතාව අවම කිරීමට වගකිවයුතු පාර්ශ්ව සමඟ ක්‍රියාකාරකම්වල නිරතවීම

6.2 දූෂණය වැළැක්වීම මඟින් පාරිසරික තත්ත්වයන් වැඩිදියුණු කිරීම

6.3 ප්‍රජා සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම

6.4 දේශීය කෘෂිකාර්මික පිළිවෙත් සහ ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම

උපකුලපතිතුමාගේ පණිවුඩය

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව



ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය විශිෂ්ටත්වය, නවීන පර්යේෂණ සහ ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය විද්‍යාව සහ ඒ ආශ්‍රිත විද්‍යාවන්හි උන්නතිය උදෙසා කැපවී සිටින කීර්තිමත් ආයතනයක් වන ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය (GWUIM) පිළිබඳ මෙම සමාලෝචනය මා ඉදිරිපත් කරන්නේ ඉමහත් ආඩම්බරයෙන් සහ කෘතඥතාවෙනි.

ආයුර්වේදය සහ හෙළ වෙදකම (ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික රෝග සුව කිරීමේ ක්‍රමය) තුළ ගැඹුරු මූලයන් ඇති අපගේ විශ්ව විද්‍යාලය, අධ්‍යාපනය, නවෝත්පාදනය සහ ප්‍රජා සහභාගීත්වය හරහා දේශීය වෛද්‍ය විද්‍යාවේ අනාගතය හැඩගැස්වීමේ දී සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගනිමින් සිටී.

ශාස්ත්‍රීය විශිටත්වය වෙනුවෙන් ඇති කැපවීම

විශ්වවිද්‍යාලය සාම්ප්‍රදායික වටිනාකම් ආරක්ෂා කරමින් ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සිය විෂය මාලාව අඛණ්ඩව යාවත්කාලීන කරයි. සිසුන්ට විචාරාත්මක චින්තනය, ඩිජිටල් සාක්ෂරතාවය, නායකත්වය සහ ව්‍යවසායකත්වය වැනි නවීන කුසලතා සමඟ දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පුහුණුව ලබා දෙයි. සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයේ විවිධ භූමිකාවන් සඳහා උපාධිධාරීන් සූදානම් කිරීම පිණිස විවිධ විෂයයන් හරහා කළමනාකරණය සහ සන්නිවේදන කුසලතා ද උගන්වනු ලැබේ.

යටිතලපහසුකම් සහ ඩිජිටල් පරිවර්තනය

නවීන රසායනාගාර, පුස්තකාල සහ සායනික මධ්‍යස්ථාන සඳහා සැලකිය යුතු ආයෝජන සිදු කර ඇත. විශ්ව විද්‍යාලය ඩිජිටල් ඉගෙනුම් මෙවලම්, මාර්ගගත වේදිකා සහ අතථ්‍ය සමාකරණ (virtual simulations) සිය ඉගැන්වීම් පද්ධතියට ඇතුළත් කර ඇත. ප්‍රායෝගික, පරිමාණය කළ හැකි සහ තිරසාර පුහුණුවට සහාය වීම සඳහා දේශීය ද්‍රව්‍ය භාවිතා කරමින් පිරිවැය-ඵලදායී සමාකරණ විද්‍යාගාර සංවර්ධනය කිරීම අද්විතීය මුලපිරීමකි.

ප්‍රජා සහභාගීත්වය සහ කර්මාන්ත සහයෝගය

දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම සහ සෞඛ්‍ය සේවා ලබාදීම පිණිස විශ්වවිද්‍යාලය මඟින් ප්‍රජාව සහ කර්මාන්ත හවුල්කරුවන් සමඟ සක්‍රීයව නිරත වේ. එම ප්‍රධාන මූලාරම්භයන්ට පහත දැක්වේ:

- **සියසුවය**: සිසුන් විසින් මෙහෙයවනු ලබන සෞඛ්‍ය සේවා සහ ප්‍රජා සහභාගීත්වය ඒකාබද්ධ කරන ප්‍රජා සම්බන්ධතා සහ ව්‍යවසායකත්ව වේදිකාවකි.
- **පටක රෝපන විද්‍යාගාරය**: ඖෂධීය ශාක වගා කිරීම සහ අලෙවිකරණය, ජෛව තාක්ෂණය සහ තිරසාර කෘෂිකර්මාන්තය ඒකාබද්ධ කිරීම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙයි.

ස්තුති කිරීම සහ කෘතඥතාව

අප **පීඨයේ, කාර්ය මණ්ඩලයේ, සිසුන්ගේ, ආදි ශිෂ්‍යයන්ගේ** සහ **කර්මාන්ත හවුල්කරුවන්ගේ** නොසැලෙන සහයෝගය සහ කැපවීම තුළින් ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ ප්‍රගතිය අත්කර ගත හැකිය. අපගේ මෙහෙවර ඉදිරියට ගෙන යාම සඳහා ලබා දෙන ඔවුන්ගේ අමිල දායකත්වය වෙනුවෙන් **විශ්ව විද්‍යාල පාලක සභාවට, සෙනෙට් සභාවට** සහ සියලුම පාර්ශ්වකරුවන්ට මගේ හෘදයාංගම කෘතඥතාව පළ කරමි.

සියලුම දෙනා එක්ව, අධ්‍යයන විශිෂ්ටත්වය, නවෝත්පාදනය සහ මනුෂ්‍යත්වයට සේවය කිරීම හරහා දේශීය වෛද්‍ය විද්‍යාව සමෘද්ධිමත් වන අනාගතයක් අපි ගොඩනඟමු.

මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න
උපකුලපති

පටුන

දැක්ම i

මෙහෙවර i

ඉලක්ක සහ පරමාර්ථ ii

උපකුලපතිතුමාගේ පණිවුඩය iii

1. හැඳින්වීම: ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය 1

1.1 නව විශ්වවිද්‍යාලයේ පැවරුම් බලය 2

1.2 විශ්වවිද්‍යාලයේ වැදගත් සන්ධිස්ථාන 3

2. විශ්වවිද්‍යාලයේ සාරධර්ම 4

3. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය 5

4. පාලක සභාවේ සාමාජිකයින් – 2024 6

5. විශ්වවිද්‍යාලයේ නිලධාරීන් - 2024 8

6. පීඨ සහ අධ්‍යයන අංශ 9

7. පීඨ පිරිනමන ප්‍රථම උපාධි වැඩසටහන් 10

8. විශ්වවිද්‍යාලය පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන් 10

9. විශ්වවිද්‍යාලය පිරිනමන බාහිර පාඨමාලා 10

10. ආරම්භ කළ නව පාඨමාලා විස්තර – 2024 11

11. දේශීය ශිෂ්‍යයින්ගේ විස්තර- 2024 12

12. 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍යයින්ගේ විස්තර 13

13. උපාධිධාරී නිමැවුම - 2024 14

14. පශ්චාත් උපාධිධාරී නිමැවුම - 2024 14

15. ශිෂ්‍ය කටයුතු 15

15.1 ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් - 2024 16

15.2 ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව - 2024 16

16. මානව සම්පත් 17

16.1 2024.12.31 දිනට සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 18

17. පර්යේෂණ, නවෝත්පාදන සහ දැනුම බෙදාහැරීම 19

17.1 පර්යේෂණ කවුන්සිලය 20

17.2 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර 22

17.3 ලැබූ සම්මාන පිළිබඳ විස්තර 24

18. වෙනත් ඒකක සහ මධ්‍යස්ථාන 27
18.1 පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි අනුස්මරණ පුස්තකාලය 28
18.2 ශාරීරික අධ්‍යාපන ඒකකය 34
18.3 වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය 40
18.4 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 43
18.5 වෛද්‍ය මධ්‍යස්ථානය 44
18.6 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය 45
18.7 මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය 47
18.8 ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE) 55
18.9 සමාජ සංහිඳියා මාධ්‍යස්ථානය (SRC) 56
18.10 තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA) 58
18.11 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ මධ්‍යස්ථානය (ELTC) 69
18.12 මාධ්‍ය සහ මුද්‍රණ ඒකකය 71
18.13 ගම්පහ වික්‍රමාරච්චි අන්තර්ජාතික මධ්‍යස්ථානය (GWIC) 77
18.14 විශ්වවිද්‍යාල ව්‍යාපාර සබැඳිය (UBL) 79
19. මූල්‍ය කාර්යසාධනය 2024 82
19.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර 83
19.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර 83
19.3 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) 84
19.4 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම) 84
19.5 මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය – 2024 85
19.6 එක් ශිෂ්‍යයෙක් වෙනුවෙන් පිරිවැය 2019 – 2024 (මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් ඇතුළුව) 85
19.7 විගණන කමිටු වාර්තාව 86
20. නිරසාර සංවර්ධන ඉලක්කවලට අනුකූලවීම 2023/2024 88
21. මූල්‍ය ප්‍රකාශන - 2024 100
22. විගණකාධිපති වාර්තාව - 2024 127
23. 2024 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාවට පිළිතුරු 134

කෙටි යෙදුම්

GWUIM	-	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
FIM	-	දේශීය වෛද්‍ය පීඨය
FIHST	-	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය පීඨය
FISSMS	-	දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය
FGS	-	පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය
SDC	-	කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
ICTC	-	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය
CGU	-	වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය
CGEE	-	ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය
SRC	-	සමාජ සංහිඳියා මධ්‍යස්ථානය
CQA	-	තත්ත්ව සහතික මධ්‍යස්ථානය
DR	-	නියෝජ්‍ය ලේඛකාධිකාරී
DB	-	නියෝජ්‍ය මූල්‍යාධිකාරී
SAR	-	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
SAL	-	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති
SAIA	-	ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක
AR	-	සහකාර ලේඛකාධිකාරී
AB	-	සහකාර මූල්‍යාධිකාරී

01 හැඳින්වීම: ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය



විශ්වවිද්‍යාලය කොළඹින් කිලෝ මීටර 30ක් පමණ දුරින් කොළඹ - නුවර මාර්ගයේ යක්කල ප්‍රදේශයේ පිහිටා ඇත. අභාවප්‍රාප්ත වූ ආයුර්වේද චක්‍රවර්ත්‍රී පණ්ඩිත ගේබ්‍රියල් පෙරේරා වික්‍රමාරච්චි ශ්‍රීමතාණන් විසින් 1929 වර්ෂයේ දී ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය ලෙස මෙම ආයතනය ස්ථාපනය කිරීම සමඟ මෙම ආයතනය ආරම්භ කරන ලදී. ඒ සාම්ප්‍රදායක වෛද්‍යවරුන් හට ඔසු ඖෂධ සකස් කිරීම සහ චිකිත්සාව ඇතුළු අෂ්ඨාංග ආයුර්වේදය පිළිබඳ දැනුම සහ නිපුණතා ලබාදීම පිණිස යක්කල පිහිටි තම පෞද්ගලික ඉඩමේ දීය. ඖෂධ නිෂ්පාදන ඒකකයක්, රෝහලක් සහ දුර්ලභ ඖෂධ පැළ එකතුවකින් සැදුම්ලත් ඖෂධ උද්‍යානයක් ආයතනය ආරම්භක අවස්ථාවේ දී ආයතනය සතුවූ අගනි සම්පත් විය. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ නැඟී එන නව ප්‍රවණතා සහ එමඟින් ජාතික සෞඛ්‍ය අංශයට දක්වන අති විශාල දායකත්වය හඳුනා ගනිමින් 1951 වර්ෂයේ දී විද්‍යාලය රාජ්‍ය පිළිගත ආයතනයක් බවට ප්‍රකාශ කරනු ලැබුවේ එකී ආයතනයෙන් පිරිනමන ඩිප්ලෝමාධාරීන්ට රාජ්‍ය අංශයේ ආයුර්වේද රෝහල්වල සේවයට සුදුසුකම් සපුරාලන වෘත්තිකයින් බවට පත් කරමිනි. 1982 වර්ෂයේ දී සම්මත කළ 1982 අංක 30 දරන පාර්ලිමේන්තු පනත මඟින් විද්‍යාලය දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය ලෙස සංස්ථාගත කරන ලදී. වර්ෂ 1995 පෙබරවාරි 23 වැනි දිනැති අංක 859/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් ආයතනය කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කිරීමත් සමඟ එය විශ්වවිද්‍යාල විද්‍යායතනයක තත්ත්වයට උත්ශ්‍රේණිගත කරන ලදී.

2020.07.08 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී "සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ ගම්පහ දිස්ත්‍රික්කය සංවර්ධනය කිරීමට සමගාමීව යක්කල, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කිරීම සඳහා තීරණය කරන ලදින් වර්තමාන විද්‍යායතනය 2021.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" නමින් විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීම සඳහා වූ එකී නියෝගය 2020.10.28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයෙන් නිකුත් කරන ලදී.


නව විශ්වවිද්‍යාලයට පීඨ හතරක් සහ අධ්‍යයන අංශ 13ක් ඇතුළත් වන අතර ප්‍රථම උපාධි වැඩසටහන් 08ක් සහ පශ්චාත් උපාධි පාඨමාලා 09ක් පිරිනමනු ලබයි. විශ්වවිද්‍යාලය 2020 වර්ෂයේ උසස් පෙළ ප්‍රතිඵල මත පදනම්ව ප්‍රථම උපාධි මට්ටම සඳහා ශිෂ්‍යයින් 600ක් පමණ ඇතුළත් කරවා ගැනීමට යෝජනා කරන ලද අතර මෙම ශිෂ්‍ය බඳවා ගැනීම ක්‍රමයෙන් වැඩි කරනු ඇත.

විශ්වවිද්‍යාලය දේශීය වෛද්‍ය පීඨය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය පීඨය, දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ හතරකින් සැදුම්ලත් වේ. මෙම පීඨවලට අධ්‍යයන අංශ 14ක් ඇතුළත් වේ. විශ්වවිද්‍යාලය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය

(BAMS) හැරුණු කොට 2021 වර්ෂයේ දී නව ප්‍රථම උපාධි පාඨමාලා හතක් ආරම්භ කිරීමටත් පසුව ක්‍රමයෙන් ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටම්වලට නව පාඨමාලා හඳුන්වා දීමට අපේක්ෂා කරයි.

විශ්වවිද්‍යාලය දේශීය වෛද්‍ය පීඨය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය පීඨය, දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය යන පීඨ හතරකින් සැදුම්ලත් වේ. මෙම පීඨවලට අධ්‍යයන අංශ 14ක් ඇතුළත් වේ. විශ්වවිද්‍යාලය ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (BAMS) හැරුණු කොට 2021 වර්ෂයේ දී නව ප්‍රථම උපාධි පාඨමාලා හතක් ආරම්භ කිරීමටත් පසුව ක්‍රමයෙන් ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටම්වලට නව පාඨමාලා හඳුන්වා දීමට අපේක්ෂා කරයි.

නිර්මාතෘ පණ්ඩිත ජී පී වික්‍රමාරච්චි ශ්‍රීමතාණන්. ඔහු ඉටු කළ කාර්යභාරයට ඉතා පුළුල් පිළිගැනීමක් හිමි වූ අතර ඔහු ආයුර්වේද වෛද්‍යවරයෙක් සඳහා පිරිනමන ඉහළම ගෞරවය වන ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් පිරිනමන ‘ආයුර්වේද චක්‍රවර්ති රාජ වෛද්‍ය’ යන අභිධානය ප්‍රදානය කළ පළමු වැන්නා විය. (ඡායාරූපය සීමාසහිත ගම්පහ වික්‍රමාරච්චි සිද්ධායුර්වේද ඖෂධ (පුද්ගලික) සමාගමෙන් ලබා ගන්නා ලදී).



1.1 නව විශ්වවිද්‍යාලයේ පැවරුම් බලය

“සෞභාග්‍යයේ දැක්ම” වර්තමාන ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය විශ්වවිද්‍යාලයක තත්ත්වයට උසස් කිරීම ඉහළම ප්‍රමුඛතාව විය. ඒ අනුව, 2020 ජූලි 08 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී විද්‍යායතනය අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීමට තීරණය කරන ලදී. නව විශ්වවිද්‍යාලය 2020 ඔක්තෝබර් මස 28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් 1978 අංක 16

දරන විශ්වවිද්‍යාල පනතේ 21 වැනි වගන්තිය යටතේ 2021 මාර්තු 01 වැනි දින සිට ස්ථාපනය කරනු ලැබූ අතර 2021 පෙබරවාරි මස 28 වැනි දින සිට 1995 පෙබරවාරි මස 23 දිනැති අංක 859/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් අවලංගු කරන ලදී. දේශීය වෛද්‍ය විද්‍යා පිළිබඳ අධ්‍යයන ශාඛාවන් හි උසස් අධ්‍යාපනය ලබාදීම, දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සහ අනාගත ඉල්ලුම සපුරා ලිය හැකි එකී ක්ෂේත්‍රවල මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම නව විශ්වවිද්‍යාලයේ පැවරුම් බලය වේ. විශ්වවිද්‍යාලය සාම්ප්‍රදායක විශ්වවිද්‍යාලයක් ලෙස ක්‍රියාත්මක නොවේ. ඇතැම් උපාධි වැඩසටහන් පැවැත්වීම සහ නේවාසිකාගාර පහසුකම් සලසා ලනු පිණිස පෞද්ගලික රාජ්‍ය හවුල්කාරත්ව (PPP) වැඩසටහන් ඇති කර ගැනීමට විශ්වවිද්‍යාලය සැලසුම් කර ඇත. ශිෂ්‍යයින්ට කථිකාචාර්යවරුන්ගේ සහ කාර්මික විද්වතුන්ගේ අධීක්ෂණය යටතේ ආධුනිකයෙක් වශයෙන් වැඩ කරන අතරතුර ඔහු/ ඇය පන්ති කාමරය තුළ දී අත්කර ගන්නා න්‍යායාත්මක දැනුම සැබෑ ලෝකයට අදාළ කර ගැනීමට අවස්ථාව හිමි වන “ඉගෙනුම අතර වැඩ කිරීම” සංකල්පය ලෙස නව සංකල්පයක් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වා දීමට විශ්වවිද්‍යාලය අපේක්ෂා කරනු ලබයි.

1.2 විශ්වවිද්‍යාලයේ වැදගත් සන්ධිස්ථාන

1929 ආයුර්වේද චක්‍රවර්ති පණ්ඩිත ජී.පී. වික්‍රමාරච්චි ශ්‍රීමතාණන් විසින් 1929.07.19 වැනි දින ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය ආරම්භ කරන ලදී.

1951 ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලයේ ඩිප්ලෝධාරීන්ට රජයේ ආයුර්වේද රෝහල්වල සේවය කළ හැකි පරිදි ආණ්ඩුව මඟින් ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය පිළිගන්නා ලදී.

1982 අංක 30 දරන පර්ලිමේන්තු පනත මඟින් ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය දේශීය වෛද්‍ය විද්‍යා අමාත්‍යාංශය යටතට ගන්නා ලදී.

1995 1995 පෙරවාරි 23 දිනැති අංක 859/12 මඟින් 1995.03.01 දින සිට බලාත්මක වන පරිදි විද්‍යාලය “ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය” කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදී.

1998 ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි වැඩසටහනේ (BAMS) 1වැනි ශිෂ්‍ය කණ්ඩායම ඇතුළත් කර ගන්නා ලදී (BAMS).

2002 පශ්චාත් උපාධි වැඩසටහන් ආරම්භ කරන ලදී.

2018 ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධි වැඩසටහන (BAMS) ඉන්දියානු වෛද්‍ය මධ්‍යම කවුන්සිලය (CCIM) මඟින් අනුමත කරන ලදී.

2021 2020 ඔක්තෝබර් 28 දිනැති අංක 2199/12 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් 2021.03.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යායතනය “ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය” ලෙස උසස් කිරීම.

2 විශ්වවිද්‍යාලයේ සාරධර්ම

විශ්වවිද්‍යාලයේ සාරධර්ම සංවිධානය විශ්වාස කරනු ලබන්නේ කුමක් ද, සංවිධානය තුළ සිටින තැනැත්තන් එකිනෙකා සමඟ, ගනුදෙනුකරුවන් සමඟ සහ සැපයුම්කරුවන් සමඟ සහ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්ව සමඟ කටයුතු කිරීමට අපේක්ෂා කරන්නේ කෙසේ ද යන්න අර්ථදක්වයි.

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සාරධර්ම හතර පහත අර්ථදක්වා ඇත.

1. **අවංකභාවය (Integrity)**

   අපට අවංකභාවය සහ විශ්වාසනීයත්වය හරහා උනන්දුවක් දක්වන පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය දිනා ගත හැකි බවට අපි විශ්වාස කරන්නෙමු

2. **අභිප්‍රේරණය (Motivation)**

   අපි අභිප්‍රේරණය හරහා විශිෂ්ටත්වය කරා ගමන් කරන්නෙමු

3. **නවෝත්පාදනය (Innovation)**


   අපි නව මංපෙත් විවර කර ගැනීම සඳහා නවෝත්පාදනය සහ නිර්මාණශීලීත්වය හරහා නව දැනුම උත්පාදනය කරන්නෙමු

4. **ගරු කිරීම (Respect)**

   අපි කණ්ඩායම් වැඩ සහ එකිනෙකා සඳහා ගෞරවය ඇති කරවන සාමූහික පරිසරයක් තුළින් සාරධර්ම අත්කර ගන්නෙමු



3 ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය



4 පාලක සභාවේ සාමාජිකයින් – 2024

උපකුලපතිතුමා

i. මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න මහතා (වැඩබලන) - 01.10.2021 – 06.06.2022
මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න මහතා - 07.06.2022 – මේ දක්වා

පීඨාධිපතිවරු

i. පීඨාධිපති - දේශීය වෛද්‍ය විද්‍යා පීඨය
වෛද්‍ය ඩබ්ලිව්. ජේ. වික්‍රමාරච්චි - 23.12.2021 – 22.12.2024
මහාචාර්ය කේ. පී. පී. පීරිස් - 23.12.2024 – මේ දක්වා

ii. පීඨාධිපති - දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය
වෛද්‍ය වයි. එච්. පී. එස්. එස්. පතිරත්න - 12.05.2023 – 10.10.2024
වෛද්‍ය එම්. ඩී. ජේ. එන්. විජේසිංහ - 11.10.2024 - මේ දක්වා

iii. පීඨාධිපති - දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය
වෛද්‍ය ජී. කේ. ජයතිලක - 01.10.2021 – 30.09.2024
වෛද්‍ය ජී. කේ. ජයතිලක - 01.10.2024 - මේ දක්වා

iv. පීඨාධිපති - පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය
මහාචාර්ය ඩබ්ලිව්. ඒ. එල්. චන්ද්‍රසිරි වැලිවිට - 01.03.2021 – 28.02.2024
මහාචාර්ය ඩබ්ලිව්. ඒ. එල්. චන්ද්‍රසිරි වැලිවිට - 01.03.2024 – මේ දක්වා

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත් කළ සාමාජිකයන් (01.03.2021 – 28.02.2024)

i. සම්මානනීය මහාචාර්ය හරිස්චන්ද්‍ර අබේගුණවර්ධන
ii. වෛද්‍ය එච්. ධර්මවිජය
iii. සිරිමල් සේනාරත්න මහතා
iv. වෛද්‍ය පී. ඩබ්ලිව්. ඩබ්ලිව්. දිසානායක
v. ප්‍රශාන්ත ලාල් ද අල්විස් මහතා, ජනාධිපති නීතිඥ
vi. සුනිල් ජයලත් මහතා
vii. ගීතා කරදවල මහත්මිය
viii. වෛද්‍ය අනුෂා ඩියැන් වික්‍රමාරච්චි

සෙනෙට් සභා නාමික නිලධරයන්

i. වෛද්‍ය ටී. එච්. එන්. ආර්. ටී. හේවගේ
ii. පූජ්‍ය ආචාර්ය මාදුරුඔයේ ධම්මමිස්සර හිමි

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පත් කළ සාමාජිකයන් (01.03.2024 – to date)

i. සම්මානනීය මහාචාර්ය හරිස්චන්ද්‍ර අබේගුණවර්ධන

ii. සම්මානනීය මහාචාර්ය ඊ. ආර්. කල්‍යාණි පෙරේරා

iii. වෛද්‍ය එච්. ධර්මවිජය

iv. කේ. ජී. බ්‍රිටෝ මහතා

v. ප්‍රශාන්ත ලාල් ද අල්විස් මහතා, ජනාධිපති නීතිඥ

vi. සුනිල් ජයලත් මහතා

vii. අතුල රණවීර මහතා

viii. වෛද්‍ය අනුෂා ඩියැන් වික්‍රමාරච්චි

සෙනෙට් සභා නාමික නිලධරයන්

i. වෛද්‍ය ටී. එච්. එන්. ආර්. ටී. හේවගේ (24.09.2021 - 14.03.2024)

ii. පූජ්‍ය ආචාර්ය මාදුරුඔයේ ධම්මමිස්සර හිමි (25.05.2023 - 12.09.2024)



iii. වෛද්‍ය ඩබ්ලිව්. පී. ආර්. ටී. පෙරේරා - 26.09.2024 – මේ දක්වා

iv. ආර්. එම්. එස්. පී. රාජපක්ෂ මහතා - 26.09.2024 – මේ දක්වා

ලේඛකාධිකාරී (ලේකම්)

බී. ඒ. එන්. ක්‍රිශාන්ත මහතා

5 විශ්වවිද්‍යාලයේ නිලධාරීන් - 2024

කුලපති	**මල්වතු පාර්ශ්වයේ අති පූජ්‍ය සාහිත්‍ය චක්‍රවර්ති, ආචාර්ය නියන්ගොඩ ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ඛිත විජිතසිරි අනුනායක ස්වාමීන් වහන්සේ**	
උපකුලපති	මහාචාර්ය රංජන වික්‍රම සෙනෙවිරත්න	
පීඨාධිපති, දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	මහාචාර්ය කේ. පී. පී. පිරිස්	
පීඨාධිපති, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	ආචාර්ය එම්. ඩී. ජේ. එන්. විජේසිංහ	
පීඨාධිපති, සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	ආචාර්ය ජී.කේ.ජයතිලක	
පීඨාධිපති, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය	මහාචාර්ය ඩබ්ලිව්.ඒ.එල්.සී.වැලිවිට	
ලේඛකාධිකාරී	බී.ඒ.එන්.ක්‍රිශාන්ත මහතා	
පුස්තකාලයාධිපති (රාජකාරී ඉටු කරනු ලබන)	ආචාර්ය ආර්. ඩී. ඒ. තිස්ස	
මූල්‍යාධිකාරී	සී.ජී.කොතලාවල මහතා	

6 පීඨ සහ අධ්‍යයන අංශ

දේශීය වෛද්‍ය විද්‍යා පීඨය

- ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය
- චිකිත්සා අධ්‍යයන අංශය
- ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය
- ශල්‍යශාලක්‍ය අධ්‍යයන අංශය
- කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය
- භාෂා අධ්‍යයන අංශය
- දේශීය චිකිත්සා අධ්‍යයන අංශය
- රෝග විඥාන අධ්‍යයන අංශය

දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය

- දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශ
- දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය
- තාක්ෂණ අධ්‍යයන අංශය

දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය

- දේශීය සාමාජීය විද්‍යා අධ්‍යයන අංශය
- කළමනාකරණ අධ්‍යයන අංශය
- තොරතුරු තාක්ෂණ අධ්‍යයන අංශය

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය



7 පීඨ පිරිනමන ප්‍රථම උපාධි වැඩසටහන්

පීඨය	උපාධි වැඩසටහන
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	ජෛව-වෛද්‍ය තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යා ගෞරව උපාධිය
	සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය
	දේශීය ඖෂධ තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය
	දේශීය වෛද්‍ය සම්පත් පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
	යෝග සහ පරාමනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
	සෞඛ්‍ය සංචාරක කර්මාන්තය සහ සත්කාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය
දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	දේශීය දැනුම පිළිබඳ සාමාජීය අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

8 විශ්වවිද්‍යාලය පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන්

පීඨය	පශ්චාත් උපාධිය/ඩිප්ලෝමාව
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය	ශල්‍යතන්ත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	කායචිකිත්සාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	පංචකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	ආයුර්වේද ආයතන කළමනාකරණ සහ පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	ආයුර්වේද ආයතන කළමනාකරණ සහ පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය
	කායචිකිත්සාව පිළිබඳ විද්‍යාපති උපාධිය
	පංචකර්ම පිළිබඳ විද්‍යාපති උපාධිය
	ශල්‍යතන්ත්‍ර පිළිබඳ විද්‍යාපති උපාධිය

9 විශ්වවිද්‍යාලය පිරිනමන බාහිර පාඨමාලා

පීඨය/ඒකකය/මධ්‍යස්ථානය	පාඨමාලා
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	ආරක්ෂිත කෘෂිකර්මය පිළිබඳ සහතිකපත්‍රය
	ජෛව-වෛද්‍ය තාක්ෂණය උපකරණ පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව
	උසස් විශ්ලේෂණ සහ අණුක ජෛවවිද්‍යා උපකරණ පිළිබඳ ඩිප්ලෝමාව
	සෞඛ්‍ය සංචාරක කර්මාන්තය සඳහා සම්බාහන මධ්‍යස්ථාන කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව
	උසස් විශ්ලේෂණ සහ අණුක ජෛවවිද්‍යා උපකරණ පිළිබඳ ඩිප්ලෝමාව

10 ආරම්භ කළ නව පාඨමාලා විස්තර – 2024

පීඨය (FIHST)	පාඨමාලාව	මාධ්‍යය	සහතිකය/ ඩිප්ලෝමාව	උපාධිය	පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ශාස්ත්‍රපති	දර්ශනපති	ආචාර්ය උපාධිය
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය	ආරක්ෂිත කෘෂිකර්මය පිළිබඳ සහතිකපත්‍රය	සිංහල	සහතිකපත්‍ර	-	-	-	-	-
දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන	සේවා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	-	උපාධිය	-	-	-	-



11 දේශීය ශිෂ්‍යයින්ගේ විස්තර - 2024

පීඨයේ නම	උපාධි වැඩසටහන	මාධ්‍යය	2024 යෝජිත බඳවාගැනීම	ශිෂ්‍යයින්						
				1 වැනි වසර (2022/ 2023)	2 වැනි වසර (2021/ 2022)	3 වැනි වසර (2020/ 2021)	4 වැනි වසර (2019/ 2020)	5 වැනි වසර (2018/ 2019)	6 වැනි වසර (2017/ 2018)	7 වැනි වසර (2016/ 2017)
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය	ඉංග්‍රීසි	176	109	77	87	114	95	88	103
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	ජෛවවෛද්‍ය තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	70	67	52	60	-	-	-	-
	සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	70	65	50	44	-	-	-	-
	යෝග සහ පරාමනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	70	56	55	62	-	-	-	-
	සෞඛ්‍ය සංචාරක කර්මාන්තය සහ සත්කාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	70	66	43	44	-	-	-	-
	දේශීය ඖෂධ තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	70	58	44	51	-	-	-	-
	දේශීය වෛද්‍ය සම්පත් පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	70	24	21	22	-	-	-	-
දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	දේශීය දැනුම පිළිබඳ සාමාජීය අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	ඉංග්‍රීසි	70	63	41	63		-	-	-

12 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍යයින්ගේ විස්තර

පීඨයේ නම	අධ්‍යයන අංශය	අධ්‍යයන වැඩසටහන	පුරුෂ	කාන්තා	ලියාපදිංචි මුළු සංඛ්‍යාව
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	1. ආයුර්වේද මූලධර්ම 2. ද්‍රව්‍යගුණ විඥාන 3. කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග 4. චිකිත්සා 5. ශල්‍යශාලක්‍ය 6. රෝග විඥාන 7. දේශීය චිකිත්සා 8. භාෂා	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය	19	90	109
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	තාක්ෂණය	ජෛවවෛද්‍ය තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය	25	42	67
		සෞඛ්‍ය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය	42	23	65
	දේශීය සෞඛ්‍ය විද්‍යා	යෝග සහ පරාමනෝවිද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	7	49	56
		සෞඛ්‍ය සංචාරක කර්මාන්තය සහ සත්කාර කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	13	53	66
	දේශීය වෛද්‍ය සම්පත්	දේශීය ඖෂධ තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යාවේදී ගෞරව උපාධිය	28	30	58
		දේශීය වෛද්‍ය සම්පත් පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	3	21	24
දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	දේශීය සාමාජීය විද්‍යා	දේශීය දැනුම පිළිබඳ සාමාජීය අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය	3	60	63

13 උපාධිධාරී නිමැවුම - 2024

පීඨයේ නම	උපාධි වැඩසටහන	උපාධිය ලබා ගත් ශිෂ්‍යයින් සංඛ්‍යාව
දේශීය වෛද්‍ය පීඨය	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (2019/2020)	49
	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (2019/2020 අතිරේක) (V මට්ටම I අධ්‍යයන වාරය)	14
	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (2015/2016 අතිරේක) (V මට්ටම II අධ්‍යයන වාරය)	02
	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (2020/2021)	02
එකතුව		**67**


14 පශ්චාත් උපාධිධාරී නිමැවුම - 2024

පීඨයේ නම	උපාධිය ලබා ගත් ශිෂ්‍යයින් සංඛ්‍යාව	උපාධිය ලබා ගත් ශිෂ්‍යයින් සංඛ්‍යාව
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය	කායචිකිත්සා පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව (2014/2015)	01
	කායචිකිත්සා පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව (2017/2018)	02
	පංචකර්ම පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව (2015/2016)	01
	පංචකර්මය පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව (2017/2018)	06
	ශල්‍යතන්ත්‍ර පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමාව (2022/2023)	21
	එකතුව	**31**

15. ශිෂ්‍ය කටයුතු

15.1 ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් - 2024

15.2 ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව - 2024





15 ශිෂ්‍ය කටයුතු

15.1 ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් - 2024

නේවාසිකාගාරයේ නම	භිමිකාරත්වය	ධාරිතාව		පහසුකම් සැලසූ සංඛ්‍යාව (2024 දෙසැම්බර් 31 වැනි දිනට)	
		පිරිමි	කාන්තා	පිරිමි	කාන්තා
වික්‍රමාරච්චි නේවාසිකාගාරය	විශ්වවිද්‍යාලය	-	156	-	156
සෙනෙවිරත්න නේවාසිකාගාරය	පෞද්ගලික	33	-	33	-
සමගි මාවත නේවාසිකාගාරය	පෞද්ගලික	34	-	33	-
පරාක්‍රම නේවාසිකාගාරය	පෞද්ගලික	-	54	-	42
මහවිට නේවාසිකාගාරය	පෞද්ගලික	18	-	05	-
කරුණානායක නේවාසිකාගාරය	පෞද්ගලික	-	45	-	42
තිස්ස නේවාසිකාගාරය	පෞද්ගලික	40	-	40	-
නදීෂා නේවාසිකාගාරය	පෞද්ගලික	-	50	-	50
සමාරා නේවාසිකාගාරය	පෞද්ගලික	-	52	-	45
නිශ්ශංක නේවාසිකාගාරය	පෞද්ගලික	06	34	03	29
	එකතුව	**131**	**391**	**114**	**364**

15.2 ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව - 2024

පීඨ	මහපොළ	ශිෂ්‍යාධාර
දේශීය වෛද්‍ය පීඨය	194	158
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	372	271
දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	76	58
එකතුව	**642**	**487**

16. මානව සම්පත්

16.1 2024.12.31 දිනට සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර





16 මානව සම්පත්

16.1 2024.12.31 දිනට සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, විධායක කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

සේවා කාණ්ඩය	වැටුප් කේතය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ප්‍රාථමික මට්ටම				
ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු	PL - 1	50	19	29
ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු	PL - 2 *	09	04	02
ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු	PL - 3	17	19	03
ද්විතීය මට්ටම				
කළමනාකරණ සහකාර – ශිල්පීය නොවන	U-MN 1	69	38	09
කළමනාකරණ සහකාර - ශිල්පීය	U-MT 1	20	07	05
ආශ්‍රිත නිලධාරීන් - 2වැනි කාණ්ඩය	U-MN 2	02	02	00
ආශ්‍රිත නිලධාරීන් - 1වැනි කාණ්ඩය	U-MN 3	02	02	00
කාර්ය මණ්ඩලය සහායක/අධිපන්ති සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහායක	U-MN 4		28**	
තෘතීය මට්ටම				
ශාස්ත්‍රීය සහායක - 2වැනි කාණ්ඩය	U-AS 1	01	01	00
කණිෂ්ඨ විධායක / කළමනාකරුවන්	U-EX 1	12	07***	07
ශාස්ත්‍රීය සහායක - 1වැනි කාණ්ඩය	U-AS 2	05	02	03
ජ්‍යෙෂ්ඨ මට්ටම				
වෛද්‍ය නිලධාරී	U-MO 1	02	00	02
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	U-MO 2			
මැදි පෙළ විධායක නිලධාරීන්	U-EX 2	03	03	00
මැදි පෙළ විධායක නිලධාරීන්	U-EX 2(a)	03	03	00
ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්	U-EX 3	02	02	00
කථිකාචාර්ය	U-AC 3	86	79	07
ආශ්‍රිත මහාචාර්යවරු	U-AC 4			
මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U-AC 5			
	එකතුව	**283**	**216**	**67**

* මෙම ආකෘතිය තුළ UPL 2 හි විද්‍යාගාර සහායක තනතුරුවල සේවක සංඛ්‍යා කිහිපයක් UPL 3 කාණ්ඩයේ ඇතුළත් කර ඇත්තේ UGC කොමිෂන් සභා චක්‍රලේඛ අංක 975 (අදාළ තැනැත්තාට පුද්ගලික වන පදනම) අනුව වේ.

** තව ද කළමනාකරණ සහකාර/ තාක්ෂණික නිලධාරී තනතුරුවල අනුමත සේවක සංඛ්‍යාව UMN 1/ UMT 1 කාණ්ඩයෙහි හි දක්වා තිබුන ද දැකට සිටින සේවක සංඛ්‍යාව ඇතුළත් කර ඇත්තේ UMN 4 කාණ්ඩය තුළ වේ.

*** ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල තාක්ෂණික නිලධාරී තනතුර සඳහා කුසලතා රැකියා උසස් කිරීම අනුව තාක්ෂණික නිලධාරීන් දෙදෙනෙක් (U-MT 1) තෘතීය මට්ටම් කාණ්ඩයේ (U-EX 1) ඇතුළත් කර ඇත.

17. පර්යේෂණ, නවෝත්පාදන සහ දැනුම බෙදාහැරීම

17.1 පර්යේෂණ කවුන්සිලය
17.2 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර
17.3 ලැබූ සම්මාන පිළිබඳ විස්තර





17 පර්යේෂණ, නවෝත්පාදන සහ දැනුම බෙදාහැරීම

17.1 පර්යේෂණ කවුන්සිලය

ඉලක්කය

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය පර්යේෂණවල විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම පිණිස 2021 වසරේ ජූලි මාසයේ දී පර්යේෂණ කවුන්සිලය ස්ථාපිත කරන ලදී. කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ වෘත්තීය ජීවිතයේ විවිධ අදියරවල දී ඔවුන් දිරිමත් කිරීම සහ පර්යේෂණ සොයා ගැනීම් ජාතික සහ ගෝලීය වශයෙන් බෙදාහැරීම පර්යේෂණ කවුන්සිලයේ ක්‍රියාකාරකම්වල ඉලක්කය වේ.

දැක්ම

දේශීය සම්පත් පදනම සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා විශ්ෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් වීම.

මෙහෙවර

දැනුම වැඩිදියුණු කිරීම සහ දේශීය සම්පත් හරහා මනුශ්‍ය සංහතියේ සුභසිද්ධිය පිණිස ජාතික සංවර්ධනය සඳහා කැපීපෙනෙන දායකත්වයක් දැක්වීම සඳහා පර්යේෂණ අංශය තුළින් විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම.

පර්යේෂණ කවුන්සිලයේ සංයුතිය

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ උපකුලපති පර්යේෂණ කවුන්සිලයේ විධායක සභාපති වේ.

පර්යේෂණ කවුන්සිලය පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත වේ:

අ) අධ්‍යක්ෂ - පර්යේෂණ කවුන්සිලය
ආ) සියලුම පීඨවල පීඨාධිපතිවරු
ඇ) පීඨ පර්යේෂණ සම්බන්ධීකාරකවරු
ඈ) ලේඛකාධිකාරී
ඉ) පුස්තකාලයාධිපති
ඊ) මූල්‍යාධිකාරී
උ) විශ්වවිද්‍යාල පාලක සභාව නම් කළ එක් නිලධරයෙක්
ඌ) සනාතන සභාව නම් කළ එක් නිලධරයෙක්
එ) උපකුලපති නම් කළ නිලධාරීන් තිදෙනෙක්
ඒ) විශ්වවිද්‍යාල වෙබ්මාස්ටර්
ඔ) ආචාරධර්ම සමාලෝචන කමිටුවේ නියෝජිතයෙක්

පර්යේෂණ කවුන්සිලයේ අධ්‍යක්ෂ සහ ලේකම් උපකුලපති විසින් පත් කරනු ලබයි.

වැඩමුළු සහ වෙබිනාර් සම්මන්ත්‍රණ

වැඩමුළු

වැඩමුළුවේ නම	සම්පත්දායක	දිනය/වේලාව/ ස්ථානය	සහභාගිවූවන්	සහභාගිවුවන්	වියදම්
ප්‍රකාශන ප්‍රවීණතාව	මහාචාර්ය රේණුක එන්. රත්නායක කැළණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය	2024 ඔක්තෝබර් 11 වැනි දින පෙ.ව. 09.30 සිට පෙ.ව. 11.30 විශ්වවිද්‍යාලයේ කුඩා ශ්‍රවණාගාරය	විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්	විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය සහ පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින්	රු. 6,320.00









<u>රිසර්චිගේට් සහ ගූගල් විද්වත් උපුටා ගැනීමේ ගිණුම් - 2024</u>

2024.12.31 වැනි දිනට එක් එක් පීඨයේ රිසර්චිගේට් සහ ගූගල් විද්වත් උපුටාගැනීම් ගිණුම් පිළිබඳ සාරාංශ විස්තර පහත දැක්වේ.

පීඨය	2024.12.31 වැනි දිනයට
දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	
ගූගල් විද්වත් උපුටා ගැනීමේ පැතිකඩ	32 (94%)
රිසර්චිගේට් ගිණුම්	31 (91%)
දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	
ගූගල් විද්වත් උපුටා ගැනීමේ පැතිකඩ	29 (100%)
රිසර්චිගේට් ගිණුම්	29 (100%)
දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	
ගූගල් විද්වත් උපුටා ගැනීමේ පැතිකඩ	09 (100%)
රිසර්චිගේට් ගිණුම්	09 (100%)

17.2 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

දේශීය වෛද්‍ය විද්‍යා පීඨය

	ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
			දේශීයව ප්‍රකාශ කළ	දේශීයව ප්‍රකාශ කළ
1	විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සූචිගත වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව		-	23
2	විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සූචිගත නොකළ වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව		-	07
3	සම්මන්ත්‍රණ කාර්යසටහන්	3.1 සම්පූර්ණ ලිපි ලෙස ප්‍රකාශ කළ ලිපි සංඛ්‍යාව	-	11
		3.2 උදෘත ප්‍රකාශන සංඛ්‍යාව	21	83
4	ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශන සංඛ්‍යාව		-	-
5	විශේෂඥ ක්ෂේත්‍රවල ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ/ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	5.1 ප්‍රකාශකයෙක් මඟින්	02	-
		5.2 කර්තෘ මඟින්	-	-

දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය

	ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
			දේශීයව ප්‍රකාශ කළ	දේශීයව ප්‍රකාශ කළ
1	විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සූචිගත වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව		-	11
2	විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සූචිගත නොකළ වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව		02	05
3	සම්මන්ත්‍රණ කාර්යසටහන්	3.1 සම්පූර්ණ ලිපි ලෙස ප්‍රකාශ කළ ලිපි සංඛ්‍යාව	06	07
		3.2 උදෘත ප්‍රකාශන සංඛ්‍යාව	73	32
4	ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශන සංඛ්‍යාව		02	07
5	විශේෂඥ ක්ෂේත්‍රවල ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ/ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	5.1 ප්‍රකාශකයෙක් මඟින්	-	-
		5.2 කර්තෘ මඟින්	-	-

දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය

	ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
			දේශීයව ප්‍රකාශ කළ	දේශීයව ප්‍රකාශ කළ
1	විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සුවිගත වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව		-	02
2	විද්‍යුත්-වාරසඟරා ඇතුළු යොමු කළ සුවිගත නොකළ වාරසඟරාවල ප්‍රකාශන සංඛ්‍යාව		-	-
3	සම්මන්ත්‍රණ කාර්යසටහන්	3.1 සම්පූර්ණ ලිපි ලෙස ප්‍රකාශ කළ ලිපි සංඛ්‍යාව	-	03
		3.2 උදෘත ප්‍රකාශන සංඛ්‍යාව	-	14
4	ග්‍රන්ථ පරිච්ඡේද ප්‍රකාශන සංඛ්‍යාව		-	01
5	විශේෂඥ ක්ෂේත්‍රවල ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථ/ පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	5.1 ප්‍රකාශකයෙක් මඟින්	-	-
		5.2 කර්තෘ මඟින්	-	-



17.3 ලැබූ සම්මාන පිළිබඳ විස්තර

සෙනට් සභා ගෞරව සම්මාන – (2023.05.04 දින ප්‍රදානය කළ)

සම්මානලාභීන්ගේ නම	පීඨය	සම්මානයේ විස්තරය	ප්‍රදානය කළ දිනය
වෛද්‍ය ඩබ්ලිව්. පී. ආර්.ටී. පෙරේරා	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	2023 වර්ෂය තුළ දී ඉහළ ගුණාත්මක පර්යේෂණ සිදු කිරීම සහ අන්තර්ජාතික සුවිගත වාරසඟරාවක් වන Chemistry & Chemical Technologyහි ප්‍රකාශයට පත් කිරීම සඳහා වෙළුම 17, නිකුතුව 04, පිටු 903 - 915 DOI:10.23939/chcht17.04.903	22.02.2024
වෛද්‍ය ඩබ්ලිව්. පී. ආර්.ටී. පෙරේරා	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	2023 වර්ෂය තුළ දී ඉහළ ගුණාත්මක පර්යේෂණ සිදු කිරීම සහ අන්තර්ජාතික සුවිගත වාරසඟරාවක් වන Chemistry & Composites Theory and Practice හි ප්‍රකාශයට පත් කිරීම සඳහා වෙළුම 23, නිකුතුව 04, පිටු. 209-219 DOI:10.62753/ctp.2023.05.4.4	29.08.2024
වෛද්‍ය පී. ඒ. ඩී. එච්. ජේ. ගුණතිලක	දේශීය වෛද්‍ය විද්‍යා පීඨය	2024 වර්ෂය තුළ දී ඉහළ ගුණාත්මක පර්යේෂණ සිදු කිරීම සහ අන්තර්ජාතික සුවිගත වාරසඟරාවක් වන Informatics හි ප්‍රකාශයට පත් කිරීම සඳහා වෙළුම 11, නිකුතුව 03, ලිපි අංකය 51 DOI:10.3390/informatics11030051	29.08.2024
එල්. ඒ. පී. සී. පෙරේරා මිය	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	2022 වර්ෂය තුළ දී ඉහළ ගුණාත්මක පර්යේෂණ සිදු කිරීම සහ අන්තර්ජාතික සුවිගත වාරසඟරාවක් වන International Journal of Tourism Anthropology හි ප්‍රකාශයට පත් කිරීම සඳහා වෙළුම 09, නිකුතුව 01, පිටු 52-75 DOI: 10.1504/IJTA.2022.128055	26.09.2024
එස්. ඒ. ඩී. පී. එස්. සුරවීර මිය	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	2024 වර්ෂය තුළ දී ඉහළ ගුණාත්මක පර්යේෂණ සිදු කිරීම සහ අන්තර්ජාතික සුවිගත වාරසඟරාවක් වන Journal of Zoological and Botanical Gardens හි ප්‍රකාශයට පත් කිරීම සඳහා වෙළුම 05, නිකුතුව 02, පිටු 187-199 DOI: 10.3390/jzbg5020013	26.09.2024
ඕ. ආර්. ඩී. කේ. පෙරේරා මහතා	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය	2024 වර්ෂය තුළ දී ඉහළ ගුණාත්මක පර්යේෂණ සිදු කිරීම සහ අන්තර්ජාතික සුවිගත වාරසඟරාවක් වන Contemporary Buddhism හි ප්‍රකාශයට පත් කිරීම සඳහා වෙළුම 24, නිකුතුව 1-2, පිටු 56-69 DOI: 10.1080/14639947.2024.2342346	27.11.2024

ලැබූ වෙනත් සම්මාන පිළිබඳ විස්තර

නම	පීඨය	සම්මානයේ නම	සම්මානය පිළිබඳ විස්තරය	ප්‍රදානය කළ රට
එම්. එම්. එෆ්. අස්නා මිය *(ශිෂ්‍ය)*	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය	අන්තර්ජාතික ශිෂ්‍යයින් සඳහා වූ අන්තර්ජාතික ශිෂ්‍යත්වය (පැමිණෙන ශිෂ්‍යයින්) වැඩසටහන	තායිලන්තයේ මැයි ෆාහ් ලුන්ග් විශ්වවිද්‍යාලයේ විද්‍යා විද්‍යාලය මඟින් පිරිනමන ජෛවවිද්‍යාව/ ව්‍යවහාරික රසායන විද්‍යාව ක්ෂේත්‍රවල මාස හතරක පර්යේෂණ සීමාවාසික පුහුණුව	**තායිලන්තය**
ඩී. ආර්. පී. ආර්. බණ්ඩාර මිය *(ශිෂ්‍ය)*	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය	අන්තර්ජාතික ශිෂ්‍යයින් සඳහා වූ අන්තර්ජාතික ශිෂ්‍යත්වය (පැමිණෙන ශිෂ්‍යයින්) වැඩසටහන	තායිලන්තයේ මැයි ෆාහ් ලුන්ග් විශ්වවිද්‍යාලයේ විද්‍යා විද්‍යාලය මඟින් පිරිනමන ජෛවවිද්‍යාව/ ව්‍යවහාරික රසායන විද්‍යාව ක්ෂේත්‍රවල මාස හතරක පර්යේෂණ සීමාවාසික පුහුණුව	**තායිලන්තය**
පී. ඒ. එස්. පීරිස් මිය *(ශිෂ්‍ය)*	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය	අන්තර්ජාතික ශිෂ්‍යයින් සඳහා වූ අන්තර්ජාතික ශිෂ්‍යත්වය (පැමිණෙන ශිෂ්‍යයින්) වැඩසටහන	තායිලන්තයේ මැයි ෆාහ් ලුන්ග් විශ්වවිද්‍යාලයේ විද්‍යා විද්‍යාලය මඟින් පිරිනමන ජෛවවිද්‍යාව/ ව්‍යවහාරික රසායන විද්‍යාව ක්ෂේත්‍රවල මාස හතරක පර්යේෂණ සීමාවාසික පුහුණුව	**තායිලන්තය**
කේ. එම්. විරාජ් මධුසංඛ විජේරත්න	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය	විෂය නිර්දේශ යෝග රන් පදක්කම දිනා ගන්නා ලදී.	ආසියානු යෝග සම්මේලනය මඟින් සංවිධානය කළ 1වැනි ආසියානු යෝග ශූරතාව 2024 හි දී අන්තර්ජාතික යෝග ශූරතාව 2024	ශ්‍රී ලංකාව
ශිල්මියා සිවෙත්‍රියන්, කරුණානායකම් තිසොපා, සෙල්වකුමාර් එලවෙනි, වයි. එම්. මල්ෂා ශ්‍යාමලි දිසානායක, අයි. ඩී. තිලිනි මදුෂිකා ගුණරත්න, බී. පී. ඉරේෂා ගංගානි පුෂ්පකුමාරි, පී. ජී. ශෂිකනි අනුත්තරා පෙරේරා, සවුන්දරාජා හරිහරන් සහ එච්. අයි. එච්. අබේසිංහ *(ශිෂ්‍ය)*	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය	විෂය නිර්දේශ යෝග ලෝකඩ පදක්කම් දිනා ගන්නා ලදී.	ආසියානු යෝග සම්මේලනය මඟින් සංවිධානය කළ 1වැනි ආසියානු යෝග ශූරතාව 2024 හි දී අන්තර්ජාතික යෝග ශූරතාව 2024	ශ්‍රී ලංකාව
වයි. එම්. මල්ෂා ශ්‍යාමලී දිසානායක සහ අයි. ඩී. තිලිනි මදුශිකා ගුණරත්න *(ශිෂ්‍ය)*	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය	රිද්මයානුකූල යෝග රන් පදක්කම් දිනා ගන්නා ලදී.	ආසියානු යෝග සම්මේලනය මඟින් සංවිධානය කළ 1වැනි ආසියානු යෝග ශූරතාව 2024 හි දී අන්තර්ජාතික යෝග ශූරතාව 2024	ශ්‍රී ලංකාව

පෙසුරසා ෂනුජන් *(ශිෂ්‍ය)*	දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	UGRAD ශිෂ්‍යත්වය	ප්‍රථම උපාධි අපේක්ෂකයින්ට එක් අධ්‍යයන වාරයක් ඇමෙරිකා එක්සත් ජනපදයේ අධ්‍යාපනය ලැබීම සඳහා රන් ශිෂ්‍යත්වයක්. ශිෂ්‍යයාට ඇ.එ.ජ. බටහිර වර්ජිනියා හි බිලූෆීල්ඩ් රාජ්‍ය විශ්වවිද්‍යාලයට ඇතුළත්වීමට හැකිවිය.	ඇ.එ.ජ.
අයි. ඩී. විජේසිංහ *(ශිෂ්‍ය)*	දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	ඉහළම විනයක් ඇති කඳවුරු සම්මානය	ලියෝ තරුණ කඳවුර 2023-2024, කුඩා ඔය පිහිටි කොමාන්ඩෝ පුහුණු පාසැලේ ලියෝ දිස්ත්‍රික්ක 306 A2. ශිෂ්‍යයා විසින් මූලික කොමාන්ඩෝ තෝරා ගැනීමේ පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන ලදී.	ශ්‍රී ලංකාව
පීඨයේ ලියෝ ක්ලබ්	දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	වසරේ විශිෂ්ටතම කැපීපෙනෙන නව ලියෝ සමාජ සම්මානය	පීඨයේ ලියෝ සමාජය 2024 වර්ෂයේ විශිෂ්ටතම කැපීපෙනෙන නව ලියෝ සමාජ සම්මානය ලෙස හඳුනාගෙන ඇත.	ශ්‍රී ලංකාව
පීඨයේ ලියෝ ක්ලබ්	දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	විශිෂ්ටතම නැඟී එන ලියෝ සමාජ 3 සම්මානය	පීඨයේ ලියෝ සමාජය 2024 වර්ෂයේ විශිෂ්ටතම නැඟී එන ලියෝ සමාජ 3 ලෙස හඳුනා ගෙන ඇත.	ශ්‍රී ලංකාව
ජී. කේ. සවින්දුල රූපසිංහ මහතා *(ශිෂ්‍ය)*	දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	ජලජ – පිහිනුම් 3 වැනි ස්ථානය – නිදහස් ආර – මීටර 25	**නිදහස් ආර සඳහා 3 වැනි ස්ථානය දිනා ගන්නා ලදී – මීටර 25 ලියෝ ඔලිම්පික් 2023/2024 පිහිනුම්**	ශ්‍රී ලංකාව
පීඨය කාන්තා කබඩි කණ්ඩායම	දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය	ශූරතාව	2024 අන්තර්පීඨ කබඩි ශූරතාව දිනා ගන්නා ලදී. (නායිකාව - විහර්ෂනා ලක්ෂානි මෙය)	ශ්‍රී ලංකාව

18. වෙනත් ඒකක සහ මධ්‍යස්ථාන

18.1 පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි අනුස්මරණ පුස්තකාලය
18.2 ශාරීරික අධ්‍යාපන ඒකකය
18.3 වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය
18.4 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
18.5 වෛද්‍ය මධ්‍යස්ථානය
18.6 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය
18.7 මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය
18.8 ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE)
18.9 සමාජ සංහිඳියා මධ්‍යස්ථානය (SRC)
18.10 තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA)
18.11 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ මධ්‍යස්ථානය (ELTC)
18.12 මාධ්‍ය සහ මුද්‍රණ ඒකකය
18.13 ගම්පහ වික්‍රමාරච්චි අන්තර්ජාතික මධ්‍යස්ථානය (GWIC)
18.14 විශ්වවිද්‍යාල ව්‍යාපාර සබැඳිය (UBL)







18.1 පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි අනුස්මරණ පුස්තකාලය



පසුබිම් තොරතුරු

විශ්වවිද්‍යාලයේ ආයුර්වේදය, දේශීය වෛද්‍ය ක්‍රමය, වෛද්‍ය විද්‍යා, සෞඛ්‍ය විද්‍යාව සහ වෙනත් ආශ්‍රිත විෂයන් පිළිබඳ ශික්ෂණය, ඉගෙනුම සහ පර්යේෂණ යන ප්‍රධාන කුළුණු ත්‍රිත්වය සඳහා අවශ්‍ය සම්පත් සම්පාදනය මෙම පුස්තකාලයේ ප්‍රධාන පරමාර්ථයන් වේ. පුස්තකාලය මඟින් විශිෂ්ට සහ නවෝත්පාදන පුස්තකාල සේවාවන් සහ නිපැයුම් සම්පාදනය සහ ප්‍රවර්ධනය හරහා මෙම පරමාර්ථ අත්කර ගනු ඇත. මෙයට අමතරව, දුරස්ථ ප්‍රවේශය සහ පුස්තකාල කාර්යයන් ස්වයංක්‍රීයකරණය ඇතිව ඉලෙක්ට්‍රොනික සම්පත් වැඩිවශයෙන් ප්‍රදානය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාවගේ ප්‍රතිලාභය සඳහා වඩාත් කාර්යක්ෂම සහ ඵලදායී පුස්තකාල සේවා සපයනු ඇත. ඉහත සඳහන් කළ පරමාර්ථ සාක්ෂාත් කර ගනු පිණිස, පුස්තකාලය එහි ග්‍රන්ථ එකතුව, පොත් බැහැරදීමේ අංශය, උපලේඛණගත යොමු අංශය, ස්ථීර යොමු අංශය සහ දුර්ලභ ග්‍රන්ථ එකතුව ලෙස සංවිධානගත කර ඇත.

පුස්තකාල එකතුවට සිංහල, ඉංග්‍රීසි, සංස්කෘත, පාලි, හින්දි සහ බෙංගාලි භාෂාවලින් ප්‍රකාශයට පත් කළ 34,000කට අධික ශාස්ත්‍රීය නිබන්ධන අන්තර්ගත වේ. මෙම එකතුවට පැල් කොළ මත ලියන ලද අත්පිටපත් කිහිපයක් ද ඇතුළත් වේ. පුස්තකාලයේ ඇති සියලුම ග්‍රන්ථ සම්මත වර්ගීකරණ ක්‍රමයක් වන ඩෙවි දශම වර්ගීකරණ ක්‍රමය (Dewey Decimal Classification System) අනුව වර්ගීකරණය කර සකසා ඇති අතර ඇන්ග්ලෝ-ඇමෙරිකානු නාමාවලි රීති (AACR-2 R) අනුකූලව වර්ගීකරණය කර ඇත. මෙම එකතුව කොහා ඒකාබද්ධ පුස්තකාල කළමනාකරණ ක්‍රමය (Koha integrated library management system) භාවිතා කරමින් පරිගණකගත කරමින ඇත. Koha යනු විවෘත-මූලාශ්‍ර මෘදුකාංග පද්ධතියකි.

ගොඩනැගිල්ල

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය මහල් හතරකින් සැදුම්ලත්, පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි අනුස්මරණ පුස්තකාල ගොඩනැගිල්ලේ පිහිටුවා ඇත. එය උසස් අධ්‍යාපන අවශ්‍යතාවන් සපුරාලීම පිණිස එම මට්ටමට සංවර්ධනය කරමින් ඇත.

පුස්තකාල දිශානති වැඩසටහන්

a) නවක ශිෂ්‍යයින් සඳහා පුස්තකාල දිශානති වැඩසටහන් පවත්වන ලදී.

b) අධ්‍යයන සාමාජිකයින් ඇතුළු පර්යේෂණ ප්‍රජාව සඳහා පර්යේෂණ දෘශ්‍යතාව සහ විශිෂ්ට ගුණාත්මක වාරසඟරා සහ කොල්ලකාරී වාරසඟරා හඳුනා ගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී.

වෛද්‍ය ආර්. ඩී. ඒ. තිස්ස - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති {පුස්තකාලයාධිපති (රාජකාරීවලට සහභාගීවන)}

පර්යේෂණ සහ ප්‍රකාශන

ක්ෂේත්‍රය	දායකත්වය
යොමුගත සූචිගත නොකළ වාරසඟරාවල පළකිරීම්	තිස්ස, ආර්. ඩී. ආනන්ද (2024), **පුස්තකාලයාධිපති වෘත්තියට බලපාන ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය : මහජන පුස්තකාල සේවයට විශේෂිතව, අමර සමර්චණා** පේ. ඒ. අමරවීර ගුණානුස්මරණ ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්. බෝපැත්තේ සෝමානන්ද හිමි. නැදිමාල : බෝපැත්තේ සෝමානන්ද හිමි, පි. 135-155
සම්පූර්ණ ලිපියක් ලෙස පළ කරන ලද	**ඇන්ග්ලෝ-ඇමරිකානු නාමාවලි රීති (AACR) හි පොත් විස්තරයට අදාළ නීති, බෞද්ධ ග්‍රන්ථ නාමාවලිය විශ්ලේෂණය සහ චතුභානවරපාලියේ ධම්ම චක්කප්පවත්තන සූත්‍රය සමඟ සංසන්දනාත්මක අධ්‍යයනයක්.** ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය විසින් සංවිධානය කරන ලද 2 වන ජාත්‍යන්තර බහු-විනය මේස පර්යේෂණ සමුළුව 2024 (DRC 2024) 2024 ඔක්තෝබර් 25 වන දින පැවැත්විණි.
	දේවපුර, ඩී., ගමගේ, එච්., තිස්ස, ආර්. ඩී. ඒ., සහ සජීවනි, කේ., *(2024)*. සමකාලීන වෙළඳපොළවල් කෙරෙහි සාම්ප්‍රදායික ආර්ථික පිළිවෙත්වල බලපෑම: ශ්‍රී ලංකාවේ මාතලේ, හපුවිද ගම්මානය තුළ ලක්ෂ (ලක්ෂා) ශිල්පීය ආර්ථිකයේ සංස්කෘතික උරුමයේ වැදගත්කම පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්. සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පිළිබඳ *6* වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියාදාමයන්, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානය, හිල්ටන් කොළඹ රෙසිඩන්සීස්, ශ්‍රී ලංකාව, *2024 ඔක්තෝබර් 24*, වාචික ඉදිරිපත් කිරීම, විස්තීර්ණ සාරාංශය, පිටු *92- 97*. ISBN 978-955-4978-11-9
වාර සඟරා/ ග්‍රන්ථ සංස්කරණය (i) සංස්කාරක මණ්ඩල සාමාජික/ අවම වශයෙන් වසරකට දෙවරක් පළ කරනු ලබන වාරසඟරාවල සමාලෝචක	ශ්‍රී ලංකා පුස්තකාල සමාලෝචන මණ්ඩලයේ සාමාජික (SLLR)
	ශ්‍රී ලංකා වෘත්තීය සංගම් සංවිධානයේ (OPA) වාරසඟරා කමිටුවේ සමාලෝචක සාමාජික
	ශ්‍රී ලංකා වෘත්තීය සංගම් සංවිධානයේ (OPA) 50 වැනි සංවත්සර වෙළුම, (1975-2025)
	කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය මගින් සංවිධානය කරනු ලැබූ 2 වැනි මේස පර්යේෂණ සම්මන්ත්‍රණයේ කාර්යසටහන්වල සමාලෝචක සාමාජික.
GWUIM ප්‍රාග්ධන ප්‍රදානයෙන් ලැබූ අරමුදල්	තිස්ස, ආර්. ඩී. ආනන්ද, සංජීවනී, එච්. ඩබ්ලිව්. කුසල් සහ දුල්ෂාන්, ශ්‍රී ලංකාවේ සාමාජීය ආර්ථික සංවර්ධනය සඳහා දේශීය දැනුම් පද්ධති (IKS) එක්රැස් කිරීම: සාම්ප්‍රදායික වාරි කර්මාන්තය සහ ජල කළමනාකරණ ක්‍රම පිළිබඳ විශේෂ යොමුවක් ඇති අධ්‍යයනයකි පර්යේෂණ ප්‍රදාන අංකය: 2023/16 ප්‍රධාන විමර්ශක: වෛද්‍ය ආර්. ඩී. ආනන්ද තිස්ස, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා 2 වැනි ප්‍රගති වාර්තාව: ආවරණය කළ කාලපරිච්ඡේදය - 2024 අගෝස්තු 31 සිට 2025 පෙබරාවාරි 17 වැනි

ක්ෂේත්‍රය	දායකත්වය
සම්පත්දායකයෙක් ලෙස සිදු කළ දායකත්වය	1. ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සහයෝගයෙන් 2024 මාර්තු 25-26 දිනවල පැවැති නුවරඑළිය, රාගල, වල්ලුවර් අධ්‍යාපන සංවර්ධන සංසදය (VEDF) සඳහා පුහුණු වැඩසටහනේ සම්පත්දායකයෙකු ලෙස සේවය කිරීම.
	2. 2024 අගෝස්තු 29 වන දින වාරියපොළ ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ දී නගර සභා අධිකාරිය විසින් පවත්වන ලද “පොත් වර්ගීකරණය, නාමාවලිකරණය සහ අන්තර් පුස්තකාල ණය” යන මාතෘකාව යටතේ පුහුණු වැඩසටහන් 01 මාලාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පළාත්/නාගරික සභාවේ මහජන පුස්තකාලයාධිපති සහ පුස්තකාල කාර්ය මණ්ඩලයේ සම්පත්දායකයෙකු සහ පුහුණු නිලධාරියෙකු ලෙස සේවය කර ඇත.
	3. 2024 සැප්තැම්බර් 05 වන දින දංකොටුව නගර ශාලාවේ දී නගර සභා අධිකාරිය විසින් පවත්වන ලද “පොත් වර්ගීකරණය, නාමාවලිකරණය සහ අන්තර් පුස්තකාල ණය” යන මාතෘකාව යටතේ පුහුණු වැඩසටහන් 02 මාලාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පළාත්/නාගරික සභාවේ මහජන පුස්තකාලයාධිපති සහ පුස්තකාල කාර්ය මණ්ඩලයේ සම්පත්දායකයෙකු සහ පුහුණු නිලධාරියෙකු ලෙස සේවය කර ඇත.
	4. 2024 සැප්තැම්බර් 12 වන දින පන්නල, පන්නල ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේදී නගර සභා අධිකාරිය විසින් පවත්වන ලද “පොත් වර්ගීකරණය, නාමාවලිකරණය සහ අන්තර් පුස්තකාල ණය” යන මාතෘකාව යටතේ පුහුණු වැඩසටහන් 03 මාලාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ පළාත්/නාගරික සභාවේ මහජන පුස්තකාලයාධිපති සහ පුස්තකාල කාර්ය මණ්ඩලයේ සම්පත්දායකයෙකු සහ පුහුණු නිලධාරියෙකු ලෙස සේවය කර ඇත.
	5. 2024 ඔක්තෝබර් 04 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල ශ්‍රවණාගාරයේදී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපති සංගමය විසින් සංවිධානය කරන ලද “ඔබේ වෙළඳ නාමය ගොඩනැගීම: පුස්තකාල වෘත්තියේ නායකත්වය සහ බලපෑම ස්ථාපිත කිරීම” යන මාතෘකාව යටතේ නායකත්ව වැඩසටහනක් සම්පත්දායකයෙකු ලෙස සේවය කරන ලදී.
	6. 2024 නොවැම්බර් 7 වන දින අනුරාධපුරයේ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨ ශ්‍රවණාගාරයේදී පැවති “පිරිවෙන් පුස්තකාල සඳහා ඵලදායී පුස්තකාල කළමනාකරණය” පිළිබඳ වැඩමුළුවේ සම්පත්දායකයෙකු ලෙස සේවය කරන ලදී.

දැරූ තනතුරු

- ප්‍රකාශන කමිටුවේ සභාපති, විධායක කමිටු සහ සංස්කාරක, (OPA) 2024/2025
- බාහිර කථිකාචාර්ය, NILIS, කොළඹ විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

විශ්වවිද්‍යාලය වෙනුවෙන් දුරු තනතුරු (2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා)

තනතුර	කමිටුව/කණ්ඩායම්
සභාපති	මාධ්‍ය කමිටුව, පර්යේෂණ පරිසංවාදය - IRSIKS 2024
සංවිධායක	ගුරු සංගමය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය
සාමාජික	සංවිධාන කමිටුව, IRSIKS 2024
සාමාජික	අරමුදල් සම්පාදන කමිටුව, IRSIKS 2024

විශ්වවිද්‍යාලයෙන් බාහිර ආයතන සඳහා දැරූ තනතුරු

තනතුර	කමිටු/කණ්ඩායම්
හිටපු සභාපති	ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (SLLA), ජාත්‍යන්තර සම්මේලන පුස්තකාල සංගමය (IFLA)
කැඳවුම්කරු	ප්‍රකාශන සම්මත කමිටුව, ශ්‍රී ලංකා වෘත්තීය සංගම් සංවිධානය (OPA)
සාමාජික	මණ්ඩල සාමාජික, ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩල (NLDSB)
සාමාජික	ව්‍යාප්ති සේවා පිළිබඳ උපදේශන කමිටු සාමාජික (NLDSB)
සාමාජික	ග්‍රන්ථ නාමාවලිය පාලනය පිළිබඳ විරුද්ධවාදී කමිටු සාමාජික (NLDSB)
සාමාජික	උපදේශන කමිටු සාමාජික, නගර සභා පුස්තකාලය, කැස්බෑව
සාමාජික	පුස්තකාල වෘත්තිකයින්ගේ ජාතික ප්‍රතිපත්තිය, (NLDSB)
සාමාජික	ජාතික කියවීමේ මාසික වාර්තා ඇගයීම් කමිටුව, (NLDSB)
සාමාජික	කවුන්සිලය, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, (SLLA)
සාමාජික	මහජන පුස්තකාල ප්‍රමිති සංශෝධන කමිටුව, (SLLA)
සාමාජික	විධායක කමිටු සාමාජික, ශ්‍රී ලංකා වෘත්තීය සංගම් සංවිධානය (OPA)
සාමාජික	පොදු සංසදනය, ශ්‍රී ලංකා වෘත්තීය සංගම් සංවිධානය
සාමාජික	ප්‍රකාශන කමිටුව, OPA
සාමාජික	අධ්‍යාපන සහ මානව සම්පත් සංවර්ධන කමිටුව, OPA
සාමාජික	වෘත්තීය මාර්ගෝපදේශ සහ නිපුණතා සංවර්ධන කමිටුව, OPA
සාමාජික	නියෝජිත සාමාජික, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමය (ULA)
සාමාජික	අධ්‍යාපන කමිටුව, SLLA
සාමාජික	පාඩම් ලිවීමේ කමිටුව, SLLA
සාමාජික	කාර්යාල සහ කළමනාකරණ කමිටුව, SLLA
සාමාජික	අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය (CPD) කමිටුව, SLLA
සාමාජික	NACLIS කමිටුව, SLLA
සාමාජික	තොරතුරු සහ මහජන සම්බන්ධතා කමිටුව, SLLA
සාමාජික	වාර්ෂික මහා සභා රැස්වීම් කමිටුව, SLLA
සාමාජික	දුක්ගැනවිලි කමිටුව, SLLA
සාමාජික	SLLA ප්‍රතිව්‍යුහගත කිරීමේ සහ NVQ ක්‍රියාත්මක කිරීමේ කමිටුව, SLLA
සාමාජික	උපායමාර්ගික සැලැස්ම අධීක්ෂණ සහ ක්‍රියාත්මක කිරීමේ කමිටුව (COMAISP), SLLA

එච්. ඩබ්ලිව්. කුසලා සජීවනී - සහකාර පුස්තකාලයාධිපති

ක්ෂේත්‍රය	දායකත්වය
ප්‍රකාශන	දේවපුර, ඩී., ගමගේ, එච්., තිස්ස, ආර්. ඩී. ඒ., සහ සජීවනී, කේ., (2024). සමකාලීන වෙළඳපොළවල් කෙරෙහි සාම්ප්‍රදායික ආර්ථික භාවිතයන්ගේ බලපෑම: ශ්‍රී ලංකාවේ මාතලේ, හපුවිද ගම්මානය තුළ ලක්ෂ (ලක්ෂ) ශිල්පීය ආර්ථිකයේ සංස්කෘතික උරුමයේ වැදගත්කම පිළිබඳ සිද්ධි අධ්‍යයනයක්. සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පිළිබඳ 6 වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියාදාමයන්, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාව පිළිබඳ ජාතික උසස් අධ්‍යයන මධ්‍යස්ථානය, හිල්ටන් කොළඹ නේවාසිකාගාර, ශ්‍රී ලංකාව, 2024 ඔක්තෝබර් 24, වාචික ඉදිරිපත් කිරීම, විස්තීර්ණ සාරාංශය, පිටු 92- 97. ISBN 978-955-4978-11-9
සමාලෝචකයෙක් වශයෙන් දායකත්වය	ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ 18 වන ජාතික සමුළුව (NACLIS) 2024: 2024 අප්‍රේල් 26 වන දින ගම්පහ මහජන පුස්තකාලයේ පැවති සමුළුවේදී, සමුළුවේ සම ලේකම්, සංවිධායක කමිටු සාමාජික, සමාලෝචක, සැසි සභාපති සහ වාර්තාකරු ලෙස දායක වූ දෙවන සැසිය, එච්.ඩබ්ලිව්. කුසලා සජීවනී.
GUWIM ප්‍රාග්ධන ප්‍රදානවලින් ලැබුනු අරමුදල්	තිස්ස, ආර්. ඩී. ආනන්ද, සජීවනි, එච්. ඩබ්ලිව්. කුසලා සහ දුල්ෂාන්, ඩී. ඩී. ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා දේශීය දැනුම පද්ධතිය (IKS) උපයෝගී කර ගැනීම: සාම්ප්‍රදායික වාරිමාර්ග සහ ජල කළමනාකරණ පද්ධති කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන අධ්‍යයනයක්. පර්යේෂණ ප්‍රදාන අංකය: 2023/16 ප්‍රධාන විමර්ශක: ආර්. ඩී. ආනන්ද තිස්ස, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව 2 වැනි ප්‍රගති වාර්තාව: ආවරණය කළ කාලපරිච්ඡේදය: 2024 අගෝස්තු 31 සිට 2025 පෙබරවාරි 17 දක්වා
ග්‍රන්ථ පරිච්ඡේද	පූජ්‍ය අක්මීමන පියරතනාභිධාන නාහිමිපාණන් වහන්සේට උපහාර සමරු කලාපය: “පූජ්‍ය කොටහේනේ පඤ්ඤාකිත්ති හිමි තාරේ මහා පණ්ඩිතයෙක්” පංචතුපරමග අක්මීමන විසින් ප්‍රකාශනය කරන ලද, 2024.01.27
වැඩමුළු සහ සම්මන්ත්‍රණවලට සහභාගීවීම	මුහුණු යෝග සහ සාම්ප්‍රදායික රූපලාවන්‍ය - හියුර් දැනුම, GWUIM හි දේශීය සමාජ විද්‍යා හා කළමනාකරණ අධ්‍යයන පීඨය මඟින් 2024 ජනවාරි 3 වන දින සංවිධානය කරන ලදී.
	2024 අප්‍රේල් 18 වන දින ශ්‍රී ලංකා පුස්තකාල සංගමය විසින් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ දී සංවිධානය කරන ලද ජාතික පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ සමුළුව (NACLIS) 2024 සැසිය - 01 ට සහභාගී වීම.
අධ්‍යයන අංශයට/ පීඨයට ලබාදුන් විශේෂ දායකත්වය	සෙනෙට් සම්මාන සඳහා ප්‍රකාශනයේ බලපෑම් සාධකවල මූල් පිටපත පරීක්ෂා කිරීමෙන් මම විශ්ව විද්‍යාලයේ පර්යේෂණ හා සංවර්ධනය සඳහා මගේ දායකත්වය ලබා දුන්නෙමි.
	මහාචාර්ය පියල් මාරසිංහ මහතාගේ පොත් පරිත්‍යාගයට අදාළ සියලු කටයුතුවලට සම්බන්ධ වීමෙන් පුස්තකාලයේ එකතු සංවර්ධනයට දායක වීමට මට හැකි විය.
	වර්ෂය තුළ පොත් මිල දී ගැනීමේ කටයුත්ත.
මාධ්‍ය ප්‍රකාශන	විශ්වවිද්‍යාලයේ කීර්ති නාමය ජාත්‍යන්තර වශයෙන් ඉහළ නැංවීමේ අරමුණින් උපකුලපතිවරයා සහ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ පුවත්පත් ලිපි පළ කිරීම. ගුවන් විදුලි සහ රූපවාහිනී වැඩසටහන් ඇතුළු ඔවුන්ගේ මාධ්‍ය වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
ශාස්ත්‍රීය වාර්තා	කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ සංස්කෘත හා පෙරදිග අධ්‍යයන දෙපාර්තමේන්තුවේ නියමිත අධ්‍යයන පාඨමාලාව සහ විභාග සාර්ථකව නිම කිරීමෙන් පසු 2024 මාර්තු 17 වන දින විශිෂ්ටතා සාමාර්ථයක් සහිතව සංස්කෘත ඩිප්ලෝමාව පිරිනමන ලදී.

2024 වර්ෂය සඳහා පුස්තකාලයේ ලියාපදිංචි වූ පරිශීලකයින්

පරිශීලකයින්		2023.12.31 තෙක්	2024 දී
ශිෂ්‍යයින්		517	1314
අධ්‍යයන කාර්ය මණ්ඩලය	ස්ථිර	47	-
	තාවකාලික	03	-
විධායක කාර්ය මණ්ඩලය		04	02
අනධ්‍යයන කාර්ය මණ්ඩලය		89	55

ග්‍රන්ථ සහ වාරසඟරා වැය ශීර්ෂය : මිලියන 2.0

වියදම

ග්‍රන්ථ	619	රු. 1,342,657.00
මුළු වියදම		රු. 1,342,657.00

ග්‍රන්ථ තොගය : 38,074



18.2 ශාරීරික අධ්‍යාපන ඒකකය

හැඳින්වීම

ශාරීරික අධ්‍යාපන ඒකකය ප්‍රථම උපාධි අපේක්ෂකයින් සහ විශ්වවිද්‍යා කාර්ය මණ්ඩලය සඳහා සෞඛ්‍ය සම්පන්න ක්‍රියාකාරී ජීවන රටාවක් දිරිමත් කරන, තුලනාත්මක ක්‍රීඩා ජීවිතයක් පිරිනැමීමට වගකීම දරයි.

දැක්ම

තුලනාත්මක ක්‍රීඩා සහ ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම හරහා ගතික සහ සෞඛ්‍යසම්පන්න ජීවන රටාවක් නිර්මාණය කර ගැනීම සඳහා ශිෂ්‍යයින් සහ විශ්වවිද්‍යා කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම.

මෙහෙවර

ශිෂ්‍යයින්ට සහ විශ්වවිද්‍යා කාර්ය මණ්ඩලයට සක්‍රීය සහ සෞඛ්‍යසම්පන්න ජීවන රටාවක් ඇති කර ගැනීම දිරිමත් කරන විවිධාකාර සහ ප්‍රවේශය ඇති ශාරීරික අධ්‍යාපන වැඩසටහන් මඟින් ඔවුන්ගේ සුභසිද්ධිය සහ ජීව ශක්තිය පිරි පරිසරයක් පෝෂණය කිරීම.

භෞතික අධ්‍යාපන අධ්‍යයන අංශය

කණ්ඩායම් ව්‍යුහය

වර්තමානයේ දී ශාරීරික අධ්‍යාපන ඒකකයේ සිටිනුයේ එක් ස්ථිර කාන්තා ශාරීරික අධ්‍යාපන උපදේශකවරියක් සහ එක් තාවකාලික ශාරීරික අධ්‍යාපන උපදේශකවරියක් පමණි. මෙයට අමතරව, සුළු කාර්ය මණ්ඩලයක් ලෙස සේවය කරන ස්ථිර ව්‍යායාම සහායක නිලධාරිනියක් සහ තාවකාලික කාන්තා වැඩ සහායිකාවක් සිටී. ශාරීරික අධ්‍යාපන ඒකකයේ වැඩබලන අධ්‍යක්ෂවරයාගේ වගකීම් දැනට විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරයා විසින් කළමනාකරණය කරනු ලැබේ.

බාහිර පුහුණුකරුවන්

අංකය	ක්‍රීඩාව	නම	සුදුසුකම්
i	වොලිබෝල්	එම්. එස්. එම්. කුමාර මහතා	අවශ්‍ය පුහුණු කිරීමේ කුසලතා සහ අදාළ ක්‍රීඩා පුහුණු කිරීම් පැවැත්වීම සඳහා වූ බලපත්‍ර ඔවුන් සතුය.
ii	ක්‍රිකට්	පී. ශානක මහතා	
iii	කබඩ්ඩි	එච්. ඒ. එන්. පතිරණ මහතා	
iv	කැරම්	එස්. එන්. පෙරේරා මහතා	
v	ටයික්වොන්ඩෝ	ඩී. ජී. එම්. එස්. දෙනියාය මහතා	
vi	කරාතේ	ඉසෙඩ්. ඒ. රවුෆ් මහතා	
vii	බැඩ්මින්ටන්	ඒ. එස්. විජේසේකර මහතා	
viii	මේසපන්දු	එන්. ගිනිගේ මහතා	



වාර්ෂික වැඩසටහන්

- 2024 අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලිය 2024 අගෝස්තු 24 සිට දෙසැම්බර් 24 වැනි දින දක්වා පවත්වනු ලැබේ. අපි ක්‍රීඩා ඉසව් 24 අතුරින් 15කට සහභාගීවන්නෙමු.
- 2024 නොවැම්බර් 1 සිට නොවැම්බර් 3 දක්වා කැලණිය විශ්ව විද්‍යාලයේ ගෘහස්ථ ව්‍යායාම ශාලාවේ දී 2024 අන්තර් විශ්ව විද්‍යාල කරාතේ ශූරතාවලිය සංවිධානය කර සත්කාරකත්වය ලබා දුනි.
- 2024 ජනවාරි 13 සිට පෙබරවාරි 11 දක්වා පීඨ තුනේම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සහභාගීත්වයෙන් මංගල අන්තර් පීඨ ශූරතාවලිය සංවිධානය කරන ලදී.

වෙනත් ශූරතාවලි

- 2024 ජනවාරි 17 වැනි දින විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා සමාරම්භක විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල කැරම් ශූරතාව සංවිධානය කරන ලදී.
- 2024 දෙසැම්බර් 24 වැනි දින විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා සමාරම්භක විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සැහැල්ලු පන්දු තරඟාවලියක් සංවිධානය කරන ලදී.
- (කැළණිය විශ්වවිද්‍යාලයේ) වෛද්‍ය පීඨයේ කාර්ය මණ්ඩලය සහ GWUIM විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය අතර බැඩ්මින්ටන් සහ කැරම් සුහද තරඟයක් සංවිධානය කරන ලදී.

විශේෂ වැඩසටහන්

- විශ්වවිද්‍යාලයේ පිරිමි වෙස් කණ්ඩායමේ සාමාජිකයෙක් වන එස්. එම්. වික්‍රමසිංහ මහතාට (GWU/BIMR/2020/35) 2024 වර්ෂයේ දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල වර්ණ සම්මානය ප්‍රදානය කරන ලදී.
- **දිශානති වැඩසටහන:** 2024 මාර්තු 27 වන දින සමාජ විද්‍යා හා කළමනාකරණ අධ්‍යයන පීඨය සඳහා වන නැඹුරු කිරීමේ වැඩසටහනේ කොටසක් ලෙස ක්‍රීඩා හා විනෝදාත්මක සැසියක් පැවැත්වීම.

සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සඳහා වූ දිශානති වැඩසටහන





➢ කලාපීය ක්‍රීඩා සංවර්ධනය සඳහා දායකත්වය

ගෘහස්ථ ක්‍රීඩාංගනය වෙන්කරවා ගැනීම			
දිනය	**ආයතනය හෝ සමාගම**	**ඉසව්ව**	**පූර්ණ දින/අර්ධ දින**
28.07.2024 **29.07.2024** **01.08.2024**	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ (USJ) ව්‍යවහාරික විද්‍යා පීඨයේ (FAS) ක්‍රීඩා විද්‍යා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා විද්‍යාව සහ කළමනාකරණ උපාධි වැඩසටහනේ BSc (ගෞරව) සඳහා පිරිනමනු ලබන SSM 290 2.0 රැකවි ක්‍රීඩා (බැඩ්මින්ටන්) මූලික වලන සහ කුසලතා විශ්ලේෂණය පාඨමාලා ඒකකයේ ප්‍රායෝගික සංරචකය පැවැත්වීම.	පූර්ණ දිනය
2024.08.31	කැළණිය විශ්වවිද්‍යාලය	ප්‍රායෝගික සැසිය සඳහා – කැළණිය විශ්වවිද්‍යාලයේ වොලිබෝල් කණ්ඩායම	අර්ධ දින
2024.10.26 **2024.10.27** **2024.11.02** **2024.11.03**	ඒකාබද්ධ විශ්වවිද්‍යාල කණ්ඩායම	ශ්‍රී ලංකා ඒකාබද්ධ විශ්වවිද්‍යාල වොලිබෝල් පිරිමි කණ්ඩායම් පුහුණුව	අර්ධ දින

➢ මූල්‍ය ප්‍රකාශනය

අංකය	වෙනකළ ආදායම	මුදල (රු.)
i	මැලිබන් බිස්කට් නිෂ්පාදන (පුද්ගලික) සමාගම වොලිබෝල් කණ්ඩායම – පුහුණුව සඳහා	9,000.00
ii	ශ්‍රී ලංකා වරාය වොලිබෝල් කණ්ඩායම - පුහුණුවීම් සඳහා	118,000.00
iii	ශ්‍රී ලංකා වරාය කාන්තා වොලිබෝල් කණ්ඩායම - පුහුණුවීම් සඳහා	20,000.00
iv	රෙජී රණතුංග විද්‍යාලය මිනුවන්ගොඩ වොලිබෝල් කණ්ඩායම – පුහුණුව සඳහා	16,500.00
v	ශ්‍රී ලංකා පොලිස් වොලිබෝල් කණ්ඩායම - පුහුණුවීම් සඳහා	32,000.00
vi	මාබිම විද්‍යාකර මහ විද්‍යාලය වොලිබෝල් කණ්ඩායම – පුහුණුවීම් සඳහා	1,500.00
එකතුව		**197,000.00**

වැදගත් අවස්ථාවන්

අන්තර් විශ්වවිද්‍යාල ශූරතාව 2024



2024 අන්තර් විශ්වවිද්‍යාල කරාතේ ශූරතාවලිය සංවිධානය කර සත්කාරකත්වය දක්වන ලදී.













සමාරම්භක අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලිය සංවිධානය කරන ලදී.





විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල කැරම් ශූරතාවලිය









විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ ක්‍රිකට් තරඟාවලිය





කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ කාර්ය මණ්ඩලය සහ **GWUIM** විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය අතර පැවති සුහද තරඟය





18.3 වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

හැඳින්වීම

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය ශිෂ්‍යයින්ගේ සේවානියුක්තිභාවය ඉහළ නංවන අතරතුර ඔවුන්ගේ වෘත්තීය ගුණාත්මකභාවය සහ මෘදු කුසලතා වැඩිදියුණු කිරීමේ පරමාර්ථය ඇතිව ස්ථාපිත කරන ලදී. වෘත්තීය සංවර්ධනය ජීවිත කාලය පුරාවට දිවෙන ක්‍රියාවලියක් බවට විශ්වාස කරයි. එබැවින්, අදාළ ක්ෂේත්‍රවල සංවර්ධනය සඳහා ධනාත්මකව දායකවීමට සවිබල ලත් හැකියාවෙන් යුත්, සේවානියුක්ත කළ හැකි උපාධිධාරීන් බිහි කිරීම පිණිස ඒකකය අනුග්‍රහය දක්වයි.
මෙම ඒකකය ශිෂ්‍යයින් සඳහා වෙබ් සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මන්ත්‍රණ, ව්‍යවසායකත්ව වැඩසටහන් ඇතුළු සේවා සහ සම්පත් මාලාවක් පිරිනමයි.

සියලුම පීඨවල ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා පිරිනමනු ලබන 'ජීවිත සහ වෘත්තීය නිපුණතා සංවර්ධනය' පාඨමාලාව ඒකකය මඟින් පිරිනමනු ලබන ප්‍රධාන වැඩසටහනකි. ශිෂ්‍යයින් සඳහා ජීවිත කාලය පුරාවට ඉගෙන ගැනීමේ අභිලාෂය ඇති කරවනු පිණිස අදාළ ක්ෂේත්‍රවල සහ කර්මාන්තවල අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා ශිෂ්‍යයින්ට ඉතාම වැදගත් වන හැකියාවන් සහ නිපුණතා සංවර්ධනය කිරීම වෙනුවෙන් මෙම පාඨමාලාව සකස් කර ඇත.

මෙයට අමතරව, සංචාරක කර්මාන්තය, ඖෂධ කර්මාන්තය, කෘෂිකර්මාන්තය, ජෛව වෛද්‍ය කර්මාන්තය, යෝග මධ්‍යස්ථාන සහ වෙනත් ප්‍රතිකාර මධ්‍යස්ථාන, සෞඛ්‍ය සේවා කර්මාන්තය සහ වෙනත් කර්මාන්තවල වෘත්තීය අවස්ථාවන් සඳහා උනන්දුවක් දක්වන විද්‍යාර්ථයින්ට එම අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීම මඟින් එම රැකියාගත කිරීම් සඳහා අවශ්‍ය මඟපෙන්වීම ලබාදීමෙන් ද ඒකකය ඔවුන් සඳහා ප්‍රතිලාභ සපයනු ලබයි. තව ද, මෙම ඒකකය ශිෂ්‍යයින් සඳහා රැකියා සහ ආධුනිකත්ව අවස්ථාවන් ලබාදීම පිණිස සේවායෝජකයින් සමග සමීප සම්බන්ධතා පවත්වා ගෙන යාම කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කර ඇත.

දැක්ම

උපාධි අපේක්ෂකයින්ගේ වෘත්තීය ඉලක්ක අත්කර ගැනීමට සහ විශ්වාසනීයව සහ අරමුණු ඇතිව සමාජයට දායකවීම පිණිස ඔවුන් සවිබලගන්වමින් ඔවුන් වෙනුවෙන් ප්‍රමුඛතම වෘත්තීය මාර්ගෝපදේශය සහ සංවර්ධන සේවා සම්පාදකයා බවට පත්වීම.

මෙහෙවර

උපාධි අපේක්ෂකයින් උනන්දුවක් දක්වන ක්ෂේත්‍ර, ඔවුන්ගේ නිපුණතා සහ වටිනාකම්වලට ගැලපෙන ලෙස සකස් කළ විස්තීරණ මාර්ගෝපදේශය, සම්පත්, සහ අවස්ථාවන් ලබා දෙමින් ඔවුන්ගේ වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් උපාධි අපේක්ෂකයින් දිරිමත් කිරීම සහ ඔවුන්ට මඟපෙන්වීම.

පරමාර්ථ

- උපාධි අපේක්ෂකයින්ගේ තනි පුද්ගල අවශ්‍යතාවන් සපුරාලනු පිණිස පෞද්ගලිකව සකස් කළ වෘත්තීය මාර්ගෝපදේශ සහ සංවර්ධන සේවා සැපයීම.


- උපාධි අපේක්ෂකයින් සඳහා ආධුනිකත්වය, රැකියා සහ ජාලගත කිරීමේ අවස්ථාවන් නිර්මාණය කිරීමට සේවායෝජකයින් සමඟ සබඳතා ගොඩනඟා ගැනීම සහ පවත්වා ගැනීම.

- උපාධි අපේක්ෂකයින්ගේ වෘත්තීය සාර්ථකත්වය සඳහා අවශ්‍ය නිපුණතා සහ කුසලතා ගොඩනැගීමට අනුග්‍රහය දක්වන නවීන වැඩසටහන් සහ වැඩමුළු නිර්මාණය කිරීම සහ පැවැත්වීම.

- උපාධි අපේක්ෂකයින් සඳහා නිවැරදි සහ අදාළ වෘත්තීය තොරතුරු සැපයීම පිණිස කර්මාන්ත නැඹුරුතා සහ ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම පිළිබඳ දැනුම යාවත්කාලීනව පවත්වා ගැනීම.

- සියලුම පසුබිම්වලින් පැමිණෙන උපාධි අපේක්ෂකයින්ගේ සාර්ථකත්වයට අනුග්‍රහය දැක්වීම පිණිස වැඩසටහන්වල සියලුම අංශවලින් විවිධත්වය, සමානාත්මතාව සහ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.

අපගේ ආයතනික ව්‍යුහය



කාර්ය මණ්ඩල තනතුරු

කාර්ය මණ්ඩල තනතුර	නම	
අධ්‍යක්ෂ	වෛද්‍ය ලක්ෂිත මදුනිල්	
ලේකම්	ජනනී හේවගේ මිය	
සම්බන්ධීකාරකගේ නම	**උපාධි වැඩසටහන**	**පීඨය**
වෛද්‍ය රේණුකා පෙරේරා	ආයුර්වේද වෛද්‍යවේදී හා ශල්‍යවේදී උපාධිය (BAMS)	FIM
දිනිදු දේවපුර මයා	දේශීය දැනුම පිළිබඳ සාමාජීය අධ්‍යයන (BSSI)	FISSMS
කෞෂල්‍යා වික්‍රමසිංහ මිය	තොරතුරු තාක්ෂණය	
ජනනී හේවගේ මිය	සෞඛ්‍ය සේවා කළමනාකරණය (BHSM)	
කසුරි බාලසූරිය මිය	ජෛවවෛද්‍ය තාක්ෂණය (BBMT)	FIHST
	සෞඛ්‍ය තොරතුරු සන්නිවේදන තාක්ෂණය (HICT)	
වෛද්‍ය ඉෂානි ගුණසේකර	දේශීය වෛද්‍ය සම්පත් (BIMR)	
	දේශීය ඖෂධ තාක්ෂණය (BIPT)	
විෂ්මි ජයසිංහ මිය	යෝග සහ පරාමනෝවිද්‍යාව (BSYP)	
	සෞඛ්‍ය සංචාරක කර්මාන්තය සහ සත්කාර කළමනාකරණය (HTHM)	

වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මඟින් පවත්වන ලද පුහුණු/ දැනුවත් කිරීමේ වැඩසටහන් – 2024

ඉලක්කගත කණ්ඩායම්: FIHST සහ FISSMS පීඨවල සියලුම ශිෂ්‍යයින්

අංකය	දිනය	සම්පත්දායකයා	මාතෘකාව
I	06/12/2024	වෛද්‍ය රුචිර විජේසිංහ	ශාස්ත්‍රීය ජීවිතය සමබල කිරීම සහ ආතතිය කළමනාකරණය

01.1 2024 වර්ෂයේ දී අපගේ වැඩසටහනට සහභාගී ශිෂ්‍යයින් හිමිවූ ප්‍රතිලාභ සහ අවස්ථාවන්

වර්ෂය තුළ වැඩසටහන් සාරාංශය

පීඨයේ නම	පවත්වන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව
FIHST	02
FISSMS	02
FIM	00
එකතුව	**04**

2024 වර්ෂයේ පවත්වන ලද අපගේ වැඩසටහන්වලින් ශිෂ්‍යයින්ට හිමි වූ ප්‍රතිලාභ සහ අවස්ථාවන්

වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්වලට සහභාගීවීමෙන් උපාධි අපේක්ෂකයින්ට පහත දක්වා ඇති පරිදි ප්‍රතිලාභ සහ අවස්ථාවන් රැසක් හිමි වේ.

i. මෙම වැඩමුළුව ශිෂ්‍යයින්ට ඵලදායී කාල කළමනාකරණ කුසලතා වර්ධනය කිරීමට, ආතතිය අඩු කිරීමේ ප්‍රායෝගික ශිල්පක්‍රම ඉගෙනීමට සහ මානසික සෞඛ්‍ය පිළිබඳව දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීමට උපකාරී වෙයි.

ii. මෙම අත්‍යවශ්‍ය මෙවලම්වලින් ශිෂ්‍යයින් සන්නද්ධ කිරීම තුළින් වැඩමුළු මඟින් ශිෂ්‍යයින්ගේ අධ්‍යයන කාර්යසාධනය වැඩිදියුණු කිරීමට, යහපැවැත්ම ඉහළ නැංවීමට සහ අනාගත වෘත්තීය අභියෝග සඳහා වඩාත් හොඳින් සූදානම්වීමට දායක වෙයි.

iii. 2024 වර්ෂයේ දී අත්කර ගත් විශේෂ ජයග්‍රහණ

iv. 2024 වර්ෂයේ දී සැලසුම් කරන ලද සංවර්ධනයන්

18.4 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

හැඳින්වීම

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) සියලුම විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සංවර්ධනය පිණිස විශ්වවිද්‍යාලයේ පිහිටුවා ඇති සේවා මධ්‍යස්ථානය වන අතර ආයතනික සංවර්ධන ව්‍යාපෘති සහ මූලාරම්භයන් ගණනාවක් සඳහා වගකීම දරයි.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ මානව සම්පත් උපාය මාර්ගය සකස් කිරීම, සෑම සේවකයෙකුගේම ගමන් මඟේ වැදගත් සන්දිස්ථානවල දී ඉහළ කාර්යාක්ෂමතාවක් සහ ශක්තිමත් සහයෝගීතා නිර්මාණය කිරීම සහ තනි පුද්ගලයින්ට සහ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයට ඉහළ කාර්යාක්ෂමතා මට්ටම් අත්කර ගත හැකි තත්ත්වයන් නිර්මාණය කිරීම පිණිස මානව සම්පත් සමඟ උපාය මාර්ගික සහකරු ලෙස කටයුතු කරයි.

දැක්ම/මෙහෙවර

පුහුණුව හරහා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය වැඩිදියුණු කිරීමට

පරමාර්ථ

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සංවිධාන වෙනස්කම් ධනාත්මකව සැලසුම් කිරීම සහ ඉදිරිපත් කිරීම පිණිසත් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ කුසලතා, දැනුම සහ විශ්වාසය සංවර්ධනය කිරීමටත් දායකවීම ඉලක්ක කරයි. මෙම මධ්‍යස්ථානය පීඨ, අධ්‍යයන අංශ සහ ස්වාධීන ඒකකවලට අනුග්‍රහය දැක්වීම පිණිස නිපුණතා මැදිහත්වීම් ලබා දෙමින් එම ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතර විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සහ මෙහෙයුම් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස උපකාර වෙයි.

එමෙන්ම කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය වැඩ කිරීමේ සහ සිතීමේ නව ක්‍රමවේද සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය නිරත කරවීමේ විශ්වවිද්‍යාලය හරහා ක්‍රියාත්මක කරනු ලබන මූලාරම්භයන්ට ද සහයෝගය සපයයි.

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය:

- විශ්වවිද්‍යාලයේ සියලුම කාර්යයන් සම්බන්ධයෙන් පර්යේෂණ-තොරතුරුලත් ප්‍රවේශයක් යොදා ගැනීම මඟින් සහ ශිෂ්‍යයින්ගේ ඉගෙනුම් වැඩිදියුණු කිරීම පිණිස විශ්වවිද්‍යාලය පුරාවට පර්යේෂණ පාදක ව්‍යවහාර දිරිමත් කිරීම මඟින් විශ්වවිද්‍යාලයේ ප්‍රමිතීන් ඉහළ නංවයි.
- සහභාගීත්ව සහ ඉගෙනුම් කේන්ද්‍රීය අධ්‍යාපනයක් සඳහා ආධාර දෙන අතර ඉගෙනුම සහ ශික්ෂණය සඳහා ඉහළ ස්ථානයක් හිමිකරවන විශ්වවිද්‍යාලය තුළ නව සංස්කෘතියක් සඳහා දායකවෙයි.
- විවිධ වැඩ මාලා සහ මූලාරම්භයන්ට මඟපාදන හෝ දායක වන විශ්වවිද්‍යාල මානව සම්පත් උපාය මාර්ග ක්‍රියාත්මක කරවීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.
- විශ්වවිද්‍යාලය තුළ සහ පිටත සියලුම වෘත්තිකයින් සඳහා, විවිධ ප්‍රවේශ සහ මැදිහත්වීම් භාවිතා කරමින්, විස්තීරණ සහ ඉහළ ගුණාත්මකභාවයකින් යුත් වෘත්තීය පාඨමාලා සහ පුහුණු වැඩසටහන් ලබාදෙයි.
- ආයතනික නිර්මාණ සැලසුම්, වෙනස්කම් පිළිබඳ ක්‍රමවේද සහ යෝග්‍ය මැදිහත්වීම් හරහා ආයතනයේ උපාය මාර්ගික සහ මෙහෙයුම් මට්ටම්වල වෙනස්කම් සඳහා අනුග්‍රහය දක්වයි.
- නායකත්වය, කුසලතා කළමනාකරණය, යහපැවැත්ම, නියැලීම සහ කාර්යසාධනය වැනි විවිධ තේමාවන් හරහා ආයතනික සංවර්ධනය සඳහා උපායමාර්ග ගොඩනගයි, ක්‍රියාත්මක කරයි.

කාර්ය මණ්ඩල තනතුරු

අධ්‍යක්ෂ – වෛද්‍ය එම්. ඩී. ජේ. එන්. විජේසිංහ

2024 වර්ෂයේ දී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය මඟින් පවත්වන ලද විශේෂ වැඩසටහන්

වැඩසටහනේ නම	සහභාගීවූවන්
ක්‍රියාකාරකම් පාදක පුහුණු වැඩසටහන	කථිකාචාර්යවරු
මයික්‍රෝ සොෆ්ට් ටීම්ස් පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන	කථිකාචාර්යවරු
ඉගැන්වීමේ දී කෘතිම බුද්ධි මෙවලම්	කථිකාචාර්යවරු

18.5 වෛද්‍ය මධ්‍යස්ථානය

හැඳින්වීම

වෛද්‍ය මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් සඳහා බාහිර රෝගී ප්‍රතිකාර උපදේශන දෛනික ප්‍රතිකාර සහ හදිසි රෝග අවස්ථා ප්‍රතිකාර ලබා දෙයි. රෝගීන්ගේ අවශ්‍යතාව සහ අදාළ සිද්ධි අවස්ථාව අනුව රෝගියා අදාළ සායනයට හෝ තෘතීය ප්‍රතිකාර රෝහලක් වෙත යොමු කරනු ලැබේ.

ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය සඳහා ලබා දෙන පහසුකම්

- බාහිර ප්‍රතිකාර ඒකකයේ වෛද්‍ය උපදේශනය
- හදිසි රෝග අවස්ථා කළමනාකරණය
- පෞද්ගලික වෛද්‍ය සහතික ඇගයීම්
- ආයුර්වේද ප්‍රතිකාර

කාර්ය මණ්ඩල තනතුරු

1. ප්‍රධාන වෛද්‍ය නිලධාරී
2. හෙද නිලධාරී



18.6 තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය





හැඳින්වීම

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ විශ්වවිද්‍යාලයේ අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්ව සඳහා පරිගණක පහසුකම් සහ සේවා ලබා දෙන පොදු මධ්‍යස්ථානය වේ.

මෙම මධ්‍යස්ථානයට පරිගණක 100කින් සැදුම්ලත් ප්‍රධාන විද්‍යාගාරය ඇතුළත් වේ. මෙම පහසුකම් විශ්වවිද්‍යාලයේ ඕනෑම ශිෂ්‍යයෙක් විසින් භාවිතා කළ හැකිය.

විශ්වවිද්‍යාලයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය ලංකා එඩියුකේෂන් ඇන්ඩ් රිසර්ච් නේට්වර්ක් (LEARN) හරහා කුලී පදනම මත ලබා ගත් අන්තර්ජාල සබඳතාවක් ලබා දෙයි. එමෙන්ම විශ්වවිද්‍යාලයට බණ්ඩාරගම පිහිටි දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සඳහා ද LEARN හරහා ලබා ගත් අතුරු සබැඳියක් ඇත. විශ්වවිද්‍යාලය රැහැන් සහිත සහ රැහැන් රහිත යන ආකාර දෙකෙන්ම ලබා ගත් සබැඳි හරහා එහි කාර්ය මණ්ඩලයට මෙන්ම ශිෂ්‍යයින්ට ජාල ආවරණය ලබා දෙයි.

සපයන සේවාවන්

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාලය ඇතුළත තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත ගැටළු විසඳීමට උනන්දුවක් දක්වන, ගතික, කාර්යක්ෂම කාර්ය මණ්ඩලයකි. මෙම මධ්‍යස්ථානය මඟින් පහත දැක්වෙන සේවාවන් සපයනු ලබයි.

අ) අවශ්‍ය කරන පරිගණක සඳහා අන්තර්ජාල සබඳතා සැපයීම.

ආ) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ උපාධි අපේක්ෂකයින් සඳහා විශ්වවිද්‍යාල විද්‍යුත් තැපෑල ලබාදීම

ඇ) විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ උපාධි අපේක්ෂකයින් සඳහා ඔෆිස් 365 බලපත්‍රය ලබාදීම

ඈ) විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සේවාදායක පරිගණකවල භාරකාරත්වය සහ අධිකාරිය ඇතිව සිටීම

ඉ) විශ්වවිද්‍යාලයේ සේවාදායක පරිගණක නඩත්තු කිරීම සහ උත්ශ්‍රේණිගත කිරීම එනම වෙබ්සේවාදායකය, AD සේවාදායකය, DNS, ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMS) සේවාදායක ආදිය.

ඊ) විශ්වවිද්‍යාල වෙබ්අඩවිය නඩත්තු කිරීම.

උ) රැහැන් සහිත සහ රැහැන් රහිත විශ්වවිද්‍යාල ජාලය නඩත්තු කිරීම සහ දෝෂ නිවැරදි කිරීම.

ඌ) පරිගණක සහ වෙනත් අදාළ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ උපකරණ අළුත්වැඩියා කිරීම

එ) විශ්වවිද්‍යාලය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ-ආශ්‍රිත උපකරණ මිල දී ගැනීම සඳහා තාක්ෂණික සහාය සැපයීම.

ඒ) කාර්ය මණ්ඩලයට සහ ශිෂ්‍යයින්ට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත තාක්ෂණික සහාය සැපයීම
ඔ) විශ්වවිද්‍යාලයේ සීසීටීවී ආරක්ෂක කැමරා පද්ධතිය නඩත්තු කිරීම
ඕ) පිරිස 150 දෙනෙක් සඳහා ආසන පහසුකම් ඇති ශ්‍රවණාගාරයක් නඩත්තු කිරීම.

කාර්ය මණ්ඩල තනතුරු

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය උපකුලපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයේ භාරකරු
- සහකාර ජාල කළමනාකරු
- උපදේශකයින් (පරිගණක ශිල්පීන්)
- තාක්ෂණික නිලධාරී (ICT)
- විද්‍යාගාර සහායක

වර්ෂය තුළ ලැබූ ප්‍රගතිය

විශ්වවිද්‍යාලයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පහත දැක්වෙන පියවර ගෙන ඇත.

- ප්‍රධාන විද්‍යාගාරය සඳහා මේස පරිගණක 18ක් මිල දී ගැනීම.
- අලුතින් ස්ථාපිත කළ අධ්‍යයන අංශ සහ මධ්‍යස්ථානවල විශ්වවිද්‍යාල ජාලය වැඩිදියුණු කිරීම.
- නුගේගොඩ පිහිටි LEARN දේශීය සාමාජීය විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය සඳහා LEARN හරහා රැහැනක් ලබා ගැනීම.
- සේවාදායක පරිගණක විසන්ධිවන කාලය අවම කිරීමට පියවර ගන්නා ලදී.
- විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සහ උපාධි අපේක්ෂකයින් සඳහා විශ්වවිද්‍යාල විද්‍යුත් අනන්‍යතා ලබාදීම.
- කඩදාසි භාවිතය අවම කිරීම සඳහා විශ්වවිද්‍යාලය ඇතුළත ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය හඳුන්වාදීම.
- කාර්ය මණ්ඩලය සහ උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් සඳහා ඔෆිස් 365 ලබාදීම.
- අඛණ්ඩ අධ්‍යාපනයක් සහතික කිරීම පිණිස දේශන සහ ඇගයීම් ලබාදීම සඳහා මාර්ගගත වේදිකාවක් සැපයීමට වැඩ වෙන් කිරීම.
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානයේ පවත්වනු ලබන වැඩමුළු, දේශන සහ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අනුග්‍රහය දැක්වීම.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම සඳහා කෙටි කාලීන සැලසුම්

- උපාධි අපේක්ෂකයින්ගේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනයට පහසුකම් සැලසීම පිණිස පරණ පරිගණක වෙනුවට නව පරිගණක මිල දී ගැනීම.
- උපාධි අපේක්ෂකයින්ගේ තොරතුරු සන්නිවේදන අධ්‍යාපනයට පහසුකම් සැලසීම පිණිස පැරණි පරිගණක වෙනුවට නව පරිගණක ලබාදීම.
- ඉගැන්වීමේ පහසුකම් සඳහා සුහුරු පුවරු (Smart Board) හඳුන්වාදීම
- දැනට පවතින ජාලය උත්ශ්‍රේණිගත කිරීම සහ ජාල ආවරණය ඉහළ නැංවීම සඳහා විශ්වවිද්‍යාලයට ජාල උපකරණ මිල දී ගැනීම.
- ආරක්ෂාව තහවුරු කිරීම සහ සුමට ජාල සේවාවක් වැඩිදියුණු කිරීම සඳහා මූලික ජාල ස්විචය සහ ෆයර්වෝල් (core network switch and firewall) ප්‍රතිෂ්ඨාපනය කිරීම.
- විශ්වවිද්‍යාලයේ පරිශීලනය සඳහා නොමිලේ ලබා දෙන හා විවෘත සම්පත් මෙවලම් සහ ඒවායේ පාරිභෝගික අභිරුචිකරණය පිළිබඳ අත්හදා බැලීම් පැවැත්වීම.

18.7 මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය

හැඳින්වීම

මෙම දෙමහල් විද්‍යාගාර ගොඩනැගිල්ල ඉහළ මට්ටමේ විද්‍යාගාර ගෘහ උපකරණ, නවීන විද්‍යාගාර උපකරණ සහ විදුලිය, ජලය සහ වායු අඛණ්ඩ සැපයුමකින් සමන්විත වේ. විද්‍යාගාරයට **ප්‍රධාන විද්‍යාගාරය** සහ **පර්යේෂණ විද්‍යාගාරය** ලෙස අංශ දෙකකින් ඇතුළත් වේ.

නව රසායනාගාර ගොඩනැගිල්ල මඟින් උපාධි අපේක්ෂකයින් 85 දෙනෙකුට ප්‍රායෝගික සැසියක දී වැඩ කිරීමටත්, සිසුන් 30 දෙනෙකුට ඔවුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති කටයුතු කරගෙන යාමටත්, අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ පර්යේෂණ කටයුතු සිදු කිරීමටත් පහසුකම් සැලසිය හැකි බව සඳහන් කිරීමට ලැබීම ඉමහත් සතුටකි.

දැක්ම

මධ්‍යම විද්‍යාගාරය විද්‍යාව පදනම් වූ ප්‍රවේශයක් හරහා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණ පරිසරයක් සපයයි.

මෙහෙවර

මධ්‍යම විද්‍යාගාරය ජෛවරසායන විද්‍යාව, ප්‍රකාශ රසායන විද්‍යාව, ශාක විද්‍යාව සහ ක්ෂුද්‍රජීව විද්‍යාව යනාදී ක්ෂේත්‍රවල පර්යේෂණ කටයුතු පිළිබඳ අවධානය යොමු කරමින් දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ නවීන පර්යේෂණ කටයුතු දිරිමත් කරයි.

පරමාර්ථ

- නිපුණාවලින් පොහොසත් දේශීය වෛද්‍ය විද්‍යා උපාධිධාරීන් බිහි කිරීම පිණිස ප්‍රථම උපාධි අපේක්ෂකයින් සඳහා ප්‍රායෝගික පුහුණු සැසි පිරිනැමීම.
- දේශීය වෛද්‍ය විද්‍යාව ආශ්‍රිත පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීමට මඟපාදන පර්යේෂණ ක්‍රමවේද හඳුන්වාදීම.
- ජාතික සහ අන්තර්ජාතික වශයෙන් පිළිගත් පර්යේෂණ, විමර්ශන විශ්ලේෂණ සේවා සහ නව සොයා ගැනීම් පැවැත්වීම.



විද්‍යාගාර කාර්ය මණ්ඩලය

1. විද්‍යාගාර සම්බන්ධීකාරක

ප්‍රධාන විද්‍යාගාරයේ කාර්ය මණ්ඩලය

1. ප්‍රධාන තාක්ෂණික නිලධාරී
2. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල තාක්ෂණික නිලධාරි
3. විද්‍යාගාර සහායක

ප්‍රධාන පුස්තකාලය සපයනු ලබන සේවාවන්

- ප්‍රධාන පුස්තකාලය මඟින් දේශීය වෛද්‍ය පීඨය සහ අනෙකුත් පීඨවලට ඒවායේ ක්ෂුද්‍රජීව විද්‍යාව, ජෛව-රසායන විද්‍යාව,හිස්ටොලොජි,කායික විද්‍යාව සහ පරිවෘත්තීය හා පෝෂණය යන පාඨමාලා ඒකක ආශ්‍රිත වැඩසටහන්වල ප්‍රායෝගික සැසි පැවැත්වීම සඳහා පහසුකම් සලසයි.
- මෙයට අමතරව, රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශ සඳහා මූලික විද්‍යාගාර විමර්ශන සහ වෙනත් පරීක්ෂණ පහසුකම් ලබාදීම මඟින් ආදායම් ඉපැයීමේ කටයුතු ද සිදු කරනු ලබයි.

විශේෂ වැඩසටහන්

- වෛද්‍ය වෘත්තිකයින් සඳහා දේශීය ඖෂධ සකස් කිරීම සඳහා සහ ජෛව වෛද්‍ය පර්යේෂකයින් සඳහා ක්ෂුද්‍රජීව පරීක්ෂණ පැවැත්වීම සඳහා ක්ෂුද්‍රජීව තත්ත්ව පාලනය පිළිබඳ කුසලතා පුහුණු වැඩමුළුව සහ මධ්‍යම විද්‍යාගාරයේ වැඩිදුර සංවර්ධනය සඳහා ආදායම් මූලාශ්‍රයක් උත්පාදනය කිරීම.
- කායවිකිත්සාව පිළිබඳ විද්‍යාපති පශ්චාත් උපාධි වැඩසටහන්වල ක්ෂුද්‍රජීව විද්‍යාව සඳහා විශේෂ ප්‍රායෝගික සැසි.
- ආයුර්වේද ආයතන කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහනේ ජෛව තාක්ෂණය පිළිබඳ විශේෂ ප්‍රායෝගික සැසි.



පර්යේෂණ විද්‍යාගාරය

හැඳින්වීම

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පර්යේෂණාගාරය, පහත සඳහන් වැඩසටහන් යටතේ උපාධි අපේක්ෂකයින් සඳහා අත්‍යවශ්‍ය ප්‍රායෝගික පුහුණුව සහ ප්‍රායෝගික පරීක්ෂණය ලබා දීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

අ. BAMS උපාධි වැඩසටහන, දේශීය වෛද්‍ය පීඨය

ආ. විද්‍යාවේදී උපාධි වැඩසටහන, දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය. දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය

ඇ. විද්‍යාවේදී උපාධි වැඩසටහන, තාක්ෂණ අධ්‍යයන අංශය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ රසායනාගාරය මඟින් උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්ගේ ප්‍රායෝගික පරීක්ෂණවලට සහාය සැලසීමට අමතරව වසර පුරා ඔවුන්ගේ පර්යේෂණ කටයුතු සඳහා ද අනුග්‍රහය දක්වයි.

පරමාර්ථ

1. නවෝත්පාදන දැනුමෙන් යුත් දක්ෂ දේශීය වෛද්‍ය උපාධිධාරීන් බිහි කිරීම සඳහා උපාධි අපේක්ෂකයින් සඳහා ප්‍රායෝගික පුහුණු සැසි පැවැත්වීම.
2. විශ්ලේෂණාත්මක රසායන විද්‍යාව සහ ශාක රසායන විද්‍යාව පිළිබඳ විෂය දැනුම උපයෝගී කර ගනිමින්, මානව දියුණුව සඳහා දේශීය වෛද්‍ය විද්‍යාවේ වැදගත්ම සංකල්ප සහ න්‍යායන්ට අදාළ පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයමින් මහා පරිමාණ පර්යේෂණ ක්‍රම හඳුන්වා දීම.
3. දේශීය වෛද්‍ය විද්‍යාවට අදාළ අද්විතීය සහ ඵලදායී ක්‍රමවේදයන්ට අදාළ පර්යේෂණ ජාතික සහ ජාත්‍යන්තර මට්ටමට ගෙනයාමට අවශ්‍ය පහසුකම් සැපයීම සහ ප්‍රජාවට අවශ්‍ය සහයෝගය ලබාදීම.
4. විද්‍යාව සහ තාක්ෂණය යන විෂයයන් ආශ්‍රිත නව දැනුම ලබාගැනීම සඳහා දේශීය කරුමාන්තකරුවන්ට පුහුණු සැසි නිර්මාණය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීම.

කාර්ය මණ්ඩල තනතුරු

සම්බන්ධීකාරක, මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය - මහාචාර්ය කේ. පී. පී. පීරිස්

කාර්ය මණ්ඩල තාක්ෂණික නිලධාරී, මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය - ඩී. පී. ජී. පී. සිරිවර්ධන මහතා

විද්‍යාගාර සහායක. මහාචාර්ය ජනිතා ඒ. ලියනගේ මධ්‍යම විද්‍යාගාරය – ඩබ්ලිව්. ජී. සී. පී. වීරසූරිය

පර්යේෂණ විද්‍යාගාරය 2024 වර්ෂයේ දී පවත්වන ලද විශේෂ වැඩසටහන්

වැඩසටහනේ නම - නිවන්ත කණුවන මහතාගේ මග පෙන්වීම සහ මහ පෙන්වීම යටතේ කෘෂිකාර්මික අංශයට වැදගත් වන ස්වයංක්‍රීය පාංශු පරාමිති පරීක්ෂණ පරීක්ෂා කිරීම සහ ක්‍රමාංකනය කිරීම සහ නිරවද්‍යතාවය සහතික කිරීම

කා සඳහා ද - ශ්‍රී ලංකා ටෙලිකොම්.













සායනික සමාකරණ පුහුණු මධ්‍යස්ථානය

හැඳින්වීම

BAMS උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් සඳහා සායනික හා ප්‍රායෝගික පුහුණුව වැඩි දියුණු කිරීම සායනික සමාකරණ රසායනාගාරයක් පිහිටුවීමේ මූලික අරමුණ වේ. ආයුර්වේද රෝහල් තුළ ප්‍රධාන සැත්කම් සහ දරු ප්‍රසූති සිදු කිරීම සඳහා පවතින පහසුකම්වල සීමාවන් සැලකිල්ලට ගෙන, **නවීන සිමියුලේටර් භාවිතය,** විශේෂයෙන් සැත්කම් සහ දරු ප්‍රසූති වැනි තීරණාත්මක ක්ෂේත්‍රවල ප්‍රායෝගික අත්දැකීම් පරතරය පියවීම සඳහා ප්‍රධාන විසඳුමක් ලෙස හඳුනාගෙන ඇත. ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමේ දී ශිෂ්‍යයින් මුහුණ දෙන වත්මන් අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, අති නවීන සමාකරණ තාක්ෂණය භාවිතා කරන සායනික සමාකරණ රසායනාගාරයක් හඳුන්වාදීම යෝජනා කෙරේ. මෙම ප්‍රවේශය සැත්කම්, දරු ප්‍රසූති සහ අනෙකුත් සායනික අවස්ථා ඇතුළු විවිධ වෛද්‍ය ක්‍රියා පටිපාටි ආරක්ෂිත සහ පාලිත පරිසරයක අනුකරණය කරමින් ශිෂ්‍යයින් සඳහා යථාර්ථවාදී, අන්තර්ක්‍රියාකාරී අත්දැකීම් ලබා දෙනු ඇත. සමාකරණ තාක්ෂණය සිසුන්ට සැබෑ ජීවිතයේ රෝගී සත්කාර සඳහා යාමට පෙර තීරණ ගැනීම, ශල්‍යකර්ම ක්‍රියාපටිපාටි සහ රෝගී කළමනාකරණය ඇතුළු ඔවුන්ගේ තාක්ෂණික කුසලතා පුහුණු කිරීමට සහ පිරිපහදු කිරීමට හැකියාව ලබා දෙනු ඇත. සායනික පරිසරයන් සඳහා ශිෂ්‍යයින් සූදානම් කිරීම සඳහා රසායනාගාරය ඉතාමත්ම වැදගත් සම්පතක් වන අතර, එමඟින් ශිෂ්‍යයින් ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රවල අවශ්‍ය නිපුණතා ලබා ගන්නා බව සහතික කරයි.

1. ප්‍රායෝගික පුහුණුව: සැබෑ රෝගීන්ට ක්ෂණික අවදානමකින් තොරව සැත්කම්, දරු ප්‍රසූති සහ අනෙකුත් සායනික ක්‍රියා පටිපාටි සිදු කිරීමේදී සිසුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලැබෙනු ඇත.
2. ආරක්ෂිත ඉගෙනුම් පරිසරය: සිමියුලේටර් මඟින් සිසුන්ට වැරදි කිරීමට, ඔවුන්ගෙන් ඉගෙන ගැනීමට සහ අඩු අවදානම් පරිසරයක ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීමට ඉඩ සලසයි.
3. සැබෑ ජීවිත අවස්ථා සඳහා සූදානම් වීම: මෙම රසායනාගාරය සිසුන්ට තම වෘත්තීය ජීවිතය තුළ මුහුණ දිය හැකි විවිධ සායනික අවස්ථා අනුකරණය කරනු ඇති අතර, වෘත්තීය භාවිතයේදී අපේක්ෂා කළ යුතු දේ පිළිබඳ යථාර්ථවාදී අවබෝධයක් ලබා දෙනු ඇත.
4. කාල-කාර්යක්ෂම ඉගෙනීම: සිසුන්ට අවශ්‍ය තරම් වාර ගණනක් ක්‍රියා පටිපාටි නැවත කිරීමට හැකි වන අතර, ඔවුන්ගේ ප්‍රවීණතාවය සහ විශ්වාසය වැඩි දියුණු වේ.

උපාධි අපේක්ෂක සායනික පුහුණුවට සහාය වීමට අමතරව, සායනික සමාකරණ විද්‍යාගාරය **ආයුර්වේද වෛද්‍ය විද්‍යාව හ ශල්‍යකර්ම උපාධියේ** (BAMS) විෂය මාලාවට ඒකාබද්ධ කෙරේ. මෙම ඒකාබද්ධතාවයට සායනික විෂයයන්හි, විශේෂයෙන් ශල්‍යකර්ම සහ දරු ප්‍රසූතියට අදාළ විෂයයන්හි සමාකරණ පාදක ඉගෙනීම ඇතුළත් වේ. මෙම මූලපිරීම හරහා, සාම්ප්‍රදායික ආයුර්වේද පිළිවෙත් සහ වඩාත් නවීන වෛද්‍ය ක්‍රියා පටිපාටි යන දෙකෙහිම කටයුතු සාර්ථකව ඉටු කිරීමට අවශ්‍ය කුසලතා සහ දැනුමෙන් සිසුන් වඩා හොඳින් සන්නද්ධ වනු ඇත. **සායනික කුසලතා සහ පුහුණු මධ්‍යස්ථානය (CSTC)** සිසුන් සඳහා ප්‍රායෝගික පුහුණු අත්දැකීම් තවදුරටත් පොහොසත් කිරීම අරමුණු කරගත් වැඩමුළු, සායනික පුහුණු කඳවුරු සහ විවිධ ආදායම් උත්පාදන ව්‍යාපෘති පැවැත්වීම සඳහා අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරනු ඇත. මෙම වැඩමුළු සහ කඳවුරු සිසුන්ට ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් සමඟ සෘජුවම සම්බන්ධ වීමට සහ අධීක්ෂණය යටතේ පුහුණුවීමට අවස්ථාවක් ලබා දෙනු ඇත.

මෙයට අමතරව, මෙම ක්‍රියාකාරකම් මඟින් අධ්‍යාපනික මූලපිරීම් පුළුල් කිරීම සහ පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා නැවත ආයෝජනය කළ හැකි වටිනා සම්පත් ජනනය කරනු ඇත. නවීන වෛද්‍ය ශිල්පීය ක්‍රමවලට නිරාවරණය වීමෙන්, ආයුර්වේදයේ ආවේණික සාම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින් සෞඛ්‍ය සේවා පිළිවෙත් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා ගැනීමෙන් මෙම හවුල්කාරිත්වයන් හරහා, ශිෂ්‍යයින්ට ප්‍රතිලාභ ලැබෙනු ඇත. **සායනික සමාකරණ රසායනාගාරය** ස්ථාපිත කිරීම ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්ව විද්‍යාලයේ BAMS සිසුන් සඳහා ප්‍රායෝගික සහ සායනික පුහුණුව සංවර්ධනය කිරීමේ සැලකිය යුතු ඉදිරි පියවරකි. නවීන සමාකරණ තාක්ෂණය විෂය මාලාවට ඇතුළත් කිරීමෙන්, විශ්ව විද්‍යාලය සිසුන්ට ඔවුන්ගේ වෘත්තීය වෘත්තීන්හි විශිෂ්ටත්වය දැක්වීමට අවශ්‍ය කුසලතා සහ අත්දැකීම් ලබා දීම අරමුණු කරයි. අඛණ්ඩ වැඩමුළු, පුහුණු කඳවුරු සහ රෝහල් සමඟ හවුල්කාරිත්වයන් සමඟ ඒකාබද්ධව, මෙම මූලපිරීම හරහා ආයුර්වේද අධ්‍යාපනයේ අනාගතයට සහාය වන පරිපූර්ණ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කරනු ඇත.

දැක්ම

ප්‍රවීණ සෞඛ්‍ය සේවා වෘත්තිකයන් බවට පත්වීම සඳහා ප්‍රායෝගික අත්දැකීම්, විශ්වාසය සහ විශේෂඥතාවයෙන් සිසුන් බලගන්වන අන්තර්ජාතික මට්ටමේ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කරන නව්‍ය සහ පරිපූර්ණ සායනික පුහුණුව ලබා දීමේ ප්‍රමුඛතම විශිෂ්ටත්ව මධ්‍යස්ථානයක් වීම.

මෙහෙවර

උපාධිධාරීන් ආයුර්වේද සහ නවීන වෛද්‍ය විද්‍යාව යන ක්ෂේත්‍ර දෙකෙහිම වෘත්තීය කටයුතුවල නියැලීම සඳහා විශ්වාසයෙන්, දක්ෂතාවයෙන් සහ වෘත්තීය පුහුණුව සඳහා සූදානම් බව සහතික කරමින්, ශිෂ්‍යයින්ගේ ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කරන, අන්තර්-විෂය අධ්‍යාපනය ප්‍රවර්ධනය කරන සහ සෞඛ්‍ය සේවා ආයතන සමඟ සහයෝගීතාවය වැඩිවර්ධනය කරන උසස් තත්ත්වයේ, සමාකරණ පාදක සායනික පුහුණුවක් ලබා දීම.

පරමාර්ථ

1. උසස් සමාකරණ තාක්ෂණයන් හරහා සිසුන්ට ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම, සැත්කම්, දරු ප්‍රසූති සහ අනෙකුත් වෛද්‍ය ක්‍රියා පටිපාටිවල ඔවුන්ගේ ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කිරීම
2. සාම්ප්‍රදායික ආයුර්වේද පිළිවෙත් නවීන වෛද්‍ය ශිල්පීය ක්‍රම සමඟ ඒකාබද්ධ කිරීම සහ ඒ හරහා ශිෂ්‍යයින්ට සෞඛ්‍ය සේවා පද්ධති දෙකම පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීම.
3. සැබෑ රෝගීන්ට අවදානමකින් තොරව සායනික ක්‍රියා පටිපාටි ප්‍රගුණ කිරීමට සිසුන්ට පාලිත අවකාශයක් නිර්මාණය කිරීම සහ ශිෂ්‍යයින්ගේ කුසලතා ඉහළ නංවා ගැනීම සඳහා නැවත නැවත පුහුණුවීම් කිරීමට ඉඩසැලසීම.
4. ආයුර්වේදය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, දේශීයව සහ ජාත්‍යන්තරව සෞඛ්‍ය සේවා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම හරහා සායනික පුහුණුව සඳහා පිළිගත් මධ්‍යස්ථානයක් බවට පත්වීම.

කාර්ය මණ්ඩල තනතුරු

ඍජුව පත් කරන ලද කාර්ය මණ්ඩලය

1. සම්බන්ධීකාරක: වෛද්‍ය එච්. පී. වක්කුඹුර මහත්මිය, කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය
2. කාර්ය භාර තාක්ෂණික නිලධාරී: එම්. කේ. ඩී. කේ. අත්තනායක මිය

අංශ ප්‍රධානීන්

3. ENT රෝග විනිශ්චය අංශය: මහාචාර්ය කේ. පී. පී. පීරිස් මිය, ශල්‍යශාලක්‍ය අධ්‍යයන අංශය
4. වස්ති ක්‍රියාපටිපාටි අංශය: මහාචාර්ය ඒ. ඒ. පී. පුෂ්පකුමාර, ශල්‍යශාලක්‍ය අධ්‍යයන අංශය
5. නාරිවේද, මාතෘ සහ ළමා රෝග පුහුණු අංශය: වෛද්‍ය එච්. පී. වක්කුඹුර මිය සහ වෛද්‍ය එම්. නුවන් සම්පත් මාරසිංහ, කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය
6. හෘද සහ පෙණහළු ශබ්ද අංශය සමඟ වැඩිහිටි ශ්වසන මාර්ග සහ හෘදය නැවත පණගැන්වීමේ ක්‍රියාවලිය (CPR) පුහුණුකරු: වෛද්‍ය ඩබ්ලිව්. ජේ. වික්‍රමාරච්චි මිය, චිකිත්සා අධ්‍යයන අංශය
7. මැහුම් පුහුණු සහ කැනිටරීකරණ අංශය: වෛද්‍ය බී. එස්. ආර්. පෙරේරා මිය, ශල්‍යශාලක්‍ය අධ්‍යයන අංශය

බාහිර කාර්ය මණ්ඩලය

8. වෛද්‍ය උපාලි මාරසිංහ, විශ්‍රාමික ප්‍රසව සහ නාරිවේද විශේෂඥ වෛද්‍ය
9. වෛද්‍ය රොෂානි කරුණාරත්න, නිර්වින්දන විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය නිලධාරී, උපදේශක යුරෝපීය පුනර්ජීවන කවුන්සිලය-උසස් ජීවිත සහාය (ERC-ALS)
10. වෛද්‍ය මුදිතා නිස්සංක, හදිසි වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී, ජාතික රෝහල, කොළඹ

විද්‍යාගාරය 2024 වර්ෂයේ දී පැවැත්වූ විශේෂ වැඩසටහන්

වැඩසටහනේ නම	සහභාගීවූවන්	ප්‍රතිලාභ
කුසලතා පුහුණු වැඩමුළුව හදිසි අවස්ථා රැකවරණ කළමනාකරණය - මූලික ජීවිතාධාර සහ හෘදය නැවත පණගැන්වීමේ වැඩසටහන - 2024 ශ්‍රී ලංකාවේ නිර්වින්දන වෛද්‍යවරුන්ගේ පුනර්ජීවන කවුන්සිල විද්‍යාලය සහ තීව්‍ර වෛද්‍යවරුන් අතර සායනික සමාකරණ පුහුණු මධ්‍යස්ථානයේ (CSTC) ඒකාබද්ධ ව්‍යාපාරය. සම්පත්දායකයින්; **වෛද්‍ය නිල්මිණි විජේසූරිය (MD, FCARCSI, FRCA),** ශ්‍රී ලංකා පුනර්ජීවන කවුන්සිලයේ සභාපති ශ්‍රී ලංකාවේ නිර්වින්දන වෛද්‍යවරුන්ගේ සහ තීව්‍ර වෛද්‍යවරුන්ගේ විද්‍යාලය, ERC සහ UK ALS උපදේශක, හදවතක් නැවත ආරම්භ කිරීම සහ දරුවන් බේරා ගැනීමේ ජීවිත - ශ්‍රී ලංකා ව්‍යාපෘති සම්බන්ධීකාරක වෛද්‍ය මුදිත නිස්සංක, හදිසි වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරී, ජාතික රෝහල, කොළඹ	01. මට්ටම V/ අධ්‍යයන වාරය II **104** 2020/2021 අධ්‍යයන වර්ෂයේ **BAMS ශිෂ්‍යයින්** විෂය කේතය සහ නම: CHKA 52153 (චිකිත්සා) සහ SSSU 52054 (ශල්‍යතන්ත්‍ර) – 2024 අප්‍රේල් 04 සහ 24 02. GWUIM හි දේශීය වෛද්‍ය පීඨයේ ශාස්ත්‍රාලිකයින් 20 දෙනෙක් සඳහා - 2024 මාර්තු 28	• හදිසි වෛද්‍ය අවස්ථාවන්ට විශ්වාසනීයව ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය දැනුම සහ කුසලතා අත්කර ගැනීම. • සමාකරණය පාදක පුහුණු අභ්‍යාස හරහා ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම. • හදිසි අවස්ථාවල දී කණ්ඩායම් වැඩ, සන්නිවේදනය, සහ නායකත්ව කුසලතා වැඩිදියුණු කිරීම. • හදිසි අවස්ථා සත්කාර කළමනාකරණය පිළිබඳ යාවත්කාලීන කළ මාර්ගෝපදේශ සහ විශිෂ්ට පරිවයන් පිළිබඳ දැනුම අලුත්කර ගැනීම. • සෞඛ්‍යසත්කාර සපයන්නන් සඳහා මූලික ජීවිත ආධාර (BLS) වඩා හොඳ රෝගී ප්‍රතිඵල ලබා දෙන විවේචනාත්මක චින්තනය සහ ගැටළු විසඳීමේ කුසලතා වර්ධනය කිරීම සඳහා අවස්ථා පාදක ප්‍රවේශයක් භාවිතා කරයි. • වැඩමුළුව සම්පූර්ණ කිරීමෙන් පසුව සහභාගීත්වය සඳහා සහතිකපත්‍රයක් ලැබීම.







18.8 ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE)

හැඳින්වීම

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය (CGEE) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයින් අතර පුරුෂයින් සහ ස්ත්‍රීන් අතර එකමුතුව, සහයෝගය, අන්‍යෝන්‍ය ගෞරවය පෝෂණය කිරීමට කැපවී සිටී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) සහ උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව පිළිබඳ UGC ස්ථාවර කමිටුවේ සෘජු විධානය යටතේ ස්ථාපිත කර ඇති ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ මෙම මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලයේ සියලුම සාමාජිකයින් සඳහා හිතකර, ස්ත්‍රී-පුරුෂ සාධාරණ වැඩ කරන සහ ඉගෙනුම් පරිසරයක් සහතික කරයි.

දැක්ම

විශ්වවිද්‍යාලයේ සියලුම සාමාජිකයින්ට හිතකර, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සහතික කළ, සහ ඉගෙනුම් පරිසරයක් ඇති බවට සහතික කිරීම.

පරමාර්ථ

- ස්ත්‍රී-පුරුෂභාවය ආශ්‍රිත සංකල්ප සහ කරුණු පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රජාව අතර දැනුවත්භාවය ඇති කිරීම.
- ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සහ යුක්තිය පිළිබඳ පුහුණුව ලබාදීම
- ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී-පුරුෂ අසමානාත්මතාව, අයුක්තිය සහ ස්ත්‍රී-පුරුෂභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය සහ නවක වධය වැළැක්විය හැකි ක්‍රම සහ විධි හඳුනා ගැනීම.
- අදාළ කුසලතා ගොඩනැංවීම මඟින් ස්ත්‍රී-පුරුෂ අසමානාත්මතාව, අයුක්තිය සහ ස්ත්‍රී-පුරුෂභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය සහ නවක වධය වැළැක්වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාව සවිබල ගැන්වීම.
- ලිංගික සහ ස්ත්‍රී-පුරුෂභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය සහ නවක වධය පිළිබඳව විමසීම සහ වැරදිකරුවන්ට එරෙහිව විනය පියවර ගැනීමටත් වින්දිතයින්ට පහසුකම් සැලසීමටත් විශ්වවිද්‍යාල කවුන්සිලයට යෝජනා ඉදිරිපත් කිරීම

කාර්ය මණ්ඩල තනතුරු

අධ්‍යක්ෂ – වෛද්‍ය එම්. ඩී. ජේ. එන්. විජේසිංහ

ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය/සමානාත්මතාව සඳහා මධ්‍යස්ථානය 2024 වර්ෂයේ දී පවත්වන ලද විශේෂ වැඩසටහන්

වැඩසටහනේ නම	සහභාගීවූවන්
නවක වධය වැළැක්වීම පිළිබඳව දැනුවත් කිරීමේ සැසිය, ශිෂ්‍ය දිශානති වැඩසටහන	1 වැනි වසර ශිෂ්‍යයින්ගේ දෙමාපියන්, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය
නවක වධය වැළැක්වීම සහ විශ්වවිද්‍යාලයේ හදිසි ඇමතුම් දුරකථන අංකය පිළිබඳව දැනුවත් කිරීමේ සැසිය	ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්, දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය

18.9 සමාජ සංහිඳියා මධ්‍යස්ථානය (SRC)

හැඳින්වීම

සමාජ සංහිඳියා මධ්‍යස්ථානය (SRC) ප්‍රාදේශීය අනන්‍යතා වෙනුවට ශ්‍රී ලාංකික හැඟීම දිරිමත් කරන අතර වෙනස් ආගම් සහ ජනවාර්ගික අතර අවබෝධය ප්‍රවර්ධනය කිරීම පිණිස ස්ථාපිත කර ඇත.

හැඳින්වීම

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ජනාධිපති කාර්යාලයේ ඒකාබද්ධ මූලපිරීමක් යටතේ දියත් කරන ලද මෙම සමාජ සංහිඳියා මධ්‍යස්ථාන (SRC) පටු අනන්‍යතාවන්ට වඩා ශ්‍රී ලාංකික හැඟීම ප්‍රවර්ධනය කරමින්, විවිධ ආගම් සහ ජනවාර්ගිකත්වයන් පිළිබඳ අවබෝධය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාලවල ස්ථාපිත කර ඇත.

ප්‍රතිපත්ති දැක්ම:

සාමාජීය සහ සංස්කෘතික ක්‍රියාකාරකම් හරහා සමාජ සංහිඳියාව සහ එකතුමුතුකම ප්‍රවර්ධනය කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රජාව අතර පර්යේෂණ නිමැවුම බෙදා හැරීම.

ප්‍රතිපත්ති මෙහෙවර:

ජාතික සමගිය හා සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා සමාජ, සංස්කෘතික කටයුතු හා පර්යේෂණ කටයුතුවල නියැලීම තුළින් සමාජ සංහිඳියාව හා සහජීවනය සැපයීමේ දී විශ්වවිද්‍යාල ප්‍රජාවට විශිෂ්ටත්වය අත්කර ගැනීමට හැකියාව ලබා දීම.

පරමාර්ථ

- සංහිඳියා සහ සාමය ගොඩනැගීමේ ක්‍රියාවලීන් හි නිතරවීම පිණිස ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම.
- සංහිඳියාව අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස ප්‍රවර්ධනය කිරීම.
- දිවයිනේ පුළුල් සහ පශ්චාත්-ගැටුම් ගතිකත්වය පිළිබඳ දැනම සහ පර්යේෂණ සඳහා දායකත්වය දැක්වීම.
- විවිධ විශ්වවිද්‍යාල අතර බාහිර සහ අභ්‍යන්තර හවුල්කාරත්වය සහ අන්තර්ක්‍රියාකාරීත්වය සඳහා මාර්ගගත/නොබැඳි වේදිකාවන් ගොඩනැගීම
- ද්වේෂය, අවිචාරක මතය, සැකය සහ අවිශ්වාසය යනාදී අංග මුලිනුපුටා දැමීම පිණිස පුද්ගලයින්ට දැනුම ලබා දීම සහ ප්‍රවර්ධනය කිරීම
- කාර්ය මණ්ඩලයේ සහ ශිෂ්‍යයින්ගේ විවිධ කාණ්ඩ අතර සුහද සබඳතා දිරිමත් කිරීම.

කාර්ය මණ්ඩල තනතුරු

අධ්‍යක්ෂ – වෛද්‍ය ජී. කේ. ජයතිලක

කළමනාකරණ කමිටුවට සිදු කළ සෙනෙට් සභාවේ නම් කළ නිලධාරී – වෛද්‍ය (පූජ්‍ය) මාදුරුඔයේ ධම්මිස්සර ස්වාමීන් වහන්සේ

කළමනාකරණ කමිටුවට සිදු කළ සෙනෙට් සභාවේ නම් කළ නිලධාරී - වෛද්‍ය නයනි දරණගම

පීඨ සම්බන්ධීකාරක – FISSMS - චින්තානී සෙනෙවිරත්න මිය

පීඨ සම්බන්ධීකාරක – FIHST- අනුත්තරා ඉන්දීවරී මිය

පීඨ සම්බන්ධීකාරක – FIM - චතුරිනි ප්‍රනාන්දු මිය

සමාජ සංහඳියා මධ්‍යස්ථානය 2024 වර්ෂයේ දී පවත්වන ලද විශේෂ වැඩසටහන්

වැඩසටහනේ නම	සහභාගීවූවන්
වනි විෂා 2024	FIHST ශිෂ්‍යයින්
පන්දම් රෑ	FIHST ශිෂ්‍යයින්
පොත් දන්සැල	FIHST ශිෂ්‍යයින් සහ මහජනතාව
තෛපොංගල් උත්සව සැමරුම	FISSMS/FIHST ශිෂ්‍යයින්
අන්තර් දෙපාර්තමේන්තු ක්‍රිකට් තරඟාවලිය	FIHST ශිෂ්‍යයින්
ප්‍රාරම්භ 2024	FIHST පළමු වසරේ ශිෂ්‍යයින්
විවිධත්වය සමඟ ජීවත්වීමට ඉගෙනීම වැඩමුළුව	FISSMS ශිෂ්‍යයින්
ඉෆ්තාර් වැඩසටහන	FISSMS
IMR කුසලතා දැක්ම	දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශයේ ශිෂ්‍යයින් - FIHST
සිංහල දෙමළ අලුත් අවුරුදු උත්සවය	FIM/FIHST/FISSMS
ශ්‍රී පාදය වෛද්‍ය කඳවුර	FIM
වෙසක් දන්සැල	FIM
ජාතික තරුණ සම්මේලනයේ GWUIM ශිෂ්‍යයින්ගේ සහභාගීත්වය	FISSMS/FIHST
ක්ෂේත්‍ර පර්යේෂණ වාර්තාව: සමාජ ඒකාබද්ධතාවය සහ සංහිඳියාව පිළිබඳ GWUIM ශිෂ්‍යයින්ගේ සහභාගීත්වය	FISSMS/ FIHST
සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාව	FIM
දීපවාලී උත්සවය	FISSMS
නත්තල් උත්සව සැමරුම	FISSMS

වෙනත් තොරතුරු

සමාජ සංහිඳියා මධ්‍යස්ථානය ස්ථාවර කමිටු රැස්වීම්වල දී ප්‍රකාශ කළ පරිදි, නිසි ප්‍රතිසන්ධාන මධ්‍යස්ථානයක් පිහිටුවීමේ දී අප යම් ප්‍රායෝගික දුෂ්කරතාවලට මුහුණ දෙමින් සිටී. අධ්‍යක්ෂවරයා දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය පිහිටා ඇති බණ්ඩාරගම/ඇඹුල්දෙණිය පිහිටි විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රයේ සිට පැය කිහිපයක් එපිටින් සිටීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. මෙයට අමතරව, මෑතක දී පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් වීම, ඉඩකඩ සහ ප්‍රතිපාදන වෙන් කිරීම ආදිය ද ගැටලුසහගත වී ඇත.

කෙසේ වුව ද, ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය අතර සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සඳහා තමන්ගේම සංස්කෘතික උත්සව සහ වෙනත් වැඩසටහන් සංවිධානය කිරීමට සියලුම පීඨයන් දිරිමත් කිරීමෙන් අනතුරුව 2024 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංස්කෘතික උත්සව සැමරීම සඳහා පීඨ තුන විවිධ වැඩසටහන්, සැමරුම් සහ උත්සව පවත්වා ඇත.

කෙසේ වුව ද, වවුනියාව විශ්ව විද්‍යාලයේ දී පැවති 2024 ජාත්‍යන්තර තරුණ දිනය සැමරීම සඳහා රටේ සියලුම ජාතික විශ්ව විද්‍යාලවල සහභාගීත්වයෙන් ජාතික මට්ටමේ තරුණ සමුළුවකට GWUIM සිසුන් සහභාගි වීම 2024 වසරේ කැපී පෙනෙන සිදුවීම විය. මෙයින් පසුව, GWUIM වෙනස් කිරීමේ නියෝජිතයන් කිහිප දෙනෙකු ක්ෂේත්‍ර පර්යේෂණ සඳහා සහභාගී වූ අතර එහි ප්‍රතිඵලය කොළඹ පැවති උත්සවයක දී අපගේ ශිෂ්‍යයෙකු විසින් ඉදිරිපත් කරන ලද UGC/USAID ප්‍රකාශනයක පත්‍රිකාවක් ලෙස ඇතුළත් කරන ලදී.

18.10 තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA)

හැඳින්වීම

තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA) 2021 වර්ෂයේ දී විශ්වවිද්‍යාලය ආරම්භ කිරීමත් සමඟම ස්ථාපනය කරන ලදී. විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවක් මගින් පාලනය වන තත්ත්ව සහතික මධ්‍යස්ථානය, විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන්, පර්යේෂණ සහ සේවාවන්හි ගුණාත්මකභාවය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කරන තත්ත්ව සහතික කිරීමේ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමට කැපවී සිටී. විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කවුන්සිලයේ (QAC) විධාන යටතේ ශ්‍රී ලංකා ජාතික තත්ත්ව සහතික රාමුවට (SLQF) අනුකූල වන පරිදි ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ මූලික වගකීම වේ.

ආයතනය තුළ ගුණාත්මක ප්‍රමිතීන් පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් සහතික කිරීම සඳහා මෙම මධ්‍යස්ථානය මඟින් පීඨ අභ්‍යන්තර තත්ත්ව සහතික කුටි (IQACs) සමඟ සමීප සහයෝගයෙන් කටයුතු කරයි. මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වන්නේ: අධ්‍යයන දෙපාර්තමේන්තු අතර යහපත් පිළිවෙත් හඳුනා ගැනීම සහ බෙදා ගැනීම පහසු කිරීම සම්බන්ධීකරණය කිරීම, ආයතනික සහ වැඩසටහන් සමාලෝචන සඳහා ස්වයං-ඇගයීම් වාර්තා (SER) සකස් කිරීම මෙහෙයවීම, සමාලෝචන වාර්තාවල නිර්දේශිත පසු විපරම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සහ මෙම නිර්දේශ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ප්‍රගතිය නිරීක්ෂණය කිරීම ඇතුළත් වේ. මෙම කටයුතු හරහා සියලුම පාර්ශවකරුවන් සඳහා උසස් ප්‍රමිතියේ අධ්‍යාපනික අත්දැකීමක් ලබා දීමට තත්ත්ව සහතික මධ්‍යස්ථානය කැපවී සිටී.

දැක්ම

තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ අරමුණ වන්නේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ සියලුම අධ්‍යයන හා අනධ්‍යයන ක්‍රියාකාරකම්වල ගුණාත්මකභාවය අඛණ්ඩව වැඩිදියුණු කිරීමට උත්සාහ කරන සංස්කෘතියක් නිර්මාණය කිරීමයි.

මෙහෙවර

අ. විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන සැපයීමේ විශිෂ්ඨ භාවිතයන් අභ්‍යන්තරීකරණය කිරීම සහ තත්ත්ව සහතිකය (QA) පහසු කිරීම සඳහා ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

ආ. විශ්වවිද්‍යාලය තුළ ගුණාත්මක සංස්කෘතියකට මඟ පාදන තිරසාර ගුණාත්මක වැඩිදියුණු කිරීමට සහාය වීම.

පරමාර්ථ

අ. විශ්වවිද්‍යාලය තුළ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීම.
ආ. විශ්වවිද්‍යාලයේ බාහිර සමාලෝචනයට පහසුකම් සැලසීමේ දී තත්ත්ව සහතික සහ ප්‍රතිඵල කවුන්සිලය (Quality Assurance and Accreditation Council) සහ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය.
ඇ. ආයතනික සමාලෝචනය සඳහා ස්වයං-ඇගයීම් වාර්තාව සකස් කිරීමේ දී උපකුලපතිවරයාට සහායවීම.
ඈ. වැඩසටහන් සහ විෂය සමාලෝචනය සඳහා ස්වයං-ඇගයීම් වාර්තා සකස් කිරීමේ දී විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශවලට මඟපෙන්වීම.
ඉ. විෂය, වැඩසටහන් හෝ ආයතනික සමාලෝචන වාර්තාවල නිර්දේශ කරන ඇති පසුවිපරම් කටයුතු ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සහ ඒවායේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම.
ඊ. විශිෂ්ට ව්‍යවහාර බෙදාහදා ගැනීම සඳහා සහ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල තත්ත්ව සහතික ඒකක සමඟ සම්බන්ධීකරණය.

කාර්ය මණ්ඩල තනතුරු

තත්ත්ව සහතික කවුන්සිලයේ අධ්‍යක්ෂ – වෛද්‍ය නයනි දරනගම

තත්ත්ව සහතික කවුන්සිලයේ ලේකම් (අර්ධ කාලීන)

තත්ත්ව සහතික මධ්‍යස්ථානය වර්ෂය 2024 දී පැවැත් වූ විශේෂ වැඩසටහන්

පීඨ	දේශීය වෛද්‍ය පීඨය			
වැඩමුළු	අංකය	අධ්‍යයන අංශය/ඒකකය	දිනය	ක්‍රියාකාරකම
ශිෂ්‍යයින්	3	ශල්‍යශාලකර්ම අධ්‍යයන අංශය	17.07.2024	ඇසේ සුදු රෝගය පිළිබඳ වැඩමුළුව (මාර්ගගත)
			21.08.2024	ග්ලූකෝමා සහ දියවැඩියා රෙටිනොපති
		දේශීය චිකිත්සා අධ්‍යයන අංශය දේශීය චිකිත්සා අධ්‍යයන අංශය	6.12. 2024	ප්‍රථමාධාර පිළිබඳ වැඩමුළුව ශ්‍රී ලංකාවේ ශාන්ත ජෝන් ගිලන් හමුදා සංගමයේ වැඩසටහන් නිලධාරීන් සහ බලසේනාව
ශාස්ත්‍රාලිකයින්	1	පීඨ විෂයමාලා සංවර්ධන කමිටුව	09.01.2024	BAMS විෂයමාලා සංශෝධන වැඩමුළුව
ක්ෂේත්‍ර අධ්‍යයන ප්‍රායෝගික පරීක්ෂණ	6	ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය	10/11.01 04/05. 03 5/6.12.2024	අනුරාධපුරය, පොලොන්නරුව
		ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය	31.01.2024 01.02.2024	මලිත ඔසු උයන, හල්දුම්මුල්ල
		චිකිත්සා අධ්‍යයන අංශය	28.01.2024 29.01.2024 18.02.2024 23.11.2024 27.11.2024 30.11.2024	පශ්චාත් මරණ පරීක්ෂණය පිළිබඳ ප්‍රායෝගික සැසිය, ජාතික රෝහල, නුවර පශ්චාත් මරණ පරීක්ෂණය පිළිබඳ ප්‍රායෝගික සැසිය, ශික්ෂණ රෝහල, පේරාදෙණිය
පුහුණු	3	දේශීය චිකිත්සා අධ්‍යයන අංශය	11.03.2024 - 22.03.2024 03.06.2024- 14.06 2024	බාහිර සායනික පුහුණුව
		ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය	03.06.2024 – 14.06.2024	බාහිර සායනික පුහුණුව
ජාතික සේවා	5	ආයුර්වේද මූලධර්ම අධ්‍යයන අංශය	23.11.2024 27.11.2024 30.11.2024	පශ්චාත් මරණ පරීක්ෂණය පිළිබඳ ප්‍රායෝගික සැසිය, ශික්ෂණ රෝහල, පේරාදෙණිය
		කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයන අංශය	24.02.2024 16.03.2024	ආයුර්වේද රූපලාවණ්‍ය ඩිප්ලෝමාව (1 වැනි ශිෂ්‍ය කණ්ඩායම) (2 වැනි ශිෂ්‍ය කණ්ඩායම), සෞඛ්‍ය කඳවුර
		පීඨ පර්යේෂණ කමිටුව	23.01.2024	ප්‍රථම උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය
වෙනත්	1	පීඨය/ අධ්‍යයන අංශය	06.08.2024	ශිෂ්‍ය දිශානතික වැඩසටහන 2022/2023







පීඨය	දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය			
වැඩමුළු	අංකය	අධ්‍යයන අංශය/ඒකකය	දිනය	ක්‍රියාකාරකම
ශිෂ්‍යයින්	18	දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය (IMR)	09.2024 09.09.2024 18. 01. 2024 19.09.2024	ජෛව පොහොර සැකසීම පිළිබඳ වෙබ්සම්මන්ත්‍රණය 'දේශීය වෛද්‍ය විද්‍යාවේ ව්‍යවසායකත්වයට ඉදිරි මාවත' යන මාතෘකාව යටතේ ආරාධිත කථිකයෙකු 'අණුක ජීව විද්‍යාව - ජාන තාක්ෂණයේ මූලික මෙවලම් සහ ශිල්පීය ක්‍රම' යන මාතෘකාව යටතේ වැඩමුළුව ජාතික කෞතුකාගාරය සමඟ "ඖෂධීය ශාක ජෛව විවිධත්වය සංරක්ෂණය කිරීම: ශාකාගාර ශිල්පීය ක්‍රම සහ හොඳම පිළිවෙත් සඳහා මාර්ගෝපදේශයක්" යන මාතෘකාව යටතේ වෙබ්සම්මන්ත්‍රණය

		තාක්ෂණ අධ්‍යයන අංශය	08.01.2024 20.01.2024 02.09.2024 10.12.2024	වෙබ් සංවර්ධනය පිළිබඳ වැඩමුළුව සම්මුඛසාකච්ඡා සැසිය ඡායාරූපකරණය පිළිබඳ වැඩමුළුව IoT වැඩමුළුව -TAS ජෛවතාක්ෂණයේ මූලික ශිල්පක්‍රම කැළණිය විශ්වවිද්‍යාලය
		දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය (IHS)	13.08.2024 29.08.2024 09.01.2024 03.05.2024 05.12.2024 12.12.2024 16.08.2024 11.06.2024 11.11.2024 08.01.2024 12.2024 06.12.2024	ඩිජිටල් ඡායාරූපකරණය පිළිබඳ වැඩමුළුව ස්වභාවික සම්පත්, පරිසර සංචාරක කර්මාන්තය සහ තිරසාරකත්වය පිළිබඳ වැඩමුළුව බෞද්ධ භාවනා පුහුණුව පිළිබඳ වැඩමුළුව යෝග පිළිබඳ වෘත්තීයභාවය වැඩමුළුව ප්‍රසිද්ධ දේශන පැවැත්වීමේ කුසලතා දියුණු කර ගැනීම පිළිබඳ වැඩමුළුව ආයුර්වේද හෝටල, නවාතැන් සහ රැකියානියුක්තිය පිළිබඳ ශ්‍රී ලංකාවේ නෛතික පසුබිම පිළිබඳ වැඩමුළුව. චාරිකා මහපෙන්වීමේ න්‍යායාත්මක සහ ප්‍රායෝගික වැඩමුළු මාලාව “යෝග භාවනා පුහුණුව” පිළිබඳ වැඩමුළුව ස්පා කළමනාකරණය වැඩමුළුව ඉගෙනීම අත්දැකීමක් බවට පරිවර්තනය කිරීම 'ස්පා සහ සුවතා කළමනාකරණය පිළිබඳ වැඩමුළුව
ශාස්ත්‍රාලිකයින්	3	අභ්‍යන්තර තත්ත්ව සහතික කුටිය - FIHST	26.04.2024	උසස් අධ්‍යාපනය ඉහළ නැංවීම: විෂයමාලා සංශෝධනය පිළිබඳ දැනුවත් කිරීම පිළිබඳ වැඩමුළුව - අභ්‍යන්තර තත්ත්ව සහතික කුටිය මඟින් FIHST
		තාක්ෂණ අධ්‍යයන අංශය	19.12.2024 20.12.2024 23.11.2024 - 14.12.2024	දින 2ක නේවාසික වැඩමුළුව - වෛද්‍ය උපකරණ දියුණු කිරීම සහ නියාමනයට මාර්ග සිතියම - වෛද්‍ය බන්දුල විජේවිසින් CADE: ඩිජිටල් සවිබල කරවීම සඳහා සිවිල් සමාජ එකමුතුව (Civil Society Alliance for Digital Empowerment) - අන්තර්ජාල පාලනය සහ ඩිජිටල් අයිතිවාසිකම් පිළිබඳ සති 4ක සහයෝගීතාව
ක්ෂේත්‍ර අධ්‍යයන ප්‍රායෝගික පරීක්ෂණය	13	දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය	30.08.2024 08.2024 02.2024 12.2024 09. 2024 08.2024	ශාක වෛරස දර්ශක මධ්‍යස්ථානය මොරිසන් ඖෂධ නිශ්පාදන සහ පර්යේෂණ මධ්‍යස්ථානය ජාතික පැලෑටි නිරෝධායන සේවාව සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය, කොටදෙණියාව HPLC උපකරණ සැකසීම කැළණිය විශ්වවිද්‍යාලය බෙලිපොල ඇනලොග් වනාන්තරය
		තාක්ෂණ අධ්‍යයන අංශය	10.01.2024 23.08.2024	ඒකලාභී අපජල කළමනාකරණ කෘත්‍රිම ශල්‍යකර්ම සහ විකලාංග පාසල

			18.09.2024 04.10.2024 27.11.2024 16.12.2024 සහ 21.12.2024	SLINTEC IFS ශ්‍රී ලංකා කෝඩ්ජෙන් අන්තර්ජාතික ජංගම යෙදවුම් වැඩමුළුව
		දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය	05.03.2024 29.07.2024 09.02.2024	BIA සෞඛ්‍ය සංචාරක ව්‍යාපාරය සඳහා ගුවන් සේවා විදාතා මඟින් පවත්වන ලද ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීමේ සැසිය.
පුහුණුවීම්	8	දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය	09.2024- 12.2024 09.09.2024	තායිලන්තයේ මේ ෆා ලුආන්ග් විශ්ව විද්‍යාලයේ විදේශ සීමාවාසික පුහුණු වැඩසටහන ශාක ව්‍යාධි විද්‍යාව පිළිබඳ කුඩා රසායනාගාර ඉදිරිපත් කිරීමේ මාලාවක්
		තාක්ෂණ අධ්‍යයන අංශය	24.01.2024 02.02.2024 10.09.2024 13.09.2024	කුඩා ප්‍රශ්න විචාරාත්මක තරඟයක් පැවැත්වීම ජෛව වෛද්‍ය ව්‍යාපෘති ප්‍රදර්ශනය කුඩා ප්‍රශ්න විචාරාත්මක තරඟයක් පැවැත්වීම PCB නිර්මාණය සහ ප්‍රතිසම පරිපථ නිර්මාණය
		දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය	13.09.2025 13.09.2026	සිසුන් විසින් සිදු කරන ලද ශාක අභ්‍යාස පුහුණුව ජාතික සමාජ සංහිඳියා වැඩසටහන සඳහා සිසුන් සහභාගී වේ
ජාතික සේවා	8	දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශය	09.2024	ශාක පටක රෝපණ පර්යේෂණ මධ්‍යස්ථානය සමඟ සහයෝගයෙන් පටක රෝපණ ශිල්පීය ක්‍රම පිළිබඳ දෙදින වැඩමුළුව
		තාක්ෂණ අධ්‍යයන අංශය	01.11.2024	ජෛව වෛද්‍ය උපකරණ පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව - සම්මාන ප්‍රදානෝත්සවය
		දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය	05.04.2024 09.05.2024 06.2024- 11.2024 12.12.2024 01/07-2024 ongoing	භාරත් ලංකා යෝග උළෙලේ සහයෝගීතාවය පිළිබඳ සාකච්ඡාව ආර්ට් ඔෆ් ලිවිං ශ්‍රී ලාංකිකයා සමඟ සහයෝගීතාවය පිළිබඳ සාකච්ඡාව මීගමුවෙහි කැබානා 30 ක ආයුර්වේද සුවතා හෝටලයක් ඉදිකිරීම පිළිබඳ උපදේශන ව්‍යාපාර ව්‍යාපෘතිය KOT සහ SLTDA විසින් හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය සහ සීගිරිය සංචාරක සංවර්ධනයන් ස්ථාපිත කිරීමේ සාර්ථක ආරම්භය සඳහා දායක විය පිළිකුත්තුව, මාලිගාතැන්න සහ අත්තනගල්ල සංචාරක පොකුරු සංවර්ධනය සහ මෙහෙයුම් සඳහා සහභාගී වීම පිළිබඳ සංචාරක මණ්ඩලය සමඟ සහයෝගීතාවය.

වෙනත්	7	පීඨ කාර්යාලය	21.08.2024 26.08.2024 25.08.2024	ශිෂ්‍ය දිශානති වැඩසටහන 2022/2023 ලින්කන් අන්තර්ජාතික බහුවිෂය සම්මන්ත්‍රණය 2024
		තාක්ෂණ අධ්‍යයන අංශය	30.08.2024 13.12.2024	තාක්ෂණික දියුණුව සමාජය - සමාරම්භක ප්‍රදර්ශනය - මිනි ස්කොප් Scop 2024
		දේශීය සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය	20.10.2024 13.09.2024 06.2024	ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී පන්දම් රූ සංස්කෘතික උත්සව වැඩසටහන ලෝක සංචාරක දින සැමරුම, පරිසර කාව ඡායාරූප තරඟය 2024 පළමු ආසියානු යෝග ශූරතාවලියේදී සම්මාන කිහිපයක් දිනා ගන්නා ලදී.
		GWUIM හි වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය	06.12.2024	"ඔබේ සමබරතාව සොයාගැනීම" පිළිබඳ වැඩමුළුව







TAS


N.W.S. SUHARTHI
YASODARA DEVI BALIKA MAHA VIDYALAYA
GAMPAHA


OPENING CEREMONY
Technological Advancement Society
Department of Technology - GWUIM
TAS




SCAN ME
Register now >
SUSTAINABLE JOURNEYS. TIMELESS MEMORIES.
ECO LENS
PHOTOGRAPHY
COMPETITION
TOURISM , PEACE & SUSTAINABILITY
Submission Deadline
31st August 2024
Open For ; Undergraduates & School Students
BSC (HONS) IN HEALTH TOURISM & HOSPITALITY MANAGEMENT
DEPARTMENT OF INDIGENOUS HEALTH SCIENCES
FACULTY OF INDIGENOUS HEALTH SCIENCES & TECHNOLOGY
GAMPAHA WICKRAMARACHCHI UNIVERSITY OF INDIGENOUS MEDICINE


GWUIM






BIO ENTROPENURESHIP
Mr.Dilip Kumara Fernando
CEO/Director,Avon Pharmo Chem (Pvt.) LTD.
Organized by
Department of Indigenous Medical resources,
Gampaha Wickramarachchi University of Indigenous Medicine,
Sri lanka.




පීඨය	දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ අධ්‍යයන පීඨය			
වැඩමුළු	**සංඛ්‍යාව**	**අධ්‍යයන අංශය/ඒකකය**	**දිනය**	**ක්‍රියාකාරකම**
ශිෂ්‍යයින්	15	දේශීය සාමාජීය විද්‍යා අධ්‍යයන අංශය	12.01.2024 03.01.2024 22.01.2024 25.10.2024 22.11.2024 03.12.2024 12/12/2024 14/12/2024	"ලිංගික හා ප්‍රජනක සෞඛ්‍යය" පිළිබඳ වැඩමුළුව මුහුණු යෝග සහ සාම්ප්‍රදායික රූපලාවන්‍ය සංස්කෘතික දැනුම පිළිබඳ වැඩමුළුව "විවිධත්වය සමඟ ජීවත් වීමට ඉගෙනීම" පිළිබඳ වැඩමුළුව ‘දේශීය දැනුම සහ බටහිර විද්‍යාව’ පිළිබඳ ආරාධිත දේශනය මත්ද්‍රව්‍ය අනිසි භාවිතය වැළැක්වීම සහ සමාජ කුසලතා සංවර්ධන වැඩසටහන “සංස්කෘතිය, සමාජය සහ භාවිතය” පිළිබඳ ආරාධිත දේශනයක් මානව විද්‍යාවේ භූගෝල විද්‍යාවන්”. දේශගුණික විපර්යාසවලට මුහුණ දීම සඳහා ඵලදායී උපාය මාර්ග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක්
		තාක්ෂණ අධ්‍යයන අංශය	04.01.2024 07.06.2024 26.06.2024- 05.02.2025 18.10.2024 24.10.2024	විද්‍යුත් සඟරා සැලසුම් සහ සංවර්ධන සැලසුම් කමිටුව සඳහා වැඩමුළුව MS කණ්ඩායම් හැඳින්වීම අධ්‍යාපනය සඳහා ගූගල් වැඩමුළුව වැඩමුළු මාලාව QR කේත භාවිතයෙන් පොදු දත්ත ප්‍රවේශ කිරීමේ ක්‍රම ව්‍යවහාරික සංඛ්‍යාලේඛන සිසුන් සඳහා සැසිය
		කළමනාකරණ අධ්‍යයන අංශය	26.08.2024	“මුල් කාලීන අධ්‍යයන කටයුතු බලගැන්වීම: ORCID හැඳුනුම්පත් සමඟ ඔබේ බලපෑම උපරිම කිරීම” යන වැඩමුළුව.
ශාස්ත්‍රාලිකයින්	2	අභ්‍යන්තර තත්ත්ව සහතික කුටිය පීඨය	19.01.2024 29.11.2024	තත්ත්ව සහතිකකරණය පිළිබඳ වැඩමුළුව (තත්ත්ව සහතික මධ්‍යස්ථානය) – අත්‍යවශ්‍ය මූල්‍ය ක්‍රියාපටිපාටි පිළිබඳ GWUIM දැනුවත් කිරීම, මූල්‍යාධිකාරී, GWUIM
ක්ෂේත්‍ර අධ්‍යයන ප්‍රා යෝගික පරීක්ෂණ	1	දේශීය සාමාජීය විද්‍යා අධ්‍යයන අංශය	20.12.2024	දියසරු උයන
ජාතික සේවා	13	දේශීය සාමාජීය විද්‍යා අධ්‍යයන අංශය	05.06.2024 20.06.2024 07.07.2024 18.07.2024 25.07.2024 01.08.2024 07.08.2024	ලෝක පරිසර දිනය – 2024 "මත් නැති හෙටක් - සිහි ඇති දැයක්" මාතෘකාවෙන් මත්ද්‍රව්‍ය වැළැක්වීමේ වැඩසටහන ඩිජිටල් පෝස්ටර තරඟය 'සූපසන් වෙරළ තීර' වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන “සූරකිමු පණ නල” රුධිරය පරිත්‍යාග කිරීමේ වැඩසටහන වඩා හොඳ අනාගතයක් සඳහා උපකාරක අතක් වැඩිහිටි සත්කාර වැඩසටහන

			16.10.2024 17.10.2024 17.10.2024 11.10.2024 08.11.2024 14.12.2024	"භූගෝල විද්‍යාව පිළිබඳ පරිදර්ශනය" ප්‍රදර්ශනය “අභිප්‍රේරණ ව්‍යාපාරය 6.0” ව්‍යාපෘතිය සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි පත්‍රිකාව පිළිබඳ සාකච්ඡා උසස් පෙළ සිසුන් සඳහා භූගෝල විද්‍යා සම්මන්ත්‍රණය - 2024 මීගමුවේ කාන්තා ධීවර සංගමයේ සාමාජිකයින් සඳහා මූල්‍යමය සාර්ථකත්වයක් අත්කර ගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් දේශගුණික විපර්යාස පිළිබඳ පාසල් දැනුවත් කිරීමේ වැඩසටහනක්. මාදිවෙල විශේෂ අධ්‍යාපන පාසලේ සහ පිරිමි නිවාසයේ අර්ථවත් වැඩසටහනක්.
		කළමනාකරණ අධ්‍යයන අංශය	16.08.2024 03.09.2024 01.12.2024	නුගේගොඩ, උඩහමුල්ල, සිද්ධාර්ථ විද්‍යාලයේ ගුරුවරුන් සඳහා ඵලදායිතා වැඩිදියුණු කිරීම සඳහා ජපන් 5S ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුවක් “ඒඩිස් දැන්ම අවසන් කරන්න” දැනුවත් කිරීමේ වැඩසටහන
		තාක්ෂණ අධ්‍යයන අංශය	25.09.2024 01.10.2024 08.10.2024 25.10.2024 07.11.2024	පාසැල් ගුරුවරුන් සඳහා මයික්‍රොසොෆ්ට් කාර්යාල වැඩමුළු මාලාව
වෙනත්	4	දේශීය සාමාජීය විද්‍යා අධ්‍යයන අංශය	03.01.2024 26.07.2024 04.11.2024	ලියෝ තරුණ කඳවුර සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර ක්ෂේත්‍රයේ නවෝත්පාදන පිළිබඳ ජාත්‍යන්තර සමුළුව, වියට්නාමය. අන්තර් විශ්ව විද්‍යාල විවාද තරඟය
		තාක්ෂණ අධ්‍යයන අංශය	02.09.2024	දේශීය සාමාජීය විද්‍යා අධ්‍යයන අංශය සඳහා පැමිණීම විශ්ලේෂණය කිරීමේ මෙවලම
		පීඨය	28.03.2024	ශිෂ්‍ය දිශානතික වැඩසටහන 2022/2023






Earth History
Geographies of Anthopocene -Guest Lecture Series


Workshop on Japanese 5S Methodology


Awareness Session on
University Financial Procedures


STUDENTS' UNION - FISSMS


Inter-University Debate Competition for Human Rights Day


Workshop on Face Yoga and Traditional Beauty Culture Knowledge
Faculty of Indigenous Social Sciences and Management Studies
Gampaha Wickramarachchi University of Indigenous Medicine

18.11 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ මධ්‍යස්ථානය (ELTC)

හැඳින්වීම

යක්කල සහ නුගේගොඩ ඇතුළු, සමස්ත විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන (ප්‍රායෝගික අංග ඇතුළුව පාඨමාලා ඒකක විස්සකට වැඩි) සියලුම උපාධි අපේක්ෂක වැඩසටහන්වල ඉංග්‍රීසි භාෂාව ආශ්‍රිත පාඨමාලා ඒකකවල දේශන ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ මධ්‍යස්ථානය විසින් පවත්වනු ලැබේ. (ELTC විසින් පිරිනමනු ලබන පාඨමාලා ඒකක ලැයිස්තුවක් අමුණා ඇත.)

මේ සඳහා, කථිකාචාර්යවරුන් තිදෙනෙකු පමණක් සිටින අතර, ඔවුන්ගෙන් එක් කථිකාචාර්යවරයෙකු ආචාර්ය උපාධිය සඳහා අධ්‍යයන නිවාඩු ලබා ඇත. තවත් කථිකාචාර්යවරයෙකු ද ආචාර්ය උපාධිය සඳහා නිවාඩු ලබා ගැනීම පිණිස ඉල්ලුම් කර ඇත. මේ දක්වා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවාවක් ලබාගෙන නොමැත.

2024 වර්ෂයේ දී, නුගේගොඩ දේශන පැවැත්වීම සඳහා අවම වශයෙන් තවත් කථිකාචාර්යවරයෙකු පත් කරන ලෙස කළ ඉල්ලීම සලකා බලා නොමැති බැවින්, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ මධ්‍යස්ථානය එහි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබ ඇත්තේ අතිශයින් දුෂ්කරතාවන්ට මුහුණ දෙමිනි.

පරමාර්ථ

විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපාධි වැඩසටහන්වලට අදාළ ඉංග්‍රීසි භාෂාව ආශ්‍රිත පාඨමාලා ඒකක පැවැත්වීම.

කාර්ය මණ්ඩල තනතුරු

ELTC සඳහා වෙනම කාර්ය මණ්ඩල තනතුරු වෙන් කර නොමැත. වර්තමානය වන විට, දේශීය වෛද්‍ය පීඨයේ භාෂා දෙපාර්තමේන්තුව යටතේ ඇති කාර්ය මණ්ඩල තනතුරු භාවිතා කර ඇත.

ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ මධ්‍යස්ථානය මඟින් සෑම අධ්‍යයන වාරයක දීම, ශිෂ්‍යයින් 900 කට වැඩි පිරිසකට දේශන පවත්වයි. මෙම කාර්යය සඳහා සිටිනුයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකු පමණි.

පාඨමාලා ඒකකවල න්‍යායාත්මක සහ ප්‍රායෝගික කොටස් සඳහා පහසුකම් සැලසීම පිණිස අවම වශයෙන් එක් කථිකාචාර්යවරයෙකු හෝ පත් කරන ලෙස අඛණ්ඩ ඉල්ලීම් (සභාපති/UGC වෙත සෘජු පිටපතක් සහිතව) ඉදිරිපත් කර ඇත.

ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සඳහා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් (කළමනාකරණ සහකාර සහ කාර්යාල සහකාර) වෙන් කර නොමැත.

අධ්‍යයන කටයුතු සඳහා සහාය වීම පිණිස නිරූපකයෙකු පත් කිරීම සඳහා කළ ඉල්ලීමක් සලකා බලා නොමැත.

පිරිනමනු ලබන පාඨමාලා

ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ මධ්‍යස්ථානය මඟින් විශ්වවිද්‍යාලය පිරිනමන සියලුම ප්‍රථම උපාධි වැඩසටහන් සඳහා විවිධ ඉංග්‍රීසි භාෂා පාඨමාලා ඒකක පිරිනමනු ලබයි.

අංකය	ඉංග්‍රීසි භාෂා පාඨමාලා ඒකකය	උපාධි වැඩසටහන	අධ්‍යයන අංශය
1	වෘත්තිකයින් සඳහා ඉංග්‍රීසි	FIHST හි ප්‍රථම උපාධි මට්ටමේ වැඩසටහන්	සියලුම අධ්‍යයන අංශ
2	යෝග සහ සංචාරක කර්මාන්තය සඳහා ඉංග්‍රීසි	සෞඛ්‍ය සංචාරක කර්මාන්තය සහ සත්කාර කළමනාකරණය පිළිබඳ ගෞරව විද්‍යාවේදී උපාධිය සහ යෝග සහ පාරමනෝවිද්‍යාව පිළිබඳ ගෞරව විද්‍යාවේදී උපාධිය	දේශීය සෞඛ්‍ය විද්‍යා
3	තාක්ෂණය සඳහා ඉංග්‍රීසි	ජෛවවෛද්‍ය තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යා ගෞරව විද්‍යාවේදී උපාධිය සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සෞඛ්‍ය විද්‍යා ගෞරව විද්‍යාවේදී උපාධිය	තාක්ෂණය
4	ස්වභාවික විද්‍යා සඳහා ඉංග්‍රීසි	දේශීය වෛද්‍ය සම්පත් පිළිබඳ ගෞරව විද්‍යාවේදී උපාධිය සහ දේශීය ඖෂධ තාක්ෂණය පිළිබඳ ගෞරව විද්‍යාවේදී උපාධිය	දේශීය වෛද්‍ය සම්පත් දේශීය වෛද්‍ය සම්පත්
5	ඉංග්‍රීසි භාෂා කුසලතා I - න්‍යාය සහ ප්‍රායෝගික	දේශීය දැනුම පිළිබඳ සාමාජීය විද්‍යා ගෞරව විද්‍යාවේදී උපාධිය	දේශීය සාමාජීය විද්‍යා
6	ඉංග්‍රීසි භාෂා කුසලතා II - න්‍යාය සහ ප්‍රායෝගික	දේශීය දැනුම පිළිබඳ සාමාජීය විද්‍යා ගෞරව විද්‍යාවේදී උපාධිය	දේශීය සාමාජීය විද්‍යා
7	ආයුර්වේද වෛද්‍ය අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි (3 credits)	ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය	භාෂා අධ්‍යයන අංශය
8	විද්‍යාත්මක සන්නිවේදනය සඳහා උසස් ඉංග්‍රීසි - I	ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය	භාෂා අධ්‍යයන අංශය
9	විද්‍යාත්මක සන්නිවේදනය සඳහා උසස් ඉංග්‍රීසි - II	ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය	භාෂා අධ්‍යයන අංශය
10	විද්‍යාත්මක සන්නිවේදනය සඳහා උසස් ඉංග්‍රීසි - III	ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය	භාෂා අධ්‍යයන අංශය

18.12 මාධ්‍ය සහ මුද්‍රණ ඒකකය

හැඳින්වීම

විශ්වවිද්‍යාලයේ මාධ්‍ය සහ මුද්‍රණ ඒකකය උපකුලපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ ස්ථාපිත කර ඇත. ඡායාරූප, වීඩියෝ සහ වෙනත් මාධ්‍ය ඇතුළු මාධ්‍ය ක්‍රම භාවිතා කරමින් විශ්වවිද්‍යාලය ප්‍රවර්ධනය කිරීම මෙම ඒකකයේ මූලික පරමාර්ථය වේ.

තව ද, යූටියුබ්, ට්විටර්, ඉන්ස්ටග්‍රම් සහ මුහුණු පොත වැනි සමාජ මාධ්‍ය නාලිකා සඳහා පරිපාලකයා ලෙස ද මාධ්‍ය ඒකකය ක්‍රියාකාරනු ලබයි. එමෙන්ම, මාධ්‍ය ඒකකය මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය සමඟ සමීප සම්බන්ධතා පවත්වනු ලබයි.

ඒකක කාර්ය මණ්ඩල ව්‍යුහය


උපකුලපතිතුමා මාධ්‍ය සහ මුද්‍රණ ඒකකයේ ප්‍රධානියා වන අතර එම ඒකකයේ එදිනෙදා වැඩකටයුතු අධීක්ෂණය කිරීම පිණිස උපකුලපතිතුමාගේ නිර්දේශය මත පදනම්ව සම්බන්ධීකාරකවරයෙක් (ඩී. එස්. ආර්. විජේවර්ධන මහතා) පත් කරනු ලැබේ. ඒකකයේ කටයුතු පවත්වා ගැනීම සඳහා ඡායාරූපකරණය සහ වීඩියෝගත කිරීම පිළිබඳ දැනුම ඇති තාක්ෂණ නිලධාරියෙක් (ඒ. එම්. අතුකෝරල මහතා) අනුයුක්ත කරනු ලැබේ. විශ්වවිද්‍යාලයේ උත්සව අවස්ථාවන් ආවරණය කිරීම පිණිස අනෙකුත් අංශවල කාර්ය මණ්ඩල සාමාජිකයින් තාවකාලිකව අනුයුක්ත කර ඇත.


2023 වර්ෂය තුළ ලැබූ ජයග්‍රහණ


විශ්වවිද්‍යාලය මඟින් සම්පත් මාධ්‍ය සහ ප්‍රකාශන ඒකකයට නවීකරණය කිරීම මඟින් මාධ්‍ය සහ ප්‍රකාශන ඒකකය ශක්තිමත් කර ඇත. මාධ්‍ය සහ ප්‍රකාශන ඒකකය පහත දැක්වෙන කාර්යයන් ඉටු කර ඇත.

- හදිසි අවස්ථා කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩමුළුව (මූලික ජීවිතාධාර -BLS) 2024.03.28 වැනි දින පවත්වන ලදී.
- හදිසි අවස්ථා කළමනාකරණය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩමුළුව 2024.04.24 වැනි දින පවත්වන ලදී.
- BAMS උපාධි දිශානති වැඩසටහනේ සමාරම්භක උත්සවය - 2022/2023 2024.08.06 වැනි දින පවත්වන ලදී.
- ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමාවේ සමාරම්භක උත්සවය 2024.10.26 වැනි දින පවත්වන ලදී.
- "මාතෘ සහ නවජ දරු උපත් සිමියුලේටර් පුහුණුව" පිළිබඳ ප්‍රා යෝගික පුහුණුව 2024.12.09 වැනි දින පවත්වන ලදී.
- (දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයන අංශයේ නිවන්ත කනුවන මහතා, කථිකාචාර්ය (පරිවාස) විසින් සංවිධානය කරන ලද “විකුම් මල්වතු වාරිකා” මල්වතු ඔය අධ්‍යයන වැඩසටහන) මසකට දින 2ක් සංචාර හයක්


යූ ටියුබ් ග්‍රාහකයින්


Studio
Search across your channel
Create
Channel analytics
Advanced mode
Overview
Content
Audience
Trends
1 Jan – 31 Dec 2024
2024
All
Videos
Live
Posts
Views
11.6K
3. දේශගුණික ක්‍රියාකාරකම්, තිරසාරභාවය සහ පරිසරය පිළිබඳ සාමාන්‍ය විඥානය සහ භාවිතාවන් ඉහළ නැංවීමේ ප්‍රයත්නයක් ලෙස, පීඨයේ කාර්ය මණ්ඩලය සහ සිසුන් ප්‍රමුඛ ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් අපි ලෝක පරිසර දින වැඩසටහනක් සංවිධානය කළෙමු **(SDG (13).** ලෝක පරිසර දිනය නිමිත්තෙන් වාර්ෂික පෝස්ටර් තරඟය සහ රුක් රෝපණ ව්‍යාපාරය වැනි වැඩසටහන් අඛණ්ඩව සිදුකිරීමට පීඨය කැපවී සිටින අතර එමඟින් පීඨයේ සිසුන් පරිසරය සුරැකීමේ සහ එහි තිරසාරභාවය ආරක්ෂා කිරීමේ වැදගත්කම ඉගෙන ගනී.

4. **SDG** (8) ඉලක්කය සමඟ සමපාත වෙමින්, රැකියා නියුක්ත උපාධිධාරීන් බිහි කිරීමට අවශ්‍ය මෘදු නිපුණතා ලබා දීම සඳහා පීඨය වෘත්තීය සංවර්ධන ඉසව් සංවිධානය කරන අතර තරුණ තරුණියන් සඳහා රැකියා අවස්ථා සුරක්ෂිත කිරීමේදී පවතින අභියෝගවලට අප මුහුණ දෙන බව සහතික කෙරේ. එසේම, අපගේ සිසුන් වත්මන් රැකියා වෙළෙඳපොළ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය කුසලතා සහ දැනුමෙන් සන්නද්ධ බව සහතික කිරීම සඳහා අදාළ විෂය ක්ෂේත්‍රවල වර්තමාන ඉල්ලීම් සහ ප්‍රවණතා සපුරාලීම සඳහා පීඨය නිතර විෂයමාලා සංශෝධනය කරයි. සිසුන්ට අවශ්‍ය නිරාවරණය ලබා දීමට, සැබෑ ලෝකයේ සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳව ඔවුන්ව දැනුවත් කිරීමට පීඨය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ට නිතර ආරාධනා කරයි. ශිෂ්‍යයින් විසින් 2024.07.30 වැනි දින "මූලික වෘත්තීය කුසලතා සංවර්ධනය" පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

5. **SDG** (10) ඉලක්කයට සමගාමීව සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්වල කොටසක් ලෙස පීඨ ශිෂ්‍ය සංගමය විසින් සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද, නත්තල්, තෛපොංගල්, වෙසක්, රාමසාන් සහ හජ් උත්සව ඇතුළු සංස්කෘතික උත්සව මාලාවක් සංවිධානය කර ඇත.

6. **SDG (01)** ඉලක්කය සමඟ සමපාත වෙමින්, සිසුන් විසින් 2024.10.11 වන දින මීගමුවේ ධීවර ප්‍රජාව සඳහා "මීගමුවේ ධීවර කාන්තාවන් කෙරෙහි අවධානය යොමු කරමින් ආර්ථිකය සමතුලිත කරන්නේ කෙසේද" යන මාතෘකාව යටතේ දැනුවත් කිරීමේ සැසියක් සංවිධානය කර ඇත.

7. **SDG** (3) ඉලක්කය සමඟ සමගාමීව ශිෂ්‍යයින් විසින් 2024.12.01 වන දින "ඒඩිස් දැන් අවසන් කරමු" යන මාතෘකාව යටතේ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

8. පීඨයේ ක්‍රියාකාරකම් **SDG (5)** ඉලක්කය දෙසට පෙළගැස්වීම සඳහා, ස්ත්‍රී පුරුෂ භාවය ආශ්‍රිතව "බාධක බිඳ දැමීම" පිළිබඳව දේශීය සමාජ විද්‍යා හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ සිසුන් විසින් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

9. පීඨය සිය ක්‍රියාකාරකම් **SDG** (6) ඉලක්කය සමඟ පෙළගස්වා ඇති බව සහතික කිරීම සඳහා ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් පීඨය විසින් ලෝක ජල දිනය සමරන ලදී. එපමනක් නොව, 2023 ලෝක පරිසර දිනය නිමිත්තෙන් පරිසර සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා පීඨය විසින් මාර්ගගත පෝස්ටර් තරඟයක් සංවිධානය කරන ලදී. මෙම ක්‍රියාකාරකම තිරසාර සංවර්ධන ඉලක්ක (7) සමඟ සමපාත වේ. එමෙන්ම දේශීය සමාජ විද්‍යා සහ කළමනාකරණ පීඨයේ ශිෂ්‍යයින් 2024.07.28 වැනි දින සෞඛ්‍යසම්පන්න ජීවිතයක් සඳහා පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව" පිළිබඳ වැඩසටහනක් සංවිධානය කළ අතර මෙම ක්‍රියාකාරකම **SDG (2)** ඉලක්කයට සමඟාමී වේ.

10. ශිෂ්‍යයින් විසින් **SDG (9)** ඉලක්කයට අනුකූලව කර්මාන්ත, නවෝත්පාදනය සහ යටිතලපහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා "දේශීය කර්මාන්ත පිහිටුවීම සඳහා ස්වදේශීය දැනුම භාවිතා කිරීම" පිළිබඳ වැඩසටහනක් සංවිධානය කරන ලදී.

11. තිරසාර නගර සහ ජනකොටියාස ප්‍රවර්ධනය කරමින් ශිෂ්‍යයින් විසින් "පරිසර හිතකාමී ජීවත්වීම සහ හරිත ජීවන රටාවක් සහ සමෘද්ධිමත් ප්‍රජාවන් සමඟ සුමට නාගරික ගමනක්" යන වැඩසටහනක් සංවිධානය කරන ලද අතර මෙම ක්‍රියාකාරකම **SDG (11)** ඉලක්කයට අනුකූල වේ.

12. **SDG (12)** ඉලක්කයට සමගාමීව, වගකීම් සහගත පරිභෝජනය සහ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා ශිෂ්‍යයින් විසින් භාවිතා කළ පොත් ප්‍රදානය කිරීමේ "අකුරකට අරුතක්" ව්‍යාපෘතිය සංවිධානය කරන ලදී.

13. පීඨයේ සිසුන් **SDG** (13) ඉලක්කය සමඟ සමපාත වන පරිදි 2024.11.08 වන දින දේශගුණික විපර්යාස පිළිබඳ පාරිසරික - යොවුන් දැනුවත් කිරීමේ වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් පැවැත්වීය. එසේම, 2024.12.14 වන දින "දේශගුණික විපර්යාස ගැන කතා කිරීම සඳහා ඵලදායී උපාය මාර්ග" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මහාචාර්ය මෙත්තිකා විතානගේ හට ආරාධනා කරන ලදී.

14. පීඨයේ ශිෂ්‍යයින් විසින් **SDG (17)** ඉලක්කයට අනුකූලවෙමින් 2024.10.18 වැනි දින ළමයින් ආරක්ෂා කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.



21. මුල්‍ය ප්‍රකාශන - 2024



ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

2024 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

		පිටු අංකය
1	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය	01
2	මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය	02
3	ශුද්ධ වත්කම්/ කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශන	03
4	මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන	04
5	වැදගත් මූල්‍ය ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	05-28
6	අයවැය සහ තථ්‍ය සැසඳීම පිළිබඳ ප්‍රකාශන	29

2024 දෙසැම්බර් මස 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් වේ)

දෙසැම්බර් 31 වැනි දිනයට	සටහන්	2024	2023 (Reclasified)
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	2	7,161,520	13,261,903
වෙනත් ලැබිය යුතු දේ	3	29,456,326	1,444,000
කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්	4	19,932,498	20,473,444
බඩු ලේඛනය	5	12,869,182	12,225,751
පූර්ව ගෙවීම්	6	1,535,283	565,182
කෙටි කාලීන ආයෝජන		75,706,242	93,845,858
වෙනත් ජංගම වත්කම්	7	16,971,018	29,300,431
මුළු ජංගම වත්කම්		**163,632,068**	**171,116,569**
ආයෝජන		353,957,965	263,734,499
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	8	1,008,574,808	1,043,674,588
කෙරී ගෙන යන වැඩ	9	21,353,279	9,841,118
ප්‍රාග්ධන අත්තිකාරම්		3,374,241	1,290,541
අස්පර්ෂණීය වත්කම්	10	2,137,687	2,672,109
මානව ප්‍රාග්ධනය සංවර්ධනය	11	-	-
මුළු ජංගම නොවන වත්කම්		**1,389,397,980**	**1,321,212,855**
මුලු වත්කම්		**1,553,030,048**	**1,492,329,424**
වගකීම්			
ජංගම වගකීම්			
සම්මුවිඡින වියදම්	12	38,805,175	25,135,074
ණයකරුවෝ සහ කළ යුතු ගෙවීම්	13	10,862,464	14,942,583
ආපසු ගෙවිය යුතු තැන්පතු හා වෙනත්	14	3,248,822	9,449,888
විලම්බිත ආදායම	15	14,223,762	30,520,157
මුළු ජංගම වගකීම්		**67,140,223**	**80,047,702**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම	16	166,740,180	134,072,662
මුළු වගකීම්		**233,880,403**	**214,120,364**
මුළු ශුද්ධ වත්කම්		**1,319,149,645**	**1,278,209,060**
සමුච්චිත අරමුදල් සහ සංචිත			
සමුච්චිත අතිරික්තය - ප්‍රාග්ධනය		926,484,671	869,400,688
සමුච්චිත අතිරික්ත -නොගෙවූ		14,053,264	24,431,779
සමුච්චිත අතිරික්තය -පුනරාවර්තන		51,375,338	61,677,153
සීමාකළ අරමුදල් සහ ප්‍රදාන	17	88,110,588	83,573,656
ප්‍රත්‍යාගණන සංචිත	18	239,125,784	239,125,784
මුළු ශුද්ධ වත්කම/ සම කොටස්		**1,319,149,645**	**1,278,209,060**

පිටු අංක 01 සිට 29 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය මඟින් නිකුතු කළ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලවය සකස් කර, ඉදිරිපත් කර ඇත.

සී.සී. ජී. කොතලාවල
මූල්‍යාධිකාරී

මහාචාර්ය රන්ජනා ඩබ්ලිව්. සෙනෙවිරත්න
උපකුලපති

විශ්වවිද්‍යාලයේ පාලක සභාව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකීම දරයි.

අතුල රණවීර මහතා
පාලක සභා සාමාජික

සුනිල් ජයලත් මහතා
පාලක සභා සාමාජික

2025 පෙබරවාරි 27
යක්කල

2024 දෙසැම්බර් 31 වැනි දිනට අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් වේ)

2024 දෙසැම්බර් 31 වැනි දිනට අවසන් වර්ෂය සඳහා	**සටහන්**	**2024**	**2023 (නැවත වර්ගීකරණය කළ)**
		රු.	රු.
ආදායම			
හුවමාරු කළ නොහැකි ගනුදෙනුවලින් ආදායම			
පුනරාවර්තන ප්‍රදාන (ආණ්ඩුව)		744,646,000	656,500,000
		744,646,000	**656,500,000**
හුවමාරු නොකළ ආදායම-ප්‍රාග්ධන ප්‍රදානය			
රජයේ ප්‍රදාන (ප්‍රාග්ධනය)		91,117,000	96,528,000
AHEAD සඳහා ලැබූ ප්‍රදාන		-	101,327,366
අන්තර් විශ්වවිද්‍යාල කරාතේ සඳහා ලැබූ ප්‍රදාන		1,025,000	-
උත්පාදිත අරමුදල්		24,541,908	9,466,177
ත්‍යාග හා ප්‍රදාන		867,002	2,059,012
		117,550,910	**209,380,555**
		862,196,910	**865,880,555**
හුවමාරු ගනුදෙනුවලින් ආදායම			
ණය සහ අත්තිකාරම්වලින් පොලිය		823,850	803,946
ආයෝජන පොලිය		41,349,195	71,989,416
විවිධ ලැබීම්	19	1,070,062	2,027,070
ලියාපදිංචි ගාස්තු		2,011,700	1,338,100
විභාග ගාස්තු		146,650	209,850
පුස්තකාල දඩ මුදල්		41,181	44,439
වෛද්‍ය ගාස්තු		94,900	50,200
දේපළ කුලිය	20	270,125	826,137
තොග විකුණුම		77,275	166,000
මහපොල හා ශිෂ්‍යාධාර	21	15,332,000	18,296,430
රසායනාගාර පරීක්ෂණ ගාස්තු		32,500	-
නේවාසිකාගාර ගාස්තු		343,940	-
ස්වයං-මූල්‍ය වැඩසටහන්වලින් ආදායම		30,381,214	41,652,686
හුවමාරු ගනුදෙනුවලින් මුළු ආදායම		**91,974,592**	**137,404,274**
මුළු ආදායම		**954,171,502**	**1,003,284,829**
මෙහෙයුම් ප්‍රතිඵල			
පුනරාවර්තන ආදායම			
හුවමාරු නොකළ		744,646,000	656,500,000
හුවමාරු කළ		91,974,592	137,404,274
මුළු ආදායම		**836,620,592**	**793,904,274**
මෙහෙයුම් වියදම් - ජංගම			
පුද්ගලික පඩිනඩි		(584,229,312)	(489,833,756)
ගමන් වියදම් සහ යැපීම් දීමනාව		(205,540)	(308,458)
සැපයුම් හා භාවිතා කළ පාරිභෝජන		(23,027,424)	(26,012,771)
නඩත්තුව		(17,852,735)	(23,994,105)
කොන්ත්‍රාත් සේවා		(108,710,563)	(109,626,817)
ශිෂ්‍යාධාර	21	(15,332,000)	(18,296,430)
වෙනත් මෙහෙයුම් වියදම්		(27,266,514)	(31,103,435)
ස්වයං-මූල්‍ය වැඩසටහන් සඳහා වියදම්		(20,484,614)	(34,922,606)
උත්පාදිත අරමුදල් වියදම්		(8,379,795)	(13,786,902)
මුළු මෙහෙයුම් වියදම්		**(805,488,497)**	**(747,885,280)**
කාලපරිච්ඡේදය සඳහා ජංගම අතිරික්තය/(හිඟය)		**31,132,095**	**46,018,994**
හුවමාරු නොවන ආදායම-ප්‍රාග්ධන ප්‍රදානය		**117,550,910**	**209,380,555**
හුවමාරු ආදායම - ප්‍රාග්ධන			
ක්ෂයවීම සහ වියදම් ක්‍රමක්ෂය		(117,159,197)	(86,732,104)
ප්‍රාග්ධන ප්‍රදානය සඳහා ගණනය කිරීමෙන් පසු පසු කාලය සඳහා අතිරික්තය/(හිඟය)		**391,712**	**122,648,451**
කාලපරිච්ඡේදය සඳහා මුළු අතිරික්තය/(හිඟය)		**31,523,807**	**168,667,445**

2024 දෙසැම්බර් 31 වැනි නෙන් අවසන් වර්ෂය සඳහා
ශුද්ධ වත්කම්/ සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය
(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් වේ)

විෂය කේතය	සමුච්චිත අතිරික්තය- ප්‍රාග්ධනය	සම්චිත ප්‍රාග්ධනය (වියදම් නොකළ)	සමුච්චිත අතිරික්තය - පුනරාවර්තන	ප්‍රත්‍යාගණන සංචිතය	සීමාකළ අරමුදල්, ප්‍රදාන සහ ආධාර	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.
2023 ජනවාරි 01වැනි දිනට ශේෂය	**773,969,822**	**12,971,328**	**35,476,870**	**230,550,352**	**29,174,152**	**1,082,142,524**
වසර සඳහා අතිරික්තය/ (හිඟය)			168,667,445			168,667,445
ප්‍රාග්ධන ප්‍රදානය (GOSL) 2023		96,528,000				96,528,000
යටිතලපහසුකම් සංවර්ධනය සඳහා AHEAD ප්‍රදානය	95,366,128	5,961,238				101,327,366
මාරු කිරීම්/ ශුද්ධ සංචලන	34,530,018	(34,530,018)				-
	9,466,177			8,575,432	4,399,505	22,441,114
විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට මාරුකිරීම			(50,000,000)		50,000,000	
භූවමාරු නොවන ආදායමට මාරු කිරීම		(102,489,238)	(106,891,317)			(209,380,555)
ත්‍යාග සහ පරිත්‍යාග	2,059,012					2,059,012
සමුච්චිත අතිරේක පුනරාවර්තනවලට සිදු කළ ගැලපීම් - 2023	(45,990,469)	45,990,469	14,424,154			14,424,154
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**869,400,688**	**24,431,779**	**61,677,153**	**239,125,784**	**83,573,657**	**1,278,209,061**

විෂය කේතය	සමුච්චිත අතිරික්තය- ප්‍රාග්ධනය	සම්චිත ප්‍රාග්ධනය (වියදම් නොකළ)	සමුච්චිත අතිරික්තය - පුනරාවර්තන	ප්‍රත්‍යාගණන සංචිතය	සීමාකළ අරමුදල්, ප්‍රදාන සහ ආධාර	එකතුව
	Rs.	**Rs.**	**Rs.**	**Rs.**	**Rs.**	**Rs.**
2024 ජනවාරි 01වැනි දිනට ශේෂය	**869,400,688**	**24,431,779**	**61,677,153**	**239,125,784**	**83,573,657**	**1,278,209,060**
වසර සඳහා අතිරික්තය/ (හිඟය)	391,712		31,523,807			31,915,520
ප්‍රාග්ධන ප්‍රදානය (GOSL) 2024		91,117,000				91,117,000
අන්තර් විශ්වවිද්‍යාල කරාතේ සඳහා ලැබුනු ප්‍රදාන	1,025,000					1,025,000
මාරු කිරීම්/ ශුද්ධ සංචලන	30,258,361	(30,258,361)	(391,712)		9,416,776	9,025,064
	24,541,908	19,879,845			(19,879,845)	24,541,908
විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට මාරු කිරීම			(15,000,000)		15,000,000	-
භූවමාරු නොවන ආදායමට මාරු කිරීම		(91,117,000)	26,433,910)			(117,550,910)
ත්‍යාග සහ පරිත්‍යාග	867,002					867,002
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	**926,484,671**	**14,053,264**	**51,375,338**	**239,125,784**	**88,110,588**	**1,319,149,645**

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රවාහන ප්‍රකාශනය

2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා

විස්තරය	2024 රු. 000'	2023 රු. 000'
මෙහෙයුම් ක්‍රියාවලිවලින් මූල්‍ය ප්‍රවාහ		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්තය (හිඟය)	31,524	168,667
එකතු කළා: මූල්‍ය නොවන කටයුතු		
ක්ෂයවීම්	74,925	81,060
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන - පාරිතෝෂකය	34,921	20,194
මූල්‍ය නොවන සංචලනය - AHEAD ප්‍රදානය/ ජනනය කළ අරමුදල්	-	(108,640)
අස්පර්ෂණීය වත්කම් ක්‍රමක්ෂය	534	433
පර්යේෂණ සහ සංවර්ධය ක්‍රමක්ෂය	922	1,900
මානව ප්‍රාග්ධනය ක්‍රමක්ෂය	348	3,339
වැඩ ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ප්‍රතිලාභ	**143,173**	**166,953**
		-
සිදු කළ ගෙවීම්වල වැඩිවීම/ (අඩුවීම)	(6,706)	(12,346)
බඩු ලේඛනවල (වැඩිවීම)/අඩු කිරීම	(643)	(6,911)
ගනුදෙනු හා වෙනත් ලැබීම්වල අඩුවීම (වැඩිවීම)/අඩු කිරීම	(16,112)	4,860
ගනුදෙනු හා වෙනත් ගෙවීම්වල වැඩිවීම (වැඩිවීම/ (අඩුවීම)	(6,201)	(3,986)
මෙහෙයුම්වලින් උත්පාදිත මුදල	**113,510**	**148,571**
	-	
පාරිතෝෂික ගෙවීම්	(2,253)	(24,744)
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**111,257**	**123,827**
ආයෝජන කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය		
පිරියත හා උපකරණ මිල දී ගැනීම	(72,507)	(393,269)
කෙරී ගෙන යන වැඩ	(11,512)	149,290
වෙනත් හා ප්‍රාග්ධන අත්තිකාරම්	(2,084)	5,758
මානව ප්‍රාග්ධන සංවර්ධනය	-	(3,118)
ශුද්ධ ආයෝජනය	(72,084)	11,876
ආයෝජන කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**(158,187)**	**(229,463)**
මූල්‍ය කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය		
පෙර වර්ෂයේ ගැලපීම් (ශුද්ධ)	-	(39)
විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලෙන් මාරු කිරීම	(4,880)	(50,000)
ලැබූ ප්‍රදාන	1,025	102,489
සීමා කළ අරමුදල්	9,417	54,400
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**5,562**	**106,849**
		-
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	(41,368)	1,213
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දේ	13,262	12,048
කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දේ	**(28,106)**	**13,261**

1. ආයතනික තොරතුරු

1.1 පදිංචිය හා නෛතික ස්වභාවය

ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය සංශෝධිත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ නිකුත් කළ 1995 පෙබරවාරි මස 23වැනි දිනැති අංක 859/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව 1995 මාර්තු මස 01වැනි දින සිට 2021 පෙබරවාරි මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අභෝසි කරනු ලබන තෙක් කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ විද්‍යායතනයක් ලෙස පිළිගනු ලැබීය.

2020.07.08 වැනි දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, යක්කල සියලුම පහසුකම්වලින් අනූන විශ්වවිද්‍යාලයක තත්ත්වයට ඉහළ නැංවීම සඳහා තීරණය කරන ලද අතර ඒ අනුව විද්‍යායතනය 2021.03.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි "ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය" නමින් සම්පූර්ණ පහසුකම් සහිත විශ්වවිද්‍යාලයක් බවට උසස් කිරීම පිණිස 2020 ඔක්තෝබර් මස 28 දිනැති අංක 2199/12 දරන රජයේ ගැසට්පත්‍රය ප්‍රකාරව නියෝගය නිකුත් කරන ලදී. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය 2021.03.01 වැනි දින සිට ස්ථාපිත කරනු ලැබ එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.

විශ්වවිද්‍යාලය කොළඹ - මහනුවර මාර්ගයේ කොළඹ නගරයෙන් කිලෝ මීටර 30ක් පමණ දුරින් යක්කල නගරයේ දී පිහිටුවා ඇත. නව විශ්වවිද්‍යාලයට ප්‍රථම උපාධි වැඩසටහන් 08ක් සහ පශ්චාත් උපාධි වැඩසටහන් 07 පිරිනමනු ලබන, අධ්‍යයන අංශ 14කින් සමන්විත පීඨ හතරක් ඇතුළත් වේ. විශ්වවිද්‍යාලයට 2022 වර්ෂයේ උසස් පෙළ ප්‍රතිඵල මත පදනම්ව ප්‍රථම උපාධි මට්ටමේ ශිෂ්‍යයින් 508ක් ඇතුළත් කර ගෙන ඇති අතර 2024 දෙසැම්බර් 31 වැනි දිනය වන විට විශ්වවිද්‍යාලයේ සිටින මුළු අභ්‍යන්තර ශිෂ්‍යයින් සංඛ්‍යාව 1730ක් විය.

සමාලෝචිත 2024 මූල්‍ය වර්ෂය තුළ දී, විශ්වවිද්‍යාලය පොදු මුද්‍රාවක් සහ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් වේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

2020.10.28 දිනැති අංක 2199/12 දරන රජයේ අතිවිශේෂ ගැසට්පත්‍රය ප්‍රකාරව ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ස්ථාපිත කරනු ලැබුවේ දේශීය වෛද්‍ය විද්‍යාව, දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණය සහ දේශීය සමාජීය විද්‍යා සහ කළමනාකර අධ්‍යයන ශාඛාවන්හි උසස් අධ්‍යාපනය ලබාදීමේ, දියුණු කිරීමේ සහ සංවර්ධනය කිරීමේ කාර්යයන් සඳහා වේ.

තව ද, තෝරාගත් විෂයන් සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ලබා ගැනීමේ හැකියාව ඇතිව ශිෂ්‍යයන්ට ඉතා හොඳ සාමාන්‍ය අධ්‍යාපනයක් ලබාදීමේ අරමුණ ඇතිව විෂයයන් රාශියකට අදාළ පාඨමාලා විශ්වවිද්‍යාලය විසින් ඇති කළ බවත් දේශීය සම්පත් පදනම තුළ වටිනාකම් නිර්මාණය කිරීම විශ්වවිද්‍යාලය වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් එයින් නියම කර ඇත.

1.3 මූල්‍ය කාලපරිච්ඡේදය

ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාලපරිච්ඡේදය 2024 ජනවාරි 01 වැනි දින සිට 2024 දෙසැම්බර් 31 වැනි දින දක්වා මාස වේ.

1.4 නිකුත් කිරීම සඳහා බලයදීමේ දිනය

2024 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා 2025 පෙබරවාරි 27 වැනි දින විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ අනුමැතිය මත මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය දී ඇත.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පාලක සභාව වගකීම දරයි.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

2.1.1 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට 2024 වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහය, ශුද්ධ වත්කම්/ සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශන, වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ඇතුළත් වේ. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර අඛණ්ඩ අදාළ කර ගනු ලැබේ. සාධාරණ අගයෙන් පිරිවැයේ ද්‍රව්‍යමය අපගමනය ඇති විට, සාධාරණ අගය මිනුම් පදනම ලෙස භාවිතා කර ඇත.

2.1.2 අනුකූලවීමේ ප්‍රකාශනය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන (මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහය, ශුද්ධ වත්කම්/ සමකොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශන, ගිණුම්කරන ප්‍රතිපත්ති සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (<u>අදාළ වන පරිදි SLPSAS I වැනි වෙළුම, II වැනි වෙළුම සහ III වැනි වෙළුම</u>) අනුකූලව සකස් කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හැරුණු කොට මූල්‍ය ප්‍රකාශන සමුච්චිත පදනම මත සකස් කර ඇත. කෙසේවුව ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් නොමැති අවස්ථාවල දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ද භාවිතා කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හැරුණු කොට මූල්‍ය ප්‍රකාශන සමුච්චිත පදනම මත සකස් කර ඇත.

2.1.3 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන සමුච්චිත පදනමක් මත සහ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇති අතර යෝග්‍ය අවස්ථා හැරුණු කොට අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් සිදු කර ඇත. වත්කම් හා වගකීම්වල සාපේක්ෂ ද්‍රවශීලීත්වය නිරූපණය කරන පරිදි ඒවා කාණ්ඩ කර ඇත.

2.1.4 තුලනාත්මක තොරතුරු

ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන අවබෝධ කර ගැනීම වැඩිදියුණු කිරීම පිණිස සහ කාලපරිච්ඡේද අතර තුලනාත්මකභාවය වැඩිදියුණු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර ඇති සියලුම අගයන් සඳහා කලින් කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක, විස්තරාත්මක තොරතුරු ඇතුළත් තුලනාත්මක තොරතුරු හෙළිදරව් කරනු ලැබේ. තව ද, විශ්වවිද්‍යාලය 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි SLIPSAS II වෙළුමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති-හුවමාරු නොකරන ගනුදෙනුවලින් ආදායම (බදු සහ මාරු කිරීම්) SLIPAS III අනුව ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් විකල්ප ගිණුම්කරණ ප්‍රතිකාර යොදා ගෙන ඇති අතර පසු ගිය වර්ෂයේ සංඛ්‍යා ලේඛන නැවත වර්ගීකරණයන් ඒ අනුව සිදු කර ඇත. තවද, අවශ්‍ය අවස්ථාවලදී, ඉදිරිපත් කිරීම වැඩිදියුණු කිරීම සඳහා, මූල්‍ය ප්‍රකාශනවල වත්මන් කාල පරිච්ඡේදය සමඟ එය සමපාත කිරීම සඳහා පෙර කාල පරිච්ඡේදයට නැවත වර්ගීකරණයන් සිදු කරන ලදී.

2.1.5 අඛණ්ඩ පැවැත්ම

විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අඛණ්ඩව පැවතීම සඳහා සිය හැකියාව පිළිබඳව ඇගයීමක් සිදු කර ඇති අතර පූර්වේක්ෂණය කළ හැකි අනාගතයක් සඳහා සිය කටයුතු පවත්වා ගෙන යාම පිණිස සම්පත් පවතින බවට සෑහීමකට පත් වී ඇත. තව ද, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සැලකිය යුතු අවිනිශ්චිතතාවන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ පාලක සභාව නොදනී. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම ප්‍රවේශය යොදා ගෙන ඇත.

2.1.6 ගනුදෙනු කරන සහ ඉදිරිපත් කරන ව්‍යවහාර මුදල

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන එහි කෘත්‍ය හා වාර්තාකරණ ව්‍යවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ. සියලුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලේ අගයට වටයා ඉදිරිපත් කර ඇත.

2.1.7 ඇස්තමේන්තු සහ තීන්දු භාවිතා කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ දී ප්‍රතිපත්ති යෙදීමට සහ වාර්තා කරන ලද වත්කම් සහ වගකීම් ප්‍රමාණය, ආදායම් සහ වියදම් වලට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකරණයට අවශ්‍ය වේ. ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන ඓතිහාසික අත්දැකීම් සහ පවතින තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කරන විවිධ සාධක මත පදනම් වේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ ඒවාට පදනම් වූ උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ.

2.2 වැදගත් ගිණුම්කරන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන

විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගැනීමේ ක්‍රියාවලියේ දී කළමනාකාරීත්වය මඟින් මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගෙන ඇති අගයන් සඳහා වැඩිම බලපෑමක් සිදු කර ඇති පහත දැක්වෙන විනිශ්චයන් සිදු කර ඇත.

2.2.1 ඇස්තමේන්තු සහ උපකල්පන

විශ්වවිද්‍යාලය මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට පවතින පරාමිතීන් මත සිය උපකල්පන සහ ඇස්තමේන්තු පදනම් කරන ලදී. කෙසේ වුව ද, පවතින තත්වයන් සහ අනාගත වර්ධනයන් පිළිබඳ උපකල්පන, වෙළඳපල තත්ත්වයන් හෝ විශ්වවිද්‍යාලයේ පාලනයෙන් ඔබ්බට පැන නගින තත්වයන් අනුව වෙනස් විය හැකිය. එවැනි වෙනස්කම් ඒවා සිදු වන විට උපකල්පනවලින් පිළිබිඹු කරනු ලැබේ. ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ බැරකම් ප්‍රමාණයට වැදගත් ගැලපීම් ඇති කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති, අනාගතය සම්බන්ධ ප්‍රධාන උපකල්පන සහ වාර්තා කරන දිනයේ අවිනිශ්චිතතාවයේ අනෙකුත් ප්‍රධාන මූලාශ්‍ර පහත සාකච්ඡා කරනු ලැබේ.

(අ) නිර්මිත ප්‍රතිලාභ සැලසුම්

නිමිත ප්‍රතිලාභ සැලසුමේ පිරිවැය මෙන්ම වර්තමාන වටිනාකම: පාරිතෝෂිකය තීරණය කරනු ලබන්නේ ජීවගණක තක්සේරු කිරීම් භාවිතා කරමිනි. ජීවගණක තක්සේරුවට වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ අනෙකුත් වැදගත් අදාළ දත්ත පිළිබඳ උපකල්පන සිදු කිරීම ඇතුළත් වේ. සේවක ප්‍රතිලාභවල දිගුකාලීන ස්වභාවය හේතුවෙන්, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ. තවද, ඉහත ප්‍රධාන උපකල්පනවලට අදාළව කළමනාකාරීත්වය විසින් සිදු කරන ලද පරිදි උපකල්පනවල විස්තර සහ ඒවායේ සංවේදීතාව පිළිබඳ විශ්ලේෂණයක් සහ සංවේදීතා විශ්ලේෂණයේ ප්‍රතිඵල 2.3.14 සටහනේ දක්වා ඇත.

(ආ) දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් කාලය

සෑම වාර්තාකරණ දිනයකදීම, විශ්වවිද්‍යාලය මඟින් වත්කම්වල අවශේෂ අගයන්, ප්‍රයෝජනවත් කාලය සහ ක්ෂයවීම් ක්‍රම හෝ ක්‍රමක්ෂය පිළිබඳ සමාලෝචනයක් සිදු කරයි. මෙම අගයන්, අනුපාත සහ ක්‍රම තක්සේරු කිරීමේදී කළමනාකරණය මඟින් විනිශ්චය ක්‍රියාත්මක කරයි.

(ඇ) අස්පර්ශනීය වත්කම්වල ප්‍රයෝජනවත් කාලය

විශ්ව විද්‍යාලය එක් එක් වාර්තාකරණ දිනයට ඉතිරි වටිනාකම්, ප්‍රයෝජනවත් කාලය සහ වත්කම් ක්‍රමක්ෂ කිරීමේ ක්‍රම සමාලෝචනය කරයි; මෙම අගයන්, අනුපාත, ක්‍රම පිළිබඳ ඇස්තමේන්තු කිරීමේ දී කළමනාකාරිත්වය විසින් විනිශ්චය ක්‍රියාත්මක කරනු ලබන අතර එබැවින් ඒවා අවිනිශ්චිතතාවයට යටත් වේ.

(ඈ) අපවයවීම් තක්සේරු කිරීම

වත්කම්වල පොත් වටිනාකම ආපසු අය කර ගත නොහැකි විය හැකි බවට අදාළ සිදුවීම් හෝ තත්ත්වයේ සිදුවන වෙනස්කම්වලින් පෙනී යන්නේ නම් වත්කම්වල රැගෙන යන අගයන් අපවයවීම් සඳහා සමාලෝචනය කරනු ලැබේ. එවැනි දැක්වීමක් පවතින්නේ නම්, තිබෙන්නේ නම්, අපවයවීම් අලාභයක ප්‍රමාණය තීරණය කිරීම පිණිස වත්කමේ ආපසු අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. කිසියම් අපවයවීම් අලාභයක් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේ දීම, වත්කමක් හෝ වත්කම් කළඹක් අපවය වී ඇති බවට විෂයමූලික සාක්ෂි තිබේ ද යන්න විශ්වවිද්‍යාලය තක්සේරු කරයි. වත්කමක ආපසු ලබාගත හැකි ප්‍රමාණය එහි භාවිතයේ ඇති වටිනාකමට වඩා වැඩි වන අතර, මුදල්වල කාල වටිනාකම සහ වත්කමට විශේෂිත වූ අවදානම් පිළිබඳ වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු කරන සුදුසු වටිටම් අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්, වර්තමාන වටිනාකමට වටිටම් කරනු ලබයි.

2.3 වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති සාරාංශය

2.3.1 දේපළ, පිරියත හා උපකරණ

(අ) හඳුනා ගැනීම සහ මිනුම

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමට කිසියම් සමුච්චිත ක්ෂයවීම සඳහා අඩු කිරීම් සිදු කිරීමෙන් පසුව දරන ලද පිරිවැයට හෝ සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ සියලුම අයිතම මුල් අවස්ථාවේ දී පිරිවැයට වාර්තා කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අයිතම පසුව ප්‍රත්‍යාගනනය කරන විට එවැනි වත්කම්වල සියලුම පන්ති ප්‍රත්‍යාගනනය කරනු ලැබේ.

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ කලින් හඳුනා ගත් එම වත්කමේ ප්‍රත්‍යාගණන අඩුවීමක් ආපසු හැරවීමක් නොවන තාක් දුරට හැරුණු කොට වත්කමක් ප්‍රත්‍යාගණනය කළ විට එහි රැගෙන යන අගයේ කිසියම් වැඩිවීමක් ඍජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලබන අතර එවැනි අවස්ථාවක දී වැඩිවීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

එකම වත්කමක පෙර අතිරික්තයක් හිලව් කරන ඕනෑම ප්‍රත්‍යාගණන හිඟයක් ප්‍රත්‍යාගණන සංචිතයේ අතිරික්තය සම්බන්ධයෙන් සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල වියදමක් ලෙස හඳුනා ගෙන ඇති ඕනෑම වියදමක් සම්බන්ධයෙන් ඍජුව හිලව් කරනු ලැබේ.

විකිණූ වත්කම ආශ්‍රිත ඕනෑම ප්‍රත්‍යාගණන අතිරික්තයක් සමුච්චිත අතිරික්තයට හෝ හිඟයට මාරු කරනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අයිතම ප්‍රතිස්ථාපනය කළ විට, බැහැර කළ විට හෝ එහි භාවිතාවෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා ගනු ලබන්නේ නැත; වත්කම හඳුනා නොගැනීමෙන් මතුවන කිසියම් ලාභයක් හෝ අලාභයක් එකී වත්කම හඳුනා නොගන්නා වර්ෂය තුළ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

වත්කම්වල පොත් වටිනාකම ආපසු අය කර ගත නොහැකි විය හැකි බවට අදාළ සිදුවීම් හෝ තත්ත්වයේ සිදුවන වෙනස්කම්වලින් පෙනී යන්නේ නම් වත්කම්වල රැගෙන යන අගයන් අපවයවීම් සඳහා සමාලෝචනය කරනු ලැබේ. එවැනි දැක්වීමක් පවතින්නේ නම්, තිබෙන්නේ නම්, අපවයවීම් අලාභයක ප්‍රමාණය තීරණය කිරීම පිණිස වත්කමේ ආපසු අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. කිසියම් අපවයවීම් අලාභයක් මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ.

අයිතිය ඇති ගොඩනැගිලි විශ්වවිද්‍යාලයේ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන අතර ඒ අනුව ආයෝජන දේපළ අර්ථකථනයට ඇතුළත් නොවේ. භාවිතා කරනු ලබන ගොඩනැගිලි සහ ඉදිකිරීම් පසු කාලීන වැඩිදියුණු කිරීම් එකතු කිරීම, සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීම මඟින් ඉදිකිරීම් පිරිවැයට තක්සේරු කරනු ලැබේ. අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය වැඩි කරන හෝ ඉක්මවා යන ගොඩනැගිලි සහ ඉදිකිරීම් සම්බන්ධයෙන් සිදු කරන විශාල නවීකරණය කිරීම් සහ වැඩිදියුණු කිරීම් පිළිබඳ පසු කාලීන පිරිවැය, පිරිවැයට තක්සේරු කරනු ලැබේ.

හුවමාරු නොවන ගනුදෙනු හරහා අත්පත් කරගත් වත්කම් ඒවා අත්පත් කර ගත් දිනයට ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනා ගැනේ. දේපළ, පිරියත සහ උපකරණ යන්නට රජයේ ප්‍රදාන, ව්‍යාපෘති, පර්යේෂණ ප්‍රදාන, අභ්‍යන්තරව ජනනය කරන ලද අරමුදල් සහ පරිත්‍යාග යනාදිය හරහා අත්පත් කරගත් වත්කම් ඇතුළත් වේ. තෑගි සහ පරිත්‍යාග ලෙස ලැබුණු දේපළ, පිරියත සහ උපකරණවල වටිනාකම SLPSAS 11 අනුගමනය කරමින් හුවමාරු නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම ලෙස හඳුනාගෙන ඇත. අලුත්වැඩියා සහ නඩත්තු වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ දැරීමට සිදු වූ ලෙස හඳුනාගෙන ඇත.

තක්සේරු දෙපාර්තමේන්තුව 2020 දී (නව පරිපාලන ගොඩනැගිල්ල සහ දැනට අත්පත් කර ගනිමින් පවතින දේපල හැර) දේපල, ගොඩනැගිලි සහ මෝටර් රථ නැවත තක්සේරු කරන ලදී. 2021 දී, කාර්යාල උපකරණ, රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ සහ ගෘහ භාණ්ඩ සහ උපාංගවලට අදාළ අනෙකුත් වත්කම් නැවත තක්සේරු කරන ලදී. මෙයට අමතරව, 2023 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල 2023.01.01 දිනට කම්හල් සහ යන්ත්‍රෝපකරණ නැවත තක්සේරු කිරීමක් සහ ගැලපීමක් ඇතුළත් විය.

WP-KL-6080 යන ලියාපදිංචි අංකය සහිත මෝටර් රථයක් එම වසරේම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අත්පත් කර ගැනීමෙන් පසු 2022 දී තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් රුපියල් මිලියන 10 කට ලේඛනගත කර නැවත තක්සේරු කරන ලදී. WP-KC-3400 යන ලියාපදිංචි අංකය සහිත තවත් වාහනයක් 2025.01.09 වන දින රුපියල් මිලියන 9.3 කට නැවත තක්සේරු කරන ලදී. නැවත තක්සේරු කිරීමේ දිනය ගිණුම්කරණ වර්ෂයෙන් පසුව වැටෙන බැවින්, කිසිදු ගැලපීමක් සිදු කර නොමැත.

2022 සහ 2023 වසරවල දී සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස පහත සඳහන් වාහන ලැබී ඇත - 43-5982, NA-7543, 60-7068, LW-0703, 50-7755, 42-0508, KC-3400, PB-7047, 254-1179, LB-1909, GK-9639, සහ 64-2308 - මෙයට අමතරව, පිළිවෙලින් 2022 සහ 2023 වසරවල දී උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සහ සමාජ සවිබල ගැන්වීමේ සහ සමාජ සුභසාධන අමාත්‍යාංශයෙන් අංක KU-4329 සහ KA-9412 යන වාහන ලැබුණි. 2024 දී පශු සම්පත් සංවර්ධන සහ රාජ්‍ය යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන් අංක 65-5881 වාහනය ලැබුණි. මෙම වාහනවල අයිතිය පැවරීමේ ක්‍රියාවලිය තවමත් සිදුවෙමින් පවතී. මෙම වාහනවල අයිතිය නිල වශයෙන් විශ්වවිද්‍යාලයට පැවරීමෙන් පසු, වාහන නැවත තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතහන් කරනු ලැබේ. පරිත්‍යාග ලෙස ලැබූ වාහන බොහොමයක් භාරදෙන අවස්ථාවේ දී ධාවන මට්ටමේ නොතිබුණි. ඒ අනුව, අයවැය මුදල් වෙන් කිරීම මත පදනම්ව ඒවායේ අලුත්වැඩියා කටයුතු සිදු කර ඇත. අලුත්වැඩියා කටයුතු අවසන් වූ පසු අංක 43-5982, NA-7543, 60-7068, KE-4329, 65-5881 සහ KC-3400 යන වාහන ධාවන තත්ත්වයට පත් කර ඇත.

තවද, අංක 18-4563 දරන වාහනය සකසුරුවමින් අලුත්වැඩියා කළ නොහැකි බවට තීරණය කරන ලදී. එබැවින්, මෙම වාහනය සක්‍රීය භාවිතයෙන් ඉවත් කර, බැහැර කිරීම පිණිස තබා ගෙන ඇත.

(ආ) ක්ෂයවීම්

සින්නක්කර ඉඩම් හැරුණු කොට, වත්කම් ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය මත එම වත්කම්වල පිරිවැය කපා හැරීම සඳහා වාර්ෂිකව පහත සඳහන් ප්‍රමාණවලින් සරල රේඛීය පදනම මත මූල්‍ය ප්‍රතිඵල ප්‍රකාශනයට ක්ෂයවීම් ඇතුළත් කොට ඇත. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලය පහත දැක්වෙන පරිදි වේ:

වත්කම් කාණ්ඩය	ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් කාලය
ගොඩනැගිලි	වසර 20
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	වසර 10
උපකරණ හා යන්ත්‍රෝපකරණ	වසර 10
සවිකිරීම් සහ තිරවුරු	වසර 5
කාර්යාල උපකරණ	වසර 5
මෝටර් වාහන	වසර 5
පුස්තකාල පොත් හා වාරසඟරා	වසර 5
විද්‍යාගාර, ඉගැන්වීමේ උපකරණ	වසර 5
ලෝගු	වසර 5
පරිගණක උපකරණ/මෙවලම්**	වසර 5
ජෙනරේටර හා විදුලි සැපයුම් පද්ධති**	වසර 10
ජලාපවහන සහ මළාපවහන පද්ධති**	වසර 10
ක්‍රීඩා මෙවලම්/ අවශ්‍ය කරන දෑ*	වසර 4

****** වත්කමක් භාවිතය සඳහා ලබා ගැනීමට ඇති විට ක්ෂයවීම් ආරම්භ වන අතර එය බැහැර කළ විට හෝ ස්ථිර වශයෙන්ම ආපසු ගත් විට අවසාන වේ.

** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කළ අංක 09/2022 කොමිෂන් සභා වක්‍රලේඛය අනුව 2022.05.10 වැනි දිනයෙන් පසුව අත්කර ගත් වත්කම් 2022.05.10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්ෂය කරන ලදී.

(ඇ) පසු කාලීන වියදම්

පසු කාලීන වියදම් මුදල් බවට හරවනු ලබන්නේ වියදම් මඟින් විශ්වවිද්‍යාලයට එකතු වන කිසියම් අදාළ වත්කමක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභය හෝ සේවා විභවය වැඩි කරන්නේ නම් පමණි. එදිනෙදා සේවා සැපයීම සඳහා වූ පිරිවැය මූලික වශයෙන් ශ්‍රමය හා පරිභෝජන භාණ්ඩ සඳහා වැය වන පිරිවැය වන අතර සුළු කොටස්වල පිරිවැය ඇතුළත් විය හැකිය. මෙම වියදම්වල අරමුණ බොහෝවිට දේපළ, පිරියත හා උපකරණ "අළුත්වැඩියාව සහ නඩත්තුව" ලෙස විස්තර කරනු ලබන අතර මෙම වියදම් දරනු ලැබූ විට වියදමක් ලෙස මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගනී.

(ඇ) කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ පිරිවැයට ප්‍රකාශ කරනු ලැබේ. මුදල් බවට හැරවීමට අපේක්ෂාවෙන් ඇති ගොඩනැගිලි ඉදිකිරීම, ගොඩනැගිලි නවෝත්පාදන වැඩ, විශාල පිරියත හා යන්ත්‍රෝපකරණ හා පද්ධති ගොඩනැගීම මත දැරූ ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ. වාර්තාකරණ දිනයේ දී සම්පූර්ණ නොකළ නමුත් සිදු කළ ප්‍රාග්ධන වියදම් කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස වර්ගීකරණය කරනු ලැබේ. භාවිතය සඳහා ලබා ගත හැකි වූ පසු, කෙරී ගෙන යන ප්‍රාග්ධන වැඩ දේපළ, පිරියත සහ උපකරණ වෙත මාරු කරනු ලැබේ. එය පිරිවැය ලෙස දක්වා ඇති අතර ගොඩනැගිලි ඉදිකිරීම, ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු, ප්‍රධාන කම්හල් සහ යන්ත්‍රෝපකරණ සහ පද්ධති සංවර්ධනයට සෘජුවම සම්බන්ධ ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් ඇතුළත් වේ. සම්පූර්ණ වගකීම් විශ්වවිද්‍යාලය මඟින් මෙතෙක් පියවා නොමැතිවීම සහ විශ්ව විද්‍යාලය මඟින් පවරාගෙන නොමැති බැවින් මෙම වියදම් ප්‍රාග්ධනීකරණය බලාපොරොත්තු වේ.

(ඉ) ප්‍රාග්ධන අත්තිකාරම්

එක් එක් වාර්තා කරන දිනය වන විට ගෙවිය යුතුව ඇති දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම හෝ ඉදිකිරීම සඳහා ලබා දී ඇති අත්තිකාරම් ප්‍රාග්ධන අත්තිකාරම් ලෙස අනාවරණය කරනු ලැබේ. සම්පූර්ණ වගකීම් විශ්වවිද්‍යාලය මඟින් මෙතෙක් පියවා නොමැතිවීම සහ විශ්ව විද්‍යාලය මඟින් පවරාගෙන නොමැති බැවින් මෙම වියදම් ප්‍රාග්ධනීකරණය බලාපොරොත්තු වේ.

(ඊ) ප්‍රදානය කළ වත්කම්

ව්‍යාපෘතියක කොටසක් ලෙස සීමිත අරමුදල් හෝ විදේශ අරමුදල් සම්පාදක ව්‍යාපෘති හරහා දේපළ පිරියත සහ උපකරණ මිල දී ගන්නා විට ව්‍යාපෘතිය අවසන් කරන තෙක් හෝ ව්‍යාපෘතිය අවසානයේ දී වත්කම ප්‍රතිලාභියාට භාර නොදෙන්නේ නම් හෝ මුල් දායකයාට ආපසු ලබා දෙන්නේ නම්, වත්කමේ පිරිවැය දේපළ පිරියත සහ උපකරණවලට ඇතුළු නොකරයි.

(එ) විදේශීය අරමුදල් ව්‍යාපෘති යටතේ අත්කර ගත් වත්කම්

උසස් අධ්‍යාපනය ව්‍යාප්තිය සහ සංවර්ධන මෙහෙයුම් වේගවත් කිරීම (AHEAD) 2018 වර්ෂය අවසානයේ දී ක්‍රියාත්මක කළ සමස්ත දිවයිනේම උසස් අධ්‍යාපන අංශයට අනුග්‍රහය දැක්වීම සඳහා වූ නවතම සංවර්ධනය ඉලක්ක කර ගත් ව්‍යාපෘතිය වේ.

ඒ අනුව, AHEAD ව්‍යාපෘතිය යටතේ විශ්වවිද්‍යාලයට පහත දැක්වෙන ප්‍රදාන ලැබී ඇති අතර 2021 සිට 2023 දක්වා දේපළ, පිරියත සහ උපකරණ මිල දී ගෙන ඇත.

විස්තර	වෙන්කිරීම් රු.	වියදම් රු.	%	
STEM ව්‍යාප්ති උපකරණ සිවිල්	61,956,000.00	60,995,833.01	98.45	%
ELTAS-ELSE පියය	29,913,250.00	27,372,289.19	91.51	%
කලාවන් සඳහා IT	8,750,000.00	8,746,428.60	99.96	%
එකතුව	**100,619,250.00**	**97,114,551.00**	96.52	%

එයට අමතරව, 2023 වර්ෂය තුළ දී තාක්ෂණික අයිතම/ ගෘහභාණ්ඩ අයිතම ප්‍රසම්පාදනය කිරීම සහ විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පහසුකම් ඉහළ නංවීම සඳහා AHEAD ව්‍යාපෘතිය හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පහත දැක්වෙන ප්‍රදාන වෙන් කර ඇත.

විස්තරය	වෙන්කිරීම් රු.	වියදම් රු.	%	
සමාජ සංනිදියා මධ්‍යස්ථානයට මූල්‍ය සහාය	1,000,000.00	968,922.50	96.89	%
ක්‍රීඩා පහසුකම් ඉහළ නැංවීම සඳහා මූල්‍ය සහාය	5,000,000.00	4,992,315.00	99.85	%

AHEAD ප්‍රදාන යටතේ අත්කර ගත් දේපළ, පිරියත සහ උපකරණ ව්‍යාපෘතියේ සිට විශ්වවිද්‍යාලයට මාරු කර ඇති අතර 2023.01.01 වැනි දිනට ශුද්ධ පොත් වටිනාකම අනුව වාර්තාකර ඇත. වත්කම්වල පිරිවැය මත පදනම්ව එක් එක් වත්කමේ ඉතිරි ප්‍රයෝජනවත් කාලයට අනුකූලව ක්ෂයවීම් අය කර අයකර ගෙන තිබේ.

ඉහත ප්‍රදාන යටතේ අත්කර ගත් දේපළ, පිරියත සහ උපකරණ 2023 වර්ෂය තුළ දී විශ්වවිද්‍යාලයට වාර්තා කර ඇති අතර වත්කම්වල පිරිවැය මත පදනම්ව එක් එක් වත්කමේ ඉතිරි ප්‍රයෝජනවත් කාලයට අනුකූලව ක්ෂයවීම් අයකර ගෙන තිබේ.

තවද, 2024 දී අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRDP) යටතේ රු. 19,925,809.49 ක වත්කම් විශ්වවිද්‍යාලයට ලැබුණි. මෙම වත්කම් 2024 දෙසැම්බර් 31 වන විටත් විශ්වවිද්‍යාලයට සම්පූර්ණයෙන්ම භාර දී නොනිබුණි.

(ඒ) අත්කර ගැනීමේ ක්‍රියාවලිය යටතේ පවතින ඉඩම්

විශ්වවිද්‍යාලය අනාගත වැඩිදියුණු කිරීම් සිදු කිරීම පිණිස ප්‍රධාන විශ්වවිද්‍යාලයට යාබදව ඇති හිස් ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2010 වර්ෂයේ දී අත්කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර 2013 සැප්තැම්බර් 3 වැනි දින අංක 1826/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 38 (අ) වගන්තිය පළ කරන ලදී. ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉල්ලීම මත, විශ්වවිද්‍යාලය ඉඩම් අයිතිකරුවන් සඳහා වන්දි ලබා දෙමින් ඇත. ඉහත සඳහන් කළ ඉඩම් තවමත් නිරවුල් කර ගෙන නොමැත. 2024 දෙසැම්බර් 31 වන විට රු. 7,638,500.68 ක මුදලක් බෙදා දී ඇත.

(ඓ) බදු කොන්දේසි මත ලබා දී ඇති ඉඩම්

වසර තුළ දී විශ්වවිද්‍යාලය මඟින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් (ATM/CDM) ස්ථාපනය කිරීම සඳහා ඉඩමෙන් කොටසක් එකඟ වූ මාසික කුලියක් යටතේ මහජන බැංකුවට ලබා දී ඇත. මෙම දේපල කුලී උපයා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම සඳහා (හෝ එම කාර්යයන් දෙකම සඳහා) තබා නොගන්නා බැවින්, ආයෝජන දේපළ යටතේ වර්ගීකරණය කර නොමැති අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළක්, පිරිවිතක් සහ උපකරණයක් ලෙස පිළිගැනේ.

2.3.2 අස්පර්ශණීය වත්කම්

යම් වත්කමක පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි වන්නේ නම් සහ එයට ආවේණික අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් පමණක් එය අස්පර්ෂණීය වත්කමක් ලෙස හඳුනා ගන්නා අතර සියලුම අස්පර්ෂණීය වත්කම් ඇස්තමේන්තුගත ජීවිත කාලය පුරාවට ක්‍රමක්ෂය කරනු ලැබේ. අස්පර්ෂණීය වත්කම්වල ප්‍රධාන පන්තිවල ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත දැක්වෙන පරිදි ඇස්තමේන්තු කර ඇත.

වත්කම	වර්ෂ
මෘදුකාංගය – අභ්‍යන්තරව ගොඩනඟන ලද	5
මෘදුකාංගය – බාහිරින් අත්කර ගත්	5
මෘදුකාංගය – බලපත්‍ර අත්කර ගත්	5

අත්කර ගත් පරිගණක මෘදුකාංග බලපත්‍ර අදාළ මෘදුකාංගය අත්කර ගැනීමට සහ භාවිතයට ගැනීමට දරන ලද පිරිවැය මත පදනම්ව ප්‍රාග්ධනීයකරනු ලැබේ. බාහිරින් මිල දී ගත් මෘදුකාංග හෝ මෘදුකාංග බලපත්‍ර එක් ඒකකයක් සඳහා රු. 20,000/-ක් හෝ ඊට වැඩි පිරිවැයක් තිබෙන්නේ නම් ඒවා වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. SLPSAS 20 යටතේ හඳුනා ගැනීමේ නිර්ණායක සම්පූර්ණ කරන්නේ නම් පමණක් විශ්වවිද්‍යාලයේ භාවිතය සඳහා ගොඩනඟන ලද මෘදුකාංගයක් ආශ්‍රිත ඍජුව දරන ලද පිරිවැය අස්පර්ෂණීය වත්කම් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. අභ්‍යන්තරව ගොඩනඟන ලද මෘදුකාංගවලට රු. 250,000/-ක් හෝ ඊට වැඩි පිරිවැයක් තිබෙන්නේ නම්, ඒවා වත්කමක් ලෙස හඳුනා ගනු ලැබේ. පුනරාවර්තන ස්වභාවයේ ප්‍රාග්ධන ප්‍රදාන මත දරන ලද ව්‍යයදම් වර්ෂය තුළ සිදු කළ ව්‍යයදමක් ලෙස හඳුනා ගෙන ඇත.

වර්ෂය තුළ දී පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වැය කළ ව්‍යයදම් සහ ධාරක මුදල් SLPSAS 20 හි දක්වා ඇති හඳුනා ගැනීමේ නිර්ණායක සම්පූර්ණ නොකරන බැවින් ව්‍යයදමක් ලෙස හඳුන්ගෙන ඇත.

2.3.3 මානව ප්‍රාග්ධන සංවර්ධනය

විශ්වවිද්‍යාලයේ මානව ප්‍රාග්ධනයේ සංවර්ධනයට ඍජුවම සම්බන්ධ වන පිරිවැය මූලිකවම ප්‍රාග්ධන ව්‍යයදම් ලෙස වර්ග කෙරේ. කෙසේවුව ද මෙම පිරිවැය පුනරාවර්තන ස්වභාවය හේතුවෙන් කාල සීමාව තුළ පුනරාවර්තන ව්‍යයදම් ලෙස හඳුනාගෙන ඇත.

2.3.4 දිගු කාලීන, මැදි කාලීන සහ කෙටි කාලීන ආයෝජන

ස්ථාවර තැන්පතුවල ආයෝජන ගනුදෙනු මිලට හඳුනා ගනු ලබන අතර ලැබූ පොළිය සමඟ පිරිවැයට අදාළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ නිරූපණය කරනු ලැබේ. සියලුම ස්ථාවර තැන්පතු රාජ්‍ය බැංකුවල සිදු කර තිබේ. ලැබූ පොළිය හෝ වසර සඳහා වූ ආයෝජනවලින් ලැබෙන පොළිය වසර ඇතුළත එවැනි ආයෝජන සඳහා බැංකුවෙන් ප්‍රකාශිත අනුපාතය මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත. අත්පත් කරගත් දින සිට මාස තුනකට වඩා වැඩි කල් පිරෙන ආයෝජන දිගුකාලීන ආයෝජන ලෙස සැලකේ. කෙටි කාලීන ආයෝජන යනු මාස තුනක හෝ ඊට අඩු කල්පිරීමක් සහිත තැන්පතු නියෝජනය කරන අතර, වටිනාකමේ වෙනස්වීම්වල නොසැලකිය යුතු අවදානමකට යටත්ව, පිරිවැය සහ ලැබිය යුතු පොළිය මත සිදු කරනු ලැබේ. ස්ථාවර තැන්පතුවල ආයෝජන ගණුදෙණු මිලට හඳුනාගනු ලබන අතර ඒවා පිරිවැය සහ ලැබිය යුතු පොළිය මත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශවලින් පිළිබිඹු වේ. සියලුම ස්ථාවර තැන්පතු රාජ්‍ය බැංකු තුළ ඇත. එම ආයෝජනවලින් ලැබුණු හෝ ලැබිය යුතු පොලිය වර්ෂය තුළ එම ආයෝජන සඳහා බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද අනුපාතිකය පිළිබඳ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දී හඳුනාගෙන ඇත.

2.3.5 වත්කම් අපවයවීම

වාර්තා කරන දිනය වන විට, එම වත්කම්වල අලාභ හානි සිදුවී ඇති බවට යම් ඇඟවීමක් තිබේ ද යන්න තීරණය කිරීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ සමාලෝචනය කෙරේ. සිදුවිය හැකි අපවයවීමක් පිළිබඳ ඇඟවීමක් තිබේ නම්, බලපෑමට ලක් වූ කිසියම් වත්කමක (හෝ අදාළ වත්කම් සමූහයක) අයකර ගැනීමේ හැකියාව ඇස්තමේන්තු කර, එහි රැගෙන යන මුදල සමඟ සංසන්දනය කෙරේ. ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදල අඩු නම්, රැගෙන යන මුදල එහි ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදලට අඩු කරනු ලබන අතර, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ අපවයවීම් අලාභයක් ක්ෂණිකව හඳුනාගනු ලැබේ.

අපවයවීම් අලාභයක් පසුව ආපසු හැරවූයේ නම්, වත්කමේ (හෝ අදාළ වත්කම් සමූහයේ) රැගෙන යන මුදල, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ කිසිදු හානියක් පාඩුවක් ක්ෂණිකව හඳුනාගෙන නොතිබුනේ නම් තීරණය කළ හැකිව තිබූ අගය ඉක්මවා නොව, එහි ආපසු ලබාගත හැකි මුදලේ සංශෝධිත ඇස්තමේන්තුවට වැඩි කරනු ලැබේ (ඉන්වෙන්ටරි සම්බන්ධයෙන් වන විට සම්පූර්ණ කිරීම සහ විකිණීම සඳහා අලෙවි මිලෙන් පිරිවැය අඩු කරනු ලැබේ).

2.3.6 භාණ්ඩ ලේඛන (ගබඩා අත්තිකාරම්)

විශ්වවිද්‍යාලයේ නඩත්තුව සඳහා භාවිතා කිරීමට අවශ්‍ය කරන, ගබඩාවල තබා ඇති ලිපි ලේඛන අයිතම, සැපයුම් සහ වෙනත් ද්‍රව්‍යවල වටිනාකම බඩු වට්ටෝරුවලට ඇතුළත් වේ. ප්‍රධාන ගබඩාවල සහ නඩත්තු ගබඩාවල ඇති සියලුම තොග සම්බන්ධයෙන් වෙන වෙනම වාර්ෂික භෞතික බඩු ලේඛන පවත්වනු ලැබේ. වර්ෂය තුළ දී නඩත්තු ගබඩාවල ආරම්භක සහ අවසාන ශේෂයන් හඳුනා ගෙන, වෙන්ව වාර්තා කරනු ලැබේ. කිසිදු බඩු වට්ටෝරුවක් වගකීම් සඳහා ඇපකරයක් ලෙස සලකනු නොලැබේ. භාණ්ඩ ලේඛන අඩුම පිරිවැය හෝ ශුද්ධ හඳුනාගත හැකි අඩුම වටිනාකම මත වටිනාකම් දක්වනු ලැබේ. භාණ්ඩ ලේඛණවල එක් එක් කාණ්ඩයේ පිරිවැය FIFO ක්‍රමය මඟින් තීරණය කරනු ලැබේ.

2.3.7 වෙනත් ලැබිය යුතු දේ

එක් එක් වාර්තාකරණ කාලසීමාව අවසානයේ දී, අපවයවීම් සඳහා අනෙකුත් ලැබිය යුතු මුදල් පිරිවැයෙන් දීමනා අඩු කිරීම යටතේ ඇගයීමට ලක් කෙරේ. ලැබිය යුතු මුදල් ආපසු ලබාගත නොහැකි බව පෙන්නුම් කරන විෂයමූලික සාක්ෂි තිබෙදැයි තක්සේරු කිරීම සඳහා සමාලෝචනයක් පවත්වනු ලැබේ. එවැනි සාක්ෂි තිබේ නම්, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයේ අපවයවීම් අලාභයක් වහාම හඳුනා ගැනේ.

2.3.8 කාර්ය මණ්ඩලයට ණය සහ අත්තිකාරම්

ණය සහ අත්තිකාරම් යනු විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලයට ඇපයක් සහිතව ලබා දී ඇති අරමුදල් වේ. ආපසු ගෙවීම් සේවකයින්ගේ මාසික වැටුපෙන් අඩු කරනු ලබන අතර, සේවකයෙකු ඉවත්ව ගියහොත්, ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් ශේෂයෙන් හිඟ මුදල් සම්පූර්ණයෙන්ම අය කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස බොල් ණය අයකර ගැනීමට ප්‍රතිපාදන සලසා නැත.

2.3.9 මුදල් හා මුදල් සමාන දෑ

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇති මුදල් හා මුදල් සමාන දෑ යන්නට බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් ඇතුළත් වේ. වක්‍ර ක්‍රමය යටතේ සකස් කරනු ලබන මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ යන්නට බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් ඇතුළත් වන අතර ඉහත විස්තර කළ පරිදි කෙටි කාලීන තැන්පතු විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණයේ අන්තර්ගත කොටසක් ලෙස සලකනු ලැබේ.

2.3.10 බැදුම්කර උල්ලංඝනය කිරීම යටතේ ලැබිය යුතු මුදල්

විශ්වවිද්‍යාලය සඳහා වූ සිය ගිවිසුම්ගත අනිවාර්ය සේවා සම්පූර්ණ නොකර ඉල්ලා අස් වූ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙක් බැඳුම්කර උල්ලංඝනය කිරීමට යටතේ විශ්වවිද්‍යාලයට රු. 17,928,351.80ක් ගෙවිය යුතුව ඇත. 2024 ජනවාරි 29 දින නිකුත් කළ අංක 01/2024 දරන වක්‍රලේඛය අනුව නිශ්චය කළ කාලයක් ඇතුළත ගෙවීමට නොහැකි තැනැත්තන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් 2023.12.31 වැනි දිනයට ලබා දී ඇති 14.21% ක සාමාන්‍ය බර සහිත ණයදීමේ අනුපාතයට (AWLR) ගණනය කළ අතිරේක පොලියක් අය කරනු ලැබේ. මෙම වක්‍රලේඛයේ විධිවිධාන 2024.01.01 දින සිට බලාත්මක වන අතර 2024 සිට අවශ්‍ය ගැලපීම් සිදු කරනු ලැබේ.

2.3.11 සමුච්චිත අරමුදල (අතිරික්තය) - පුනරාවර්තන

සමුච්චිත අතිරික්තය - පුනරාවර්තනයට වර්ෂය තුළ එකතු වූ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ අතිරික්තයන් සහ හිඟ සහ වර්ෂය තුළ එකතු කළ පොදු සංචිතවල මාරු කළ ශේෂය ඇතුළත් වේ.

2.3.12 විශ්වවිද්‍යාල අරමුදල

i. සීමා කළ අරමුදල් සහ ප්‍රදාන

නිශ්චිත ව්‍යාපෘතියක් හෝ ක්‍රියාකාරකමක් සඳහා ප්‍රදාන හෝ පරිත්‍යාග ලැබුණු විට, අරමුදල් සීමිත අරමුදල් ගිණුමක පවත්වා ගනු ලබයි. භාවිතයට නොගත් ඕනෑම මුදල් ප්‍රමාණයක් අදාළ අරමුදල් ගිණුම්වල පවතින අතර ඒවා අවශ්‍ය වන තෙක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල් සහ සංචිත යටතේ ඇතුළත් කරනු ලබයි. අනුමත ප්‍රදානයක් සඳහා වන වියදම් ලැබුණු ආදායම් ඉක්මවා ගියහොත් සහ ඉතිරි ශේෂය ලැබෙන බවට සාධාරණ නිශ්චිතභාවයක් තිබේ නම්, අදාළ හිඟය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ ලැබිය යුතු දෙයක් ලෙස හඳුනා ගැනේ.

ii. නියම කළ අරමුදල් (Designated Funds)

පාලක සභාවේ අනුමැතිය ඇතිව, නිශ්චිත කාර්යයක් සඳහා විශ්වවිද්‍යාලය විසින් නම් කරන ලද ඕනෑම අරමුදලක් නියම කළ අරමුදලක් ලෙස හඳුනා ගැනේ. භාවිතයට නොගත් අරමුදල් ඒවායේ අදාළ අරමුදල් ගිණුම්වල පවතින අතර ඒවා අවශ්‍ය වන තෙක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල් සහ සංචිත යටතේ ඇතුළත් කරනු ලබයි.

iii. පරිත්‍යාග අරමුදල් (Endowment Funds)

වත්කම් පරිත්‍යාගයක් ලෙස ලැබුණු විට, එවැනි වත්කම්වලින් උපයන ආදායම පමණක් හඳුනාගෙන ආදායම ලෙස භාවිතා කළ හැකිය. අදාළ ගිවිසුම හෝ යෝජනාව මගින් වෙනත් ආකාරයකින් නිශ්චිතව දක්වා නොමැති නම්, මෙම පරිත්‍යාග ආයෝජනවලින් උපයා ගන්නා ආයෝජන ආදායම සහ අනෙකුත් ලාභ සුදුසු අරමුදල්වලට වෙන් කරනු ලැබේ. කලින් තැන්පතු යටතේ පැවති රන් පදක්කම් සහ ශිෂ්‍යත්ව වැනි පරිත්‍යාග අරමුදල් නැවත වර්ගීකරණය කර ඇති අතර වර්තමානයේ දී සමුච්චිත අරමුදල් සහ සංචිත තුළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පරිත්‍යාග අරමුදල් යටතේ ඉදිරිපත් කර ඇත.

2.3.13 ප්‍රතිපාදන

අතීතයේ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට වර්තමාන නෛතික හෝ සාධනීය වගකීමක් ඇති විට ප්‍රතිපාදන පිළිගනු ලබන අතර, එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි අතර ප්‍රමාණය පිළිබඳ විශ්වාසනීය ඇස්තමේන්තු කළ හැක. විශ්ව විද්‍යාලය යම් ප්‍රතිපාදනයක් හෝ සියල්ල ප්‍රතිපූරණය කිරීමට අපේක්ෂා කරන විට, ප්‍රතිපූරණය වෙනම වත්කමක් ලෙස පිළිගනු ලබන නමුත් එසේ සිදු කරනු ලබන්නේ ප්‍රතිපූරණය ස්ථීර වූ විට පමණි. කිසියම් ප්‍රතිපාදනයකට අදාළ වියදම් ඕනෑම ප්‍රතිපූරණයක ශුද්ධ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා ප්‍රතිපාදන සියල්ල ගිණුම්ගත කර ඇත.

2.3.14 උපචිත වියදම්

උපචිත වියදම් විශ්වවිද්‍යාලය සිය මෙහෙයුම් සිදු කරන විට කාලයත් සමඟ එකතු වන වගකීම් නියෝජනය කරන අතර වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ පියවීමට අපේක්ෂා කෙරේ.

2.3.15 වෙනත් ගෙවිය යුතු දේ

අනෙකුත් ගෙවිය යුතු දෑ සැපයුම්කරුවන්ට ලබා දී ඇති සාමාන්‍ය ණය කොන්දේසි මත ඇති බැඳීම් වන අතර පොලී දරන්නේ නැත. වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ ගෙවීමට නියමිත නම් මෙම ගෙවිය යුතු වත්මන් වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

2.3.16 සේවක ප්‍රතිලාභ

(i). නිර්මිත ප්‍රතිලාභ සැලසුම්

සංශෝධිත පරිදි විශ්වවිද්‍යාල පනතේ 75 (1) වගන්තිය සහ අංක 19/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව 2023.01.01 සිට ක්‍රියාත්මක වන පරිදි ගුරුවරුන් හැරුණු කොට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සේවකයන්ගේ අනිවාර්ය විශ්‍රාමයාමේ වයස අවුරුදු 60 වේ. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයට අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 වන තෙක් සේවය කළ හැකිය. ඉහත සේවා කාලය 2023 වර්ෂය සඳහා පාරිතෝෂික දීමනා සඳහා පදනමක් ලෙස සලකනු ලැබේ.

කෙසේවුව ද, ආණ්ඩුව මඟින් තීරණය කරන ලද පරිදි, 2021.12.31 වැනි දින වන විට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ගුරුවරුන් හැරුණු කොට අනෙකුත් සේවකයින්ගේ අනිවාර්ය විශ්‍රාමයාමේ වයස අවුරුදු 62ක් විය.

විශ්වවිද්‍යාලය මඟින් සුදුසුකම් ඇති සියලු සේවකයින් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ දක්වා ඇති පරිදි ප්‍රතිපාදන සැලැස්මක් අනුගමනය කරනු ලැබේ.

කෙසේවුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනත යටතේ වගකීම් පැන නඟින්නේ අවම වශයෙන් වසර පහක අඛණ්ඩ සේවාවක් සම්පූර්ණ කළ සේවකයින් සඳහා පමණක් වන අතර වගකීම් සඳහා බාහිරව අරමුදල් සපයනු නොලැබේ. වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම-නොවන වගකීම් යටතේ කාණ්ඩගත කර ඇත.

2023.12.31 වැනි දිනට පාරිතෝෂික වෙන්කිරීම් පිළිබඳ ආයුගණක තක්සේරුවක් වෘත්තීය ආයුගණකයින් විසින් සිදු කරන ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල (SLPSAS 19) නිර්දේශ කර ඇති "ව්‍යාපෘති ඒකක පිරිවැය ක්‍රමය" භාවිතා කරමින් තක්සේරු කිරීම නිමා කරන ලදී.

තක්සේරුවේදී භාවිතා කළ ප්‍රධාන ආයුගණක උපකල්පන පහත දැක්වෙන පරිදි වේ.

• කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාත	- අධ්‍යයන කාර්ය මණ්ඩලය: 2.00%, අනධ්‍යයන කාර්ය මණ්ඩලය: 2.00% වාර්ෂිකව වයස අවුරුදු 54 දක්වා සහ පසුව ශූන්‍ය
• සාමාන්‍ය විශ්‍රාමයාමේ වයස	- අධ්‍යයන කාර්ය මණ්ඩලය: වසය අවුරුදු 65, අනධ්‍යයන කාර්ය මණ්ඩලය: අවුරුදු 60 (නිශ්චිත විශ්‍රාමයාමේ වයසට වැඩි වයසේ පසුවන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ ඊළඟ උපන් දිනය එළැඹෙන දිනයේ දී විශ්‍රාම යාමට නියමිත බවට උපකල්පනය කරනු ලැබීය.)
• වට්ටම් අනුපාතය	: වාර්ෂිකව 11.00%
• වැටුප් වැඩිවීමේ අනුපාත	- මූලික වැටුප සහ දීමනා: අධ්‍යයන **10**.00% වාර්ෂිකව අනධ්‍යයන **8**.00% වාර්ෂිකව (දත්තවල නිශ්චිතව දක්වා ඇති සෑම වර්ෂයකම මාසයේ දී වැටුප් වර්ධක නියමිත බවට උපකල්පනය කරනු ලැබේ)
• විශ්‍රාම පාරිතෝෂික සූත්‍රය	- අඩ මසක වැටුප සහ දීමනා, අවමය වර්ෂ 5ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් සඳහා

(ii). **නිර්මිත දායකත්ව සැලසුම්**

විශ්වවිද්‍යාලයේ සියලුම සේවකයින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට අනුකූලව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සාමාජිකයින් වෙති. විශ්වවිද්‍යාලය මූලික වැටුපෙන් සහ දීමනාවලින් 15%ක් එම අරමුදලට දායකත්වය දක්වයි. තව ද 1999 සැප්තැම්බර් මස 01වැනි දින හෝ ඊට පසු බඳවා ගත් සේවකයින් මෙම දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලයේ සාමාජිකයින් වෙති. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට සිදු කරන 15%ක දායකත්වයෙන් 8%ක් මාසිකව දායකත්ව විශ්‍රාම වැටුප් අරමුදලට මාරු කරනු ලැබේ. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

විශ්වවිද්‍යාලය සෑම සේවකයෙක්ගේම වැටුප් සහ දීමනාවලින් 3%ක් සේවක භාර අරමුදලට දායක කරනු ලබන අතර මෙම අරමුදල නිර්මිත දායකත්ව සැලැස්ම යටතේ වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිර්මිත දායකත්ව සැලැසුම් වෙත සිදු කරන දායකත්වය සඳහා වූ බැඳීම් ඒවා මතු වන විට සහ මතු වන අවස්ථාවල දී මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයේ වියදමක් ලෙස වට්ටම් නොකළ පදනම මත හඳුනා ගනු ලැබේ.

2.3.17 බදු අය කිරීම්

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය අනුව වි විශ්වවිද්‍යාලය බදු ගෙවීමෙන් නිදහස් කර ඇත.

2.3.18 වගකීම් සහ අවිනිශ්චිත වගකීම්

සියලුම වැදගත් වගකීම් සහ අවිනිශ්චිත බැරකම් සැලකිල්ලට ගනු ලබන අතර අවශ්‍ය අවස්ථාවල දී මෙම මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

(අ) ශ්‍රේෂ්ඨාධිකරණ නඩු කටයුතු

(i) SC (F/R) අංකය 249/2021 නඩුකරය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරියක් එම සේවයේ නිරතව සිටිය දී දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ (PGIIM) සිය අධ්‍යාය කටයුතු සම්පූර්ණ කිරීම සඳහා වැටුප් සහිත නිවාඩු ප්‍රදානය කරන ලෙසට ඉල්ලමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කර ඇති නඩුවකි. කෙසේවුව ද, නඩු තීණ්දුව මත මූල්‍ය වන්දි සහ නීති ගාස්තු ගෙවීමට සිදු වනු ඇත. 2024.10.16 වැනි දින නඩුව ඉල්ලා අස් කර ගන්නා ලදී. 2024 වර්ෂය තුළ කිසිදු ගෙවීමක් සිදු කර නොමැත.

(ii) SC (SPL.) L.A අංකය 245/2020 නඩුකරය කථිකාචාර්යවරයෙක් අභියාචනාධිකරණය මඟින් ලබා දුන් තීණ්දුවකට එරෙහිව ගොනු කර ඇති නඩුවකි. ඔහු ප්‍රමාණවත් ලකුණු ලබා ගෙන නොමැති බවට සඳහන් කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කළ 1997 දෙසැම්බර් 12 වැනි දිනැති අංක 723 දරන චක්‍රලේඛයේ සඳහන් කර ඇති බඳවා ගැනීමේ පටිපාටියට අනුව තමාව ආශ්‍රිත මහාචාර්ය/ මහාචාර්ය තනතුරට උසස් කිරීම ප්‍රදානය නොකිරීම සම්බන්ධයෙන් කැළණිය විශ්වවිද්‍යාලය විසින් ගන්නා ලද තීරණයට එරෙහිව එකී කථිකාචාර්යවරයා අභියාචනය කිරීම මෙම මූලික නඩුකරයේ නඩු නිමිත්ත වේ. කෙසේවුව ද, නඩු තීණ්දුව මත මූල්‍ය වන්දි සහ නීති ගාස්තු ගෙවීමට සිදු වනු ඇත. 2024.12.31 වැනි දින වන විට බැඳීම් නිරාකරණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ විභව සේවා අන්තර්ගත සම්පත් පිටතට ගලා යාම අවශ්‍ය කිරීමක් සිදු නොවීය. කිසිදු විධිවිධානයක් හඳුනා නොගනී.

(iii) SC (F/R) අංකය 216/2020 නඩුකරය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දී සිදු වී ඇති නවක වධය සිදුවීමක් මත ගොනු කළ නඩුවක් වන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විෂයපථයට ඇතුළත් වන මෙම විශ්වවිද්‍යාලය ඇතුළු සියලුම විශ්වවිද්‍යාල 16 ම මෙම නඩුකරයේ වගඋත්තරකරුවන් කර ඇත. 2024.12.31 වැනි දින වන විට බැඳීම් නිරාකරණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ විභව සේවා අන්තර්ගත සම්පත් පිටතට ගලා යාම අවශ්‍ය කිරීමක් සිදු නොවීය. කිසිදු විධිවිධානයක් හඳුනා නොගනී.

(ආ) දිස්ත්‍රික්ක උසාවිය සහ සිවිල් අභියාචනාධිකරණය ඉදිරියේ ඇති නඩු කටයුතු

(iv) නඩු අංක 6412/M නඩුකරය මෙම ආයතනයේ මීට පෙර නිබූ ආයතනය වන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ හිටපු අධ්‍යක්ෂවරයෙක් එම ධූරය දරන කාලය තුළ සිදු කළ නිල කටයුත්තක් සම්බන්ධයෙන් එම අධ්‍යක්ෂවරයාට එරෙහිව කථිකාචාර්යවරයෙක් විසින් ගොනු කළ නඩුකරයක් වේ. මෙම නඩුවෙන් රු. 50,000,000/-ක වන්දියක්, නෛතික පොලිය සහ නීති ගාස්තු ඉල්ලා ඇත. කෙසේවුව ද, නඩු තීණ්දුව මත මූල්‍ය වන්දි සහ නීති ගාස්තු ගෙවීමට සිදු වනු ඇත. 2024.12.31 වැනි දින වන විට බැඳීම් නිරාකරණය කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ විභව සේවා අන්තර්ගත සම්පත් පිටතට ගලා යාම අවශ්‍ය කිරීමක් සිදු නොවීය. කිසිදු විධිවිධානයක් හඳුනා නොගනී.

(ඇ) මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ ඇති නඩු කටයුතු

2024 ඔක්තෝබර් 10 වන දින පැවති පාලක සභාවේ 39 වන රැස්වීමේදී, පාලක සභාවට වාර්තා කරන ලද කරුණක් මත පදනම්ව, විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුගේ (I ශ්‍රේණිය) ශාස්ත්‍රපති (එක්සත් රාජධානියේ පෝර්ට්ස්මූත් විශ්ව විද්‍යාලය) සහ ආචාර්ය උපාධි (කැන්ටබරි විශ්ව විද්‍යාලය, නවසීලන්තය) සුදුසුකම් මූලික වශයෙන් නොමැති වීම සම්බන්ධයෙන් පොලිස් පැමිණිල්ලක් ගොනු කිරීමට නියෝග කළේය. නඩුව විභාග වෙමින් පවති.

2.4 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනය

2.4.1 ආදායම හඳුනා ගැනීම

විශ්වවිද්‍යාලය 2022.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි SLIPSAS II වෙළඳමේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති-හුවමාරු නොකරන ගනුදෙනුවලින් ආදායම (බදු සහ මාරු කිරීම්) SLIPAS II අනුව ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් විකල්ප ගිණුම්කරණ ප්‍රතිකාර යොදා ගෙන ඇති අතර පසු ගිය වර්ෂයේ සංඛ්‍යා ලේඛන නැවත වර්ගීකරණයන් ඒ අනුව සිදු කර ඇත.

(අ) හුවමාරු ගණුදෙනුවලින් ආදායම

ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන ප්‍රමාණයට සහ එය විශ්වාසදායක අන්දමින් මැනිය හැකි තාක් දුරට හුවමාරු ගනුදෙනුවලින් ආදායම හඳුනා ගනී. ශිෂ්‍යයින්ගෙන් ලැබූ බඳවා ගැනීමේ ගාස්තු, වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු, නේවාසිකාගාර ගාස්තු සහ වෛද්‍ය ගාස්තු, දේපළවලින් ලැබෙන කුලිය, තොග අලෙවිය, ණය සහ අත්තිකාරම්වලින් ලැබෙන පොලිය, ආයෝජනවලින් ලැබෙන පොලිය ආදිය ලියාපදිංචිය නිමා කරන අවස්ථාවේ ආදායම සහ ලැබීමේ පදනම මත ආදායම ලෙස හඳුනා ගනී.

විභාග, සම්මන්ත්‍රණ, පාඨමාලා සහ වෙනත් අධ්‍යාපනික කටයුතු පැවැත්වීම සඳහා වූ ගාස්තු වැනි හුවමාරු ගනුදෙනුවලින් ආදායම එවැනි කටයුතු අවසන් කළ විට ආදායම ලෙස හඳුනා ගනී.

ස්වයං-මූල්‍ය වැඩසටහන් වැනි හුවමාරු ගනුදෙනුවලින් ආදායම වර්ෂය අවසානයේ දී එවැනි පාඨමාලා නිමා කළ අදියර මත පදනම්ව ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී. අනාගත කාලපරිච්ඡේදවලට සම්බන්ධ දේශන ගාස්තු සහ ගෙවීම් ප්‍රවර්තන වගකීම් යටතේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දක්වා ඇත. තව ද පොළී ආදායම සහ කුළී ආදායම උපචිත පදනම මත හඳුනා ගනී.

(ආ) හුවමාරු නොවන ගණුදෙනුවලින් ආදායම

ශ්‍රී ලංකා ආණ්ඩුවේ මහා භාණ්ඩාගාරයෙන් ලැබූ ප්‍රදාන වැනි හුවමාරු නොවන ගණුදෙනුවලින් ලැබූ ආදායම ආදායම ලෙස හඳුනා ගනී. පාර්ලිමේන්තුව මඟින් මූල්‍ය වර්ෂය සඳහා විසර්ජන පනත සම්මත කරනු ලබන අවස්ථාවේ දී අරමුදල් හිමිකාරත්වය ස්ථාපිත කරනු ලැබේ. හඳුනාගත් ආදායම ප්‍රමාණයට වාර්තා කරන දිනයට පෙර නිල වශයෙන් අනුමත කළ වර්ෂය සඳහා වූ විසර්ජන (පරිපූරක ඇස්තමේන්තු) පනතේ අනුමත කළ මුදල් යෙදවීම් සඳහා සිදු කළ යම් සංශෝධන සහ වෙනත් අරමුදල් ගැලපීම් සැලකිල්ලට ගනු ලැබේ.

ඒවාට අමතරව උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම සහ සංවර්ධනය වේගවත් කිරීම (AHEAD), අතිරේක ශිෂ්‍ය බඳවා ගැනීම පහසු කිරීම සඳහා අවශ්‍ය අතිරේක යටිතලපහසුකම් සඳහා වූ ලෝක බැංකු ව්‍යාපෘතිය වැනි වෙනත් අරමුදල් නියෝජිතායතනවලින් ලැබෙන ප්‍රදාන ආදිය හුවමාරු නොවන ගණුදෙනු ලෙස හඳුනා ගෙන ඇති අතර ආදායම ලෙස හඳුනා ගනී.

